*2016 අප්‍රේල් මස 05 අඟහරුවාදා දින*
*2016 ஏப்ரல் 05 ஆம் திகதி செவ்வாய்க் கிழமை*
*Thursday 05th April 2016*

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ தவிசாளர் - கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

සියළු දෙනාටම සුභ උදැසනක් වේවා! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ගරු අමාත්‍යතුමන්ලා, නියෝජ්‍ය සභාපතිතුමා සභානායකතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. අද දිනට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා පළමුව තිබෙන්නේ ,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම්:**

මේ යටතේ කිසිවක් නැහැ.

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ:**

මේ යටතේ කිසිවක් නැහැ.

**ගරු සභාපතිතුමාගේ නිවේදන:**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :**

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

ගරු සභාපතිතුමනි ඩබ්.සෝමදාස ගරු මන්ත්‍රීතුමා ,ඒවගේම සමිත ආටිගල ගරු මන්ත්‍රීතුමා, උපුල් ශ්‍යාමල් බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා යන තිදෙනාට නිවාඩු ලබාදීම සුදුසු යැයි යෝජනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

ආණ්ඩු පක්ෂය

***ගරු මන්ත්‍රී නිමල් විජේනායක***
***கௌரவ உறுப்பினர் நிமல் விஜேநாயக***
*Hon.Member Nimal Wijenayaka*
----------------------------------------

ස්ථිර කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------

ඒ අදාල නම් කියවන ලද ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු ගරු සභාව විසින් අනුමත කරන බව සභාවට දැනුම් දෙනවා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම:**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**කාරක සභා වාර්තා පිළිගැන්වීම:**

කිසිවක් ලැබී නැහැ.

**පෙත්සම්:**

කිසිවක් ලැබී නැහැ.

**ප්‍රශ්න:**

මේ යටතේ අජිත් කුමාර මැද්දෙගම මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2015/25 ප්‍රශ්නය සඳහා පිළිතුරු ලැබී නැහැ.

ඊළඟ ප්‍රශ්නයත් ඔබතුමාගෙමයි. 6/1/2015/27 ගරු අජිත් මන්ත්‍රීතුමා ඒකටත් අපිට පිළිතුරු ලැබී නැහැ. ඒකත් ඊළඟ සභාවට යොමු කරනවා.

තුන්වෙනි ප්‍රශ්නයත් ඔබතුමාගෙමයි. 6/1/2015/28 දරණ ප්‍රශ්නය ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලලා තියෙන්නේ. මේ තුනටම පිළිතුරු ලැබී නැහැ. දැනුම් දෙනවා ඊළඟ සභාවට දෙනවා කියලා. බොහොම ස්තූතියි.

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ:**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**පෞද්ගලික ප්‍රකාශ කිරීම්:**

මේ යටතේ රම්‍යකුමාර වීරසිංහ මැතිතුමා.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ***
***கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்***
*Hon.Member Ramya Kumara Weerasinghe*
--------------------------------------------------

ගරු සභාපතිතුමනි මේක මට අතිශයින්ම පෞද්ගලිකව බලපාන කාරණාවක් විතරක් නෙමෙයි මම විශ්වාස කරනවා අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට පෞද්ගලිකව බලපාන කාරණාවක්. මම විශ්වාස කරනවා මම අද ඉෆ්ලාර් මන්ත්‍රීතුමා එක්කත් කතා කළා. මම විශ්වාස කරනවා විපක්ෂයේ හැටියට මේ කාරණාවේදී අපිට

සහයෝගය දෙයි කියලා. මුදල් කොමිෂන් සභාවේ චක්‍ර ලේඛ අංක 2016/1 අනුව පළාත් සභාවට එවලා තියෙන මුදල් කොමිෂන් සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභා මන්ත්‍රීවරයෙක් විදිහට බරපතල ප්‍රශ්නයකට අපි සියළු දෙනාම මුහුණ පාලා තියෙනවා. පොදු සමිති වලට උපකරණ ලබාදීම තමයි පළාත් සභා මන්ත්‍රීවරයා හැටියට අපෙන් ගොඩක් වෙලාවට ජනතාව බලාපොරොත්තු වෙන්නේ. හැබැයි පොදු සමිති වලට උපකරණ ලබාදීමේදී උපරිම මුදල රු.30000/- කට සීමා කරලා තියෙනවා. ඒ රු.30000/- කට ලබා දිය හැකි ද්‍රව්‍ය හැටියට පැහැදිලිවම සඳහන් කරලා තියෙනවා ඇකිලිය හැකි ආවරණ මඩු සහ පුටු පමණයි. හැබැයි ඒකේ පුටුවලට රු.30000/- කට පුටු දෙන්න පුළුවන්. ආවරණ මඩු රු.30000/- කට දෙන්නත් බෑ. එතකොට අපිට පොදු සමිතියකට මින් ඉදිරියට මුදල් කොමිෂන් සභා චක්‍ර ලේඛණය අනුව දෙන්න වෙන්නේ පුටු පමණයි. ඒ නිසා ඒක අපිට බරපතල ප්‍රශ්නයක්. ගොඩක් දේවල් අපෙන් ඉල්ලනවා. ඒක එකක්. ඒ නිසා ඒ කිසි දෙයක් අපිට දෙන්න ලැබෙන්නේ නෑ. මෙහෙම ගියොත් පුටු විතරයි. ඒකේ දාලා තියෙනවා වසර පහක් ඇතුළත එක සමිතියකට බඩු ලබාදිය හැක්කේ එක වරක් පමණයි. එතකොට අවුරුදු පහක් තිස්සේ බඩු ගත්ත සමිතියක් එකක්වත් මේ සබරගමුවේ නැතුව ඇති. කාගේ හරි මන්ත්‍රීවරයෙක්ගේ. එතකොට කිසිම සමිතියකට අපිට බඩුවක් දෙන්න වෙන්නේ නෑ. එතකොට මේ වගේ මම කීපයක් පමණයි කිව්වේ. මෙවැනි කාරණා රාශියක් මේක ඇතුළේ තියෙනවා. අපේ පළාත් සභාවේ තියෙන පොදු සමිතිවල ඉන්න ජනතාවට ඉතාම ප්‍රශ්න තියෙන අය. ඒගොල්ලන්ට කේටරින් ස්විස් වලට ගිහිල්ලා බඩු ගන්න බෑ. ඒගොල්ලන්ට උත්සව භාණ්ඩ සපයන තැන් වලට ගිහිල්ලා බඩු ගන්න බෑ. සමිති හදාගෙන දුප්පත් මිනිස්සු ඉන්න කොට අපිට ඔවුන්ට කරන්න පුළුවන් එකම සේවයත් මේ මුදල් කොමිෂන් සභා චක්‍ර ලේඛයෙන් අපිට කරන්න බැරි වෙලා.

ඊළඟට ස්වයං රැකියා උපකරණ ලබාදීමේදී 50% කට ඒක අඩු කරලා තියෙවා. ඒක වැරැද්දක් මං දකින්නේ නෑ. හැබැයි ඒ 50% රු.15000/-කට රු.20000/- කට වැඩි ඒවා සඳහා දීලා අන්තිම දුප්පත් අයට දෙන කොට රු.15000/- 100% දෙන්න පුළුවන් තැනකට ගේන්න ඕනේ කියලා මම ප්‍රකාශ කරනවා. අනිත් එක තමයි රියදුරු බලපත්‍ර ලබාදීමේදී 80% කරලා තියෙනවා. ඒකෙත් 80% කරලාට වැරැද්දක් නෑ. හැබැයි දැන් අපේ පළාත් සභාවේදී ඒක ඇවිල්ලා තියෙනවා අලුත්ම විදිහකට අපිට රියදුරු බලපත්‍රය දෙන්න පුළුවන් වෙන්නේ බර වාහන පමණයි. හැබැයි බර වාහන පමණක් දෙන්න නම් සැහැල්ලු වාහන බලපත්‍රය අවුරුදු දෙකක් පරණ වෙන්න ඕනේ. හැබැයි සැහැල්ලු වාහනන බලපත්‍රය අවුරුදු දෙකක්, තුනක් පරණ කෙනෙකුට නම් දෙන්න පුළුවන් අපිට ආරම්භයක් හැටියටපළවෙනි පියවර හැටියට ගන්න බැරි වෙනවා සැහැල්ලු වාහන බලපත්‍රය දෙන්න බෑ. ඒ නිසා මේවගේ කාරණා කීපයක් පමණයි මම කිව්වේ. මෙවැනි කාරණා රාශියක් මේක ඇතුළේ තියෙනවා. දැන් මේ අනුව ගත්තහම උදාහරණයක් හැටියට අපේ නිලන්ත ගරු මන්ත්‍රීතුමා ගත්තහම අපිට ගිය අවුරුද්දේ වැඩිය වැඩක් කරන්න ලැබුණේ නෑ. මේ අවුරුද්දේ සල්ලි දෙන්න බලන කොට සල්ලි දෙන්න නෑ. අපි සියළු දෙනාටම මැතිවරණයක් එනවා. අපි සියළු දෙනාගේම බලාපොරොත්තුව මේ ඉන්න මූ එක්සත් ජාතික පක්ෂයේ වේවා ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ වේවා මේ ඉන්න සියළු දෙනා මේ පළාත් සභාවේදී දකින්න අපි ආසයි. එහෙම වෙන්න නම් ඊළඟට ජනතාවගේ අවශ්‍යතාවය සැබෑවට ඉෂ්ඨ කරන්න නම් මේ මුදල් කොමිෂමේ නිර්දේශ පැහැදිලිවම වෙනස්කළ යුතු වෙනවා. ඊළඟට ඉදිකිරීම් කොන්ත්‍රාත් පිරිනැමීම සම්බන්ධයෙන් පසුගිය දවසක මට මතකයි කරුණාපාල මන්ත්‍රීතුමා කතා කළා මේ චක්‍ර ලේඛණයට අනුව කොන්ත්‍රාත් පිරිනැමීම සම්බන්ධයෙන් එහෙම ගැටළුවක් නෑ මේකේ තියෙනවා

ඉදිකිරීම් කොන්ත්‍රාත් පිරිනැමීම යටතේ වරින් වර නිකුත් කරනු ලබන ජාතික ප්‍රසම්පාදන මාර්ග උපදේශනයෙන් කරනු ලබන සීමාවලින් නොඉක්මවන පරිදි ඉදිකිරීම් කොන්ත්‍රාත් පිරිනැමීම සිදු කළ යුතුය. විශාල පරිමාණයේ ඉදිකිරීම් විවෘත ටෙන්ඩර් පරිපාටියට අනුව සිදු කළ යුතු අතර නියමිත මූල්‍ය සේවාවට අනුව පළාත් සභාවේ දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුන් අතරින් මිළ ගණන් කැඳවා සුදුස්සන් තෝරා කුසපත් තෝරා ගැනීමෙන් ඉදිකිරීම් කළ යුතුය. හැබැයි ඒකෙම තියෙනවා අවසානයේ එසේම සෘජු කොන්ත්‍රාත් යටතේ ලියාපදිංචි සමිති වලට කොන්ත්‍රාත් පිරිනැමීමේදී ප්‍රසම්පාදන මාර්ග උපදේශන සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට අනුව කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වෙයි කියලා. මේ අනුව ලක්ෂ විස්සට අඩු කොන්ත්‍රාත් පොදු සමිති වලට දීමේ හැකියාව තියෙනවා. හැබැයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එහෙම දෙන්නේ නෑ. ඒ නිසා අපේ ප්‍රධාන ලේකම්වරයා මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කිරීමේ අවශ්‍යතාවයක් තියෙනවා. පළාත් සභාවේ උපමාන පාදක අරමුදල් යටතේ එන කටයුතු සඳහා සෘජු කොන්ත්‍රාත් කිරීමට කටයුතු කරන්න කියන ඉල්ලීම ප්‍රාදේශීය ලේකම්වරුන්ට අපේ ප්‍රධාන ලේකම් හරහා යොමු කිරීමේ අවශ්‍යතාවයක් තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි මම ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලනවා මම මේ කතා කළේ මුදල් කොමිෂමේ නිර්දේශ කීපයක් ගැන පමණයි. ඒ නිසා මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ගේ පස් දෙනෙක්ගේ කමිටුවක් පත් කරලා දිනකින් හෝ දෙකක් ඇතුළත මේ මුදල් කොමිෂමට මේ කරලා තියෙන නිර්දේශ වලින් වෙනස් විය යුතු දේවල් පිළිබඳව තීන්දුවක් අරගෙන ඒ තීන්දුව අනුව මුදල් කොමිෂමට පළාත් සභාව විදිහට අපේ යෝජනාව මේක වෙනස් කරන්න කියන ඉල්ලීම සකස් කිරීම සඳහා කමිටුවක් පත් කරලා කටයුතු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම මේ අවස්ථාවේදී කරනවා. බොහොම ස්තුතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ගරු රම්‍යකුමාර මන්ත්‍රීතුමනි. මීළඟට ගරු සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

---

ගරු සභාපතිතුමනි අපේ රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා කියාපු ආකාරයට දැන් සුභසාධන සමිතිය ,මරණාධාර සමිතිය මේ දෙකම ගත්තහම මේ දෙකෙන් වෙන සේවය රජයට පෞද්ගලික අපිට මන්ත්‍රීවරුන්ට විශාල සහනයක්. මොකද මේකෙන් කෙරෙන දේ. දැන් පෙර මිනියක් මැරුණහම පෙට්ටිය ගන්න ගියහම ගරු සභාපතිතුමනි විවිධාකාරයේ යම් යම් උදව්යට විශාල කරදරයක් හිරිහැරයක් වෙලා තියෙනවා. දැන් සුභ සාධන සමිතියක් කිව්වහම ගරු සභාපතිතුමනි මේ හරහා වෙන සේවය අතිවිශාලයි. ඒ අතිවිශාල සේවයක් වෙන සුභ සාධන සමිතියෙන් අපේ රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා කියාපු ආකාරයට පුටු විතරක් දෙන කොට ගරු සභාපතිතුමනි අනිත් භාණ්ඩ හට් එකක් අරවා මේවා ස්පීකර් සෙට් එකක් විවිධ දෙවල් ඉල්ලනවා. අපේ හිසේ තියෙන බරක් තමයි බිම තියන්නේ. එකක් පළාත් සභාවට අනික මන්ත්‍රීවරයාට පෞද්ගලික ව්‍යාපාරිකයාට. සුභ සාධක

සමිතිය ඉල්ලන ඒ අයගේ වරප්‍රසාද ලබාදීම ඉතාම වැදගත් වෙනවා ගරු සභාපතිතුමනි.

විශේෂයෙන්ම කාරණයක් කියන්නට ඕනේ ගරු සභාපතිතුමනි සුභ සාධන සමිති වලට දෙන පුටු ගත්තහම පෙළක් පෙළක් ගරු මන්ත්‍රීවරුන්ගේ මුදල් වලට ගරු සභාපතිතුමනි දෙන පුටු ගත්තහම පුටුව දුන්නහම රු.350/- හෝ රු.650/- ට ,රු.750/- ගත්තහම පුටුවේ වාඩි වුණහම කකුල් හතර හතර පැත්තට යනවා. ඉදගන්න බෑ හය මාසයක්වත්. ඒ නිසා මම යෝජනා කරනවා මම දෙන පුටු වලට එක පුටුවක් රු.1150/- ට වැඩියි. ශක්තිමත් පුටුවක් දෙන්න කියලා. ඒකත් මේ අවස්ථාවේ ඔබතුමාට යෝජනාවක් වශයෙන් ගේන අතර, ඒ පුටු දෙන කොට ගරු සභාපතිතුමනි විශේෂයෙන්ම අවධානය යොමු කරන්නට ඕනේ රජයේ සල්ලි. පළාත් සභාවෙන් දෙන සල්ලි. හය මාසයක් යන්න කලින් පුටුවේ කකුල් හතර පැත්තට යන කොට ඒවා කැඩිලා විනාශ වෙලා යන කොට ආයේ ඊළඟ අවුරුද්දේත් අපෙන් ඉල්ලනවා. ඒ නිසා ඒකත් දෙන අතර අපේ රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරමින් මේ කාරණය හරියාකාරව බලලා සුභ සාධන සමිති වලට දෙන ආධාර උපකාර නිසියාකාරයට ලබා දෙන්නටත් පුළුල් වශයෙන් මේ ගැන අවධානය යොමු කරන්නටත් ඔබතුමාගේ බලාපොරොත්තු වෙනවා ගරු සභාපතිතුමනි.

ඒ එක්කම තමුන්නාන්සේගෙන් මම කාලය ඉල්ලුවේ ප්‍රධාන ඇමතිතුමාට යොමු කරන ප්‍රශ්නයක් ගරු ඇමතිතුමනි විවිධ සේවා සමූපකාර සමිති ගත්තහම අපි මේ පාඩු ලබන ඒවා කියන්නේ නෑ. ලාභ ලබන ඒවා ගත්තහම විශේෂයෙන් ඇහැලියගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය ගත්තහම විශාල වශයෙන් ලාභ ලබන ආයතනයක්. මේකේ අවුරුදු දීමනා සේවකයින්ට රු.5000/- ක් කරලා තියෙනවා. ඒ රු.5000/- කොහොම හරි කොමසාරිස්තුමා හරහා හෝ සමූපාකාර ගරු අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා හරහා රු.5000/- රු.4000/- කරලා තියෙනවා. ඒ පන්දාහ හාරදාහ කිරීම යෝජිත නෑ ගරු සභාපතිතුමනි. ඒ ලාභ ලබන සමූපාකාරවල ඒ ඉල්ලන මුදල රු.5000/- රු.1000/- ක් අඩු කරලා රු.4000/- ක් තමයි කරලා තියෙන්නේ. ඒ රු.5000/- ලබාදීමට කටයුතු කරන්න කියලා මම මේ ලිපිය සභාගත කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තූතියි මන්ත්‍රීතුමනි.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*

---

ගරු සභාපතිතුමනි රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාවට අදාලවම මටත් තියෙනවා පෞද්ගලිකවම යෝජනාවක් තමයි මටත් මේක. මේන මේ ගැටළුව ඇවිල්ලා පළාත් සභා ක්‍රමය නිර්මාණය වෙන්නේ වෙන හේතුවක් නිසා නෙමෙයි ඒ පළාත තුළ අවශ්‍යතාවයන් සපුරා ගැනීම සහ පළාතේ සංවර්ධනය ඒ පළාත තුළ නිර්මාණය කරගෙන කටයුතු කිරීම තමයි පළාත් සභාවේ පරමාර්ථය ආරම්භ වෙලා තියෙන්නේ. අද බැලුවහම රේඛීය අමාත්‍යාංශයෙන් එනවා පළාත් භාණ්ඩාගාරයෙන් වෙන්න පුළුවන්. මුදල් කොමිෂමෙන් වෙන්න පුළුවන්. චක්‍ර ලේඛණයක් මගින් මෙය කිරීම තුළින්

අපිට විශාල බරපතල හානි කීපයක් දකින්න සිදු වෙලා තියෙනවා. එකක් තමයි ගරු සභාපතිතුමනි මට තියෙන ගැටළුව තමයි ගම්වල තියෙන තව ගැටළුවක් තමයි ප්‍රජා ශාලාවල් ඉදි කිරීම. ප්‍රජා ශාලාවල් ඉදිකිරීම මොනම ක්‍රමයකින්වත් අපිට සල්ලි දෙන්න පුළුවන්කමක් නෑ. ඒ එක්කම පාසැල් පද්ධතිය ගත්තහම අපෙන් ඉල්ලීමක් කරනවා අඩුම ගානේ පුටුවක් හරි අරන් දෙන්න කියලා. හදිස්සියේ පාසැල් පද්ධතියට. බහුකාර්යය ශාලා යටතේ සල්ලි දෙන්න බෑ. පාසැලකට හදිස්සියේ වෙලාවකට ගරු සභාපතිතුමනි අපි පාසැල් ගිය පාසැලට උපකාරයක් වශයෙන් යමක් දෙන්න හිතුවත් පාසැලට මොනම හේතුවක් නිසාවත් පුටුවක්වත් අරන් දෙන්න පුළුවන්කමක් නෑ අපේ විමධ්‍යගත මුදලින්. අපි ඉගෙන ගත්ත පාසැලේ අපේ දරුවන්ට අනාගතයේදී කියලා යමක් කරන්න හිතුවොත් ඒක කරන්න බෑ. ඒවගේම එතුමා යෝජනාවක් කළා කමිටුවක් පත් කරලා ඒ කමිටුව හරහා මේ සභාවේ යම් කමිටුවක් පත් කරලා යම් තීරණයක් සාධාරණ තීරණයක් අරගෙන මම ඇත්තටම දන්නවා ගරු සභාපතිතුමනි පුටු හරි ටකරන් මඩුවක් කිව්වහම ටකරන් වලට රු.45000/- ක් දුන්නා. අද රු.30000/- කරන්න බෑ. අනිත් එක තමයි ඒක නිර්ණායක දෙකකට පමණක් සීමා කරලා තියෙනවා. දැන් අද ඉල්ලන්නේ හුඟක් වෙලාවට අද තියෙන කාලයෙන් ගත්තහම තියෙන ප්‍රශ්නය තමයි විදුලිජනක යන්ත්‍රයක් අද ගමේ සමිතියකට ගත්තහම විදුලිජනක යන්ත්‍රයක් දෙන්න විදිහක් නෑ. පහුගිය කාලයේ වෙච්ච අඩුපාඩුකම් නිසා එවැනි දේවල් දුර්වලකම් වෙලා තියෙනවා. ඒවාට අවශ්‍ය කරන මුහුණ දෙන්න ක්‍රමයක් නෑ. එවකට මරණාධාර සමිතියකින් අවශ්‍යතාවයක් තිබුණේ නෑ බුෆේ සෙට් එකක්. අද සෑම මරණාධාර සිමිතයකටම අවශ්‍යතාවයක් තියෙනවා. මොකද සෑම මරණාධාර සමිතියකින් අවසාන දිනයේ කෑම වේලක් දෙන පුරුද්දක් පුරුදු වෙලා තියෙනවා. ඒක දෙන කොට ඒ අයට අවශ්‍යතාවයක් තියෙනවා මේක. ඒවගේ විවිධ දේවල් ඇතුළ් වෙලා තියෙනවා. මම හුඟක් වෙලා කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නෑ ගරු සභාපතිතුමනි. එම යෝජනාව අනුමත කරමින් කමිටුවක් පත් කරලා මේ පළාත් සභාව තුළින් අවශ්‍ය වෙන විදිහට ඒ ප්‍රතිපාදන වෙන් කිරීමට අවශ්‍ය කරන නිර්නායකයන් සහ ඒවගේම ස්වයං රැකියා අයටත් අඩු ආදායම්ලාභී භාගයක් 50% ක් ගෙවන්න බැරි අයට නොමිලයේ ලබාදීමේ කටයුත්තක් කළ යුතුයි. වෙන හේතුවක් නිසා නෙමෙයි . ගරු සභාපතිතුමනි මේක අද ඊයේ නෙමෙයි මේක ගැටුමක් ඇති කරන්න නෙමෙයි මේක හොඳ යෝජනාවක්. ආණ්ඩු පක්ෂයේ ගෙනාපු හොඳ යෝජනාවට අපි කියන්නේ අද ඊයේ තිබ්බිච්ච එකක් නෙමෙයි. මේක අවුරුදු ගාණක් මේ පළාත් සභාවට මේ විදිහට ආවා. මේ පහුගිය කාලයේ ගණන් ගන්නේ නැතුව මේ වැඩ කටයුතු කළා. අපේ වාසනාවකට අපේ රංජිත් බණ්ඩාර ගරු ඇමතිතුමා ඉන්න නිසා ගරු ඇමතිවරු කිසි කෙනෙක් නෑ. ඔබතුමාට තමයි මේ බර තියෙන්නේ. කැබිනට් මණ්ඩලය මේක සාකච්ඡා කරලා කමිටුවක් පත් කරලා නිසියාකාරයෙන් කටයුතු කරලා සබරගමු පළාතේ වෙසෙන ජනතාවට සහනයක් වෙන්න යමක් කරන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. මේ ගිය ආණ්ඩු කාලයේ ආව චක්‍ර ලේඛණ තාමත් ක්‍රියාත්මක වීගෙන යනවා. නමුත් එවකට මේවා ක්‍රියාත්මක වුණේ නෑ. ගරු ප්‍රධාන ඇමතිතුමා මුදල් ඇමතිවරයා වශයෙන් කටයුතු කරලා මේ කටයුත්ත සාර්ථකව එතුමා මේකට මුහුණ දුන්නා. දැනුත් මුහුණ දෙන්න පුළුවන්. පළාත් සභා ක්‍රමය හැදිලා තියෙන්නේ ඒ සඳහා. ඒ සඳහා ඉල්ලීමක් කරමින් ඔබතුමාගේ යෝජනාව ස්ථිර කරමින් ඒ කටයුත්ත සාර්ථක කරලා දෙන්න කියලා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*

*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

බොහොම ස්තූතියි ගරු ඉෆ්ලාර් මන්ත්‍රීතුමා. ගරු රංජිත් බණ්ඩාර මැතිතුමා.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි මෙම රම්‍යකුමාර මන්ත්‍රීතුමා ගෙනාපු පෞද්ගලික යෝජනාවේ තිබෙන්නා වූ කරුණු වර්තමානයේ සත්‍යක් තිබෙනවා. මෙම චක්‍ර ලේඛණය ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා කිව්වා වගේ වරින් වර සෑම වර්ෂයකම මේවා ආවා. සෑම පළාත් සභාවකටම මේ චක්‍ර ලේඛණ ආවා. නමුත් අපි අමාත්‍ය මණ්ඩලයේත් උපදේශක කාරක සභාවේත් මේ සම්බන්ධව සාකච්ඡා කරලා දැනට රටේ පවතින මිළ ගණන් අනුව සංශෝධනය කළා. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා අර කමිටුවක් අවශ්‍ය නම් පත් කරන්න. එහෙම නැත්නම් උපදේශක කාරක සභාවට මෙම යෝජනාව යොමු කරන්න අපි කැබිනට් මණ්ඩලයේදී ඒ සඳහා අනුමැතිය ලබා දෙන්න කටයුතු කරන්නම්.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

ස්තූතියි ගරු රංජිත් බණ්ඩාර ඇමතිතුමනි. දැන් මේ කාරණාව පිළිබඳව ගරු රම්‍යකුමාර වීරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව පක්ෂ විපක්ෂ සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාට බලපාන පොදු කාරණාවක් බවට පත් වෙලා තියෙන කරුණක්. මේ පිළිබඳව මං හිතනවා ඉතාමත් කඩිනමින් මේ පිළිබඳව තීන්දු තීරණ අරගෙන මේ කටයුතු ක්‍රියාත්මක කිරීම වඩා සුදුසු කියන එකයි දැනෙන්නේ.

ඒ අනුව මා විශ්වාස කරනවා මේ සඳහා රම්‍යකුමාර මන්ත්‍රීතුමා කරන ලද ඉල්ලීම අනුව කමිටුවක් කඩිනමින් පත් කරලා අනිකුත් කැබිනට් මණ්ඩලයේ සහ අනිකුත් අයගේ සහයෝගය ලබාගෙන කමිටුවක ආකාරයෙන් මේ කටයුත්ත ඉක්මනින් තීරණයක් ගත්තා නම් වඩාත් සුදුසුයි කියන එක තමයි මගේ යෝජනාව.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි හෙට කැබිනට් මණ්ඩලය රැස් වෙනවා. ඔබතුමාට අදම මේ කමිටුවත් එක්ක සාකච්ඡා කරලා හෙට කැබිනට් මණ්ඩලයට එව්වොත් අපිට හෙටම අනුමැතිය ලබා දීමේ හැකියාවක්. මොකද මේ සම්බන්ධව දැන් විමධ්‍යගත මුදල් මන්ත්‍රීවරුන්ට දීලා ඊට පස්සේ යෝජනා ලබා ගනිමින් පවතින නිසා අපිට අදම කමිටුවේ වාර්තාව ලැබුණොත් හෙට උදේ වෙන කොට අපිට සාකච්ඡා කරලා අනුමැතිය දිය හැකියි.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි දැන් උපදේශක කාරක සභාව තියෙනවානේ. උපදේශක කාරක සභාවට යොමු කළා නම් හරි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------

උපදේශක කාරක සභාවේ සියළුම නිළධාරීන් ඉන්න නිසා. කමිටුවක් පත් කළා නම් අපිට ඇත්තටම යම් නිළධාරීන් පිරිසක් තමයි සහභාගි වෙන්නේ. සභාව යෝජනා කරනවා නම් උපදේශක කාරක සභාවේදී මේකට කඩිනම් පියවරක් අරන් දෙන්න කියලා අපි ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ යෝජනාව ප්‍රධාන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට යොමු කරනවා. ඒකට පක්ෂ විපක්ෂ හෙට තීන්දුවක් ගන්න වෙන්නේ නෑ. කැඳවලා තීන්දුවක් ගන්න කියලා අපි යෝජනා කරනවා. ඒ නිසා හැකි පමණින් ප්‍රධාන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවට මේක යොමු කරලා මේ සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඊළඟට ගරු අජිත් ශාමින්ද මන්ත්‍රීතුමා

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ***
***கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க***
*Hon.Member Ramya Kumara Weerasinghe*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි අද උපදේශක කාරක සභාව තියෙනවා නේද? ඉක්මනින් මේක තීන්දුවක් ගත්තේ නැත්නම් පරක්කු වෙලා තීන්දු අරගෙන වැඩක් නෑ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------

ගරු මන්ත්‍රීතුමා ප්‍රධාන ඇමතිතුමා දැන් සභාවේ නැහැ. ප්‍රධාන ඇමතිතුමා මේ තීන්දු තීරණ ගන්න රැස්වීමට සහභාගි විය යුතුයි. ඒ නිසා මේ වෙන කොට රංජිත් බණ්ඩාර මැතිතුමා යෝජනා කරන්නේ සහ විපක්ෂයේ සංවිධාකතුමා යෝජනා කරන්නේ උපදේශක කාරක සභාව හරහා මේ සියළුම නිළධාරීන් ඉන්න නිසා තීන්දුවක් දෙන්න කියලා. ඒ අනුව උපදේශක කාරක සභාවටත් ඒ තීන්දුව ලබා ගැනීමට අපි යෝජනා කරනවා. අජිත් ශාමින්ද මන්ත්‍රීතුමා කතා කරන්න.

***ගරු මන්ත්‍රී අජිත්*** *ශාමින්ද*
***கௌரவ உறுப்பினர் அஜித் ஷாமிந்த***
*Hon.Member Ajith Shyaminda*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි පෞද්ගලික හේතු දැක්වීම යටතේ මේ එන අවුරුදු සමයත් එක්ක අපිට මේ පළාත් පාලන ආයතන හරහා තියෙන නඩතතු කරන සියළුම වීදි

ලාම්පු ගොඩක් ඒවා අක්‍රිය වෙලා තියෙනවා. ඒ ආයතන වලට දැනුම් දුන්නහම පළාත් සභාවෙන් ආයතන විසුරුවා හැරලා තියෙන හින්දා මෙහෙන් අනුමැතියක් අවශ්‍යයි කියලා ඇතැම් වැඩ බලන ලේකම් සහ ලේකම්වරු කියනවා. මම ගරු සභාවට යෝජනාවක් කරනවා අපි පක්ෂ විපක්ෂ සියළු මන්ත්‍රීතුමන්ලාට මුහුණ දෙන ප්‍රශ්නයක් අපේ මාර්ගවල ගෙවල් ඉස්සරහ වුණත් මාර්ගවල ලයිට් ටික පිච්චිලා තියෙන්නේ. මේවා ප්‍රාදේශීය සභා තියෙන කොට නිසියාකාරයට නඩත්තු වුණා. දැන් මේ වෙන කොට අක්‍රියයි. තව දින කීපයකින් මේ උත්සව සමය. ඊළඟට වෙසක් උත්සවය එනවා. පොසොන් උත්සවය එනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි මම යෝජනාවක් කරනවා පළාත් පාලන ප්‍රධාන ඇමතිතුමා හරහා අපේ පළාතේ සියළු වීදි ලාම්බු ටික හැකි ඉක්මනින් අලුත්වැඩියා කරලා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ගරු අජිත් ශාමින්ද මන්ත්‍රීතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අදාල බලධාරීන් වෙත යොමු කරමින් කඩිනමින් පියවරගැනීම සඳහා අපි යෝජනා කිරීමට කටයුතු කරනවා.

**ශෝක ප්‍රකාශ යෝජනා:**

මේ යටතේ කිසිවක් නැහැ.

**පොදු කටයුතු ආරම්භයේදී දැනුම්දීමක් අවශ්‍ය නොවන යෝජනා:**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**පොදු කටයුතු ආරම්භයේදී දැනුම්දීමක් අවශ්‍ය යෝජනා:**

අතුරු ව්‍යවස්ථා කීපයක් සභාගත කිරීමට තියෙනවා. ගරු රංජිත් බණ්ඩාර ඇමතිතුමා

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි මහ නගර සභා බලප්‍රදේශය තුළ ඝණ අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවත්, නගර සභා බලප්‍රදේශය තුළ ඝණ අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවත්,සහ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ඝණ අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවත් යන ව්‍යවස්ථා සභාගත කරලා අපි ඔබතුමාගෙන් අනුමැතිය ඉල්ලා සිටිනවා මෙම අතුරු ව්‍යවස්ථා කාරක සභා වෙත යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------------

ස්තූතියි ගරු රංජිත් බණ්ඩාර අමාත්‍යතුමනි. ඒ අනුව සභාගත කරන ලද අතුරු ව්‍යවස්ථා තුනම අතුරු ව්‍යවස්ථා ප්‍රඥප්ති සහ රීති කාරක සභාව වෙත යොමු කිරීමට කටයුතු කරනවා.

**පළාත් සභාවේ පොදු කටයුතු:**

මේ යටතේ කිසිවක් වාර්තා වී නැහැ.

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු:**

මේ යටතේ ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න මැතිතුමා විසින් 6/1/2016/03 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙනවා.

***ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න***
***கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன***
*Hon.Member Salitha Karunaratne*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, පළමු කොට මගේ යෝජනාවේ 6/1/2016/03 දරණ යෝජනාවේ එකක් මුද්‍රණ දෝෂයක් තියෙනවා. අවසාන වාක්‍ය අවසාන පේළියේ , නිසි නියාමනයක් යටතේ සාමාන්‍ය ජනතාවට බලපත්‍ර ලබාදීමටත් අදාල නිළධාරීන්ගෙන් ඉල්ලා සිටීමට මෙම ගරු සභාවට යෝජනා කරමි නෙමෙයි. අදාල බලධාරීන්ට ඉල්ලා සිටීමට මෙම ගරු සභාවට යෝජනා කරමි යනුවෙන් නිවැරදි විය යුතුයි.

මගේ සංශෝධනයක් තියෙනවා ඒක මම ලිඛිතව සභාවට ඉදිරිපත් කළා. දෙවෙනි ජේදයේ මෙම කර්මාන්තයට අදාල මම කර්මාන්තයට අදාල පතල් කැනීම හා මැණික් ගැරීම පාරිසරික හානිවලට ද සමහර අවස්ථාවලදී හේතුවී තිබේ. එම කරුණ පදනම් කර ගනිමින් මැණික් කර්මාන්තයට අදාල බලපත්‍ර ලබාදීමේදී, ගාස්තු මුදල වැඩි කිරීම යන්න සංශෝධනය කර ඉවත් කර ගන්නවා.

රත්නපුර ජනතාවගේ ජන ජීවිතයට බලපාන ප්‍රධාන කර්මාන්තය වන්නේ මැණික් කර්මාන්තයයි. දිස්ත්‍රික් ආර්ථිකයේ වැඩි පංගුකාරිත්වය හිමි කර ගන්නේද මැණික් කර්මාන්තයයි.

මෙම කර්මාන්තයට අදාල පතල් කැනීම් හා මැණික් ගැරීම පාරිසරික හානිවලට ද සමහර අවස්ථාවලදී හේතුවී තිබේ. එම කරුණ පදනම් කර ගනිමින් මැණික් කර්මාන්තයට අදාල බලපත්‍ර ලබාදීමේදී ගංගා ආශ්‍රිතව බලපත්‍ර නොදීම ආදී සීමාවන් රැසක් හඳුන්වා දී තිබේ.

එහෙත් අනවසර මැණික් ගැරීම තවමත් සිදුවේ. ඉහත සීමාවන් අනවසර මැණික් ගැරීමට පෙළඹවීමක් ද වේ. එයින් පාරිසරික හානි ද නොඅඩුව සිදුවේ.

එබැවින් රත්නපුර දිස්ත්‍රික් ජනතාවගේ ජන ජීවිතයට බෙහෙවින් බලපාන මැණික් කර්මාන්තය සිදු කර ගෙන යාමටත්, පාරිසරික හානි වැළැක්වීමටත්, බලපත්‍ර ලබාදීමේ සීමාවන් නැවත සමාලෝචනය කොට, බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය සරල කිරීමටත්, ගංගාවල මැණික් ගැරීම වැනි අවස්ථා සඳහා නිසි නියාමනයක් යටතේ සාමාන්‍ය ජනතාවට බලපත්‍ර ලබාදීමටත් අදාල බලධාරීන්ගෙන් ඉල්ලා සිටීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි මම අමුතුවෙන් කිව යුතු නෑ රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජන ජීවිතයට බෙහෙවින් බලපාන කාරණාවක් තමයි මැණික් ආර්ථිකය. මිනිස්සු පතල් කැනීම් කරලා මැණික් ගල් හොයාගෙන ඒකෙන් ජීවත් වෙනවා. විවිධ මට්ටමේ. සාමාන්‍ය මිනිස්සු අපේ ගම්වල මිනිස්සු පතල් කම්කරුවෝ විදිහට ජීවත් වෙන්නේ මැණික් කර්මාන්තයෙන්. ඊට අමතරව යම් මට්ටමක අයෙක් සුළු මැණික් ව්‍යාපාරිකයෝ විදිහට ජීවත් වෙනවා. ඒ එක්කම මහා පරිමාණයේ මැණික් ව්‍යාපාරිකයෝත් ජීවත් වෙනවා. මේකෙන් සමස්ත රත්නපුර දිස්ත්‍රික්කයේ ආර්ථිකය ගත්තහම ලොකු තැනක් හිමි කර ගන්නවා. මේකට මැණික් ලැබීම, මැණික් හොයා ගැනීම අත්‍යාවශ්‍ය දෙයක්. එහෙම නැත්නම් මැණික් හම්බ වෙන්නේ නෑ. නැත්නම් පතල් කම්කරුවන්ගේ ආර්ථිකයත් නෑ. ඒ එක්කම ඔවුන්ගේ ජන ජීවිතයත් අඩාලයි. යැපෙන්නන් අනාතයි. ඒ එක්කම සුළු මැණික් ව්‍යාපාරිකයන්ගේ ආර්ථිකය අඩාලයි. අනිත් ව්‍යාපාරත් අඩාලයි. ඒ එක්කම මහා පරිමාණ ව්‍යාපාරිකයන්ගේ ආර්ථිකය අයහපත් වෙනවා කියන්නේ සමස්ත ආර්ථිකයටම බලපානවා.

ඒ නිසා ගරු සභාපතිතුමනි මූලික දේ තමයි මැණික් ලැබෙන්න ඕනේ. මැණික් හොයා ගන්න ඕනේ. මැණික් හොයා ගන්න නම් පතල් කර්මාන්තය තියෙන්න ඕනේ. හැබැයි අද වෙන කොට පතල් කැනීම සඳහා තියෙන අවස්ථා ඉඩ අඩුයි. හේතුව තමයි නීත්‍යානුකූලව පතල් කපන්න ගියහම බලපත්‍ර ගන්න ඕනේ. ඒක අත්‍යාවශ්‍ය දෙයක්. ඒක අවශ්‍යයි. හැබැයි බලපත්‍ර ගන්න තියෙන අසීරුතාවය ප්‍රබල කාරණාවක්.

ගරු සභාපතිතුමනි මැණික් කැනීමේ බලපත්‍රයක් ගන්න පියවර 12 ක් තියෙනවා. ඉල්ලුම් පත් ඉදිරිපත් කරන්න ඕනේ. ඒක ලියාපදිංචි කරන්න ඕනේ. ඒකට මූලික පරීක්ෂණයක් කරනවා. ඊට පස්සේ ඒකේ ක්‍රියාත්මක නිළධාරී දාලා ඒක නිර්දේශ කරන්න ඕනේ. ඊට පස්සේ සහකාර අධ්‍යක්ෂ නිර්දේශ කරන්න ඕනේ. ඊට පස්සේ දින 14 ක් කල් තියනවා. ඊට පස්සේ ආපසු ලේඛණගත කරන්න ඕනේ. ලේඛණගත කරලා ආපහු ජාල පද්ධතියට ඇතුළත් කරන්න ඕනේ. ජාල පද්ධතියට ඇතුළත් කරලා ඒක ගැලපෙනවාද කියලා බලලා ඒකේ දෙන්න සුදුසුකම් ටික බලලා අධ්‍යක්ෂක තුමාට ඉදිරිපත් කරනවා. අධ්‍යක්ෂකතුමා මේක බලලා ඉවර වෙලා නිර්දේශ කරලා නීති අංශයට යොමු කරන්න ඕනේ. නීති අංශයෙන් මේක බලලා හරිද වැරදිද කියලා මුදල් බඳින්න කියලා කියනවා. මුදල් බැන්දට පස්සේ ආපහු අධ්‍යක්ෂකතුමාට නිර්දේශත් එක්ක සභාපතිතුමාට යවන්න ඕනේ. සභාපතිතුමාගේ නිර්දේශය අනුව තමයි මේක ලැබෙන්නේ. එහෙම නම් ගරු සභාපතිතුමනි මේ සංකීර්ණ වූ ක්‍රියාවලියෙන් මැණික් ගැරීමේ බලපත්‍රය ගැනීමට ඉතා අසීරු කාරණාවක්. ඒ හින්දා එක් පැත්තකින් වෙන කාරණය තමයි බලපත්‍ර ගන්නේ නැතුව පතල් කැනීම සඳහා යොමු වෙනවා. අපි කියනවා නීත්‍යානුකූල බලපත්‍ර ගන්න. ඒ අනුව මැණික් ගරන්න කියලා කියනවා. හැබැයි බලපත්‍රයක් ගන්න කියන මේ

අසීරු කාරණාවත් එක්ක මිනිස්සු අනවසර මැණික් ගැරීමට පෙළඹෙනවා. එතකොට අපි කියනවා පාරිසරික හානි සිද්ධ වෙනවා කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි අද වෙන කොට එක් පැත්තකින් මැණික් කර්මාන්තයේ මහා කඩා වැටීමක්. අද අපේ ගම්වල අහිංසක මිනිස්සුන්ට ජීවත් වෙන්න විදිහක් නෑ. පතල් ලයිසන් ගන්න විදිහක් නෑ, හැබැයි මේ මොන කතන්දර තිබ්බත් ධනවතුන් බලවතුන් මේ සියළු දේවල් වලට පිටුපාලා මහා පරිමාණයේ පතල් කැනීම් කරනවා කියන කාරණාව පැහැදිලිය. ඒකට මේ සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා සාක්ෂි දරනවා ඇති. ඒ නිසා ගරු සභාපතිතුමනි මේක මෙහෙම කරන්න ඕන කියන කාරණාව මම කියන්නට ලෑස්ති නෑ. ඒ හින්දා මේ පතල් කැනීම් බලපත්‍ර ලබාදීමෙහිලා ක්‍රමවේදය සරල විය යුතුයි. අපේ මිනිස්සුන්ට ලේසියෙන් බලපත්‍රය ගන්න නම් මම මේකෙන් කියන්නේ නෑ අඩුපාඩු තියාගෙන ලයිසන් එක දෙන්න කියලා කියන්නේ නෑ. නීතියෙන් රිංගලා බලපත්‍ර දෙන්න කියලා කියන්නේ නෑ. නීත්‍යානුකූ පරිසරයට හානියක් නොවන මට්ටමින් ඒ අයිතීන් තහවුරු කරමින් දිය යුතුයි. හැබැයි මේක සරල වෙන්න ඕනේ. මේ පියවර දහයක් දොළහක් ගිහිල්ලා අවසානයට ලිපි ගොනුව කොළඹට යවලා එකේ දවස් ගණන් බලා ඉඳලා ආවට පස්සේ තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි මම යෝජනා කරන්නේ මැණික් කැනීම් බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය සරල කරන්න. මේක මිනිස්සුන්ට පතල් ලයිසන් එකක් ගන්න පුළුවන් විදිහට සාමාන්‍ය ජනතාවටත් සාමාන්‍ය මිනිස්සුන්ටත් පතල් ලයිසන් එකක් ගන්න පුළුවන් විදිහට මේ ක්‍රමවේදය හැදෙන්න ඕනේ. ඊට අමතරව සමහර තැන් තියෙනවා ගංගා ආශ්‍රිතව අපි කවුරු කොහොම කිව්වත් මහා පරිමාණ ධනවතුන් බලවතුන් මහා පරිමාණ පරිසර හානි කරමින් කැනීම් කඩනවා. ඒවා නතර වෙන්න ඕනේ. හැබැයි හැබැවට රත්නපුරේ උරුමක්කාරයෝ සාමාන්‍ය ජනතාවටත් මැණික් ගන්නත් අවස්ථාව දෙන්න ඕනේ. ඒකත් පරිසර හානි සිද්ධ වෙන විදිහට නෙමෙයි. නීත්‍යානුකූලව නිසි නියාමනයක් යටතේ සාමාන්‍ය ජනතාවට ජීවත් වෙන ජනතාවට අවස්ථාව ලබා දෙන ක්‍රමවේදයක් හදන්න කියලා මේ ගරු සභාවට යෝජනා කරමින් අසා සිටි ඔබ සැමට ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

මීළඟට විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

---------------------------------------------------------

ගරු සභාපතිතුමනි සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ හැටියට එතුමා කියන්නේ මැණික් ගැරීම සම්බන්ධව අවසර දීමත් , අනවසර පතල් කැපීම සම්බන්ධවයි . ගරු සභාපතිතුමනි බලපත්‍ර දීම සරල විය යුතුයි කිව්වහම ඒකේ අදහස් වෙන්න ඕනේ සරල විය යුතුයි කියන කොට දැන් අපි ගොවිජන සේවා එකෙන් අවසර ගන්න ඕනේ. විවිධ කාරණා තියෙනවා ගරු සභාපතිතුමනි. මේ කරුණු කාරණා ගත්තහම රාජ්‍ය මැණික් සංස්ථාව මේක අද ඊයේ 2015 ජනවාරි 08 වෙනිදාට පස්සේ ආපු දෙයක් නෙමෙයි ගරු සභාපතිතුමනි. කාලාන්තරයක් තිස්සේ තිබ්බච දෙයක්. අනවසර පතල් කැපීමත් එහෙම තිබ්බා. මේ අනවසර හා අවසර ලත්

අයගෙන් වෙන හානිය ගත්තහම අතිවිශාලයි. පහුගිය කාල වකවානුවේ තමුන්නාන්සේලාටත් මතකයි දැනුත් ඒ දේ කරගෙන යනවා. බැකෝ බලපත්‍ර අරගෙන මේ බලපත්‍ර දීලා බලපත්‍රය ගත්ත උදවිය මේ කරන පරිසර හානිය අතිවිශාලයි ගරු සභාපතිතුමනි. මේ ගැන අපි අවධානය යොමු කරන්න ඕනේ. සාමාන්‍යයෙන් අපි පතලක් කපලා ඒක දොළොස් රියන් වෙන්න පුළුවන්. හය රියන් වෙන්න පුළුවන්. නව රියන් වෙන්න පුළුවන්. මෙහෙම පතලකින් පරිසර හානියක් සිදු වෙන්නේ නෑ. එහෙම නම් මේ බලපත්‍ර දීම තුළින් ගත්තහම ගරු සභාපතිතුමනි බැකෝ ලයිසන් 200 කට වැඩි ප්‍රමාණයක් දීලා තියෙනවා. ඒවා ගත්තහම පරිසර හානිය අතිවිශාලයි. මේවා තමයි සංශෝධනය විය යුත්තේ. බැකෝ ලයිසන් එකට දීලා තියෙන අවසරය ගත්තහම අපි මේක හැමදාම කතා කරන දෙයක්. මාසයකට දෙවතාවයි සභාව තියෙන්නේ. අවුරුදට දොළොස් මාසය ගත්තහම දෙකෙන් පංගුවක්ම කතා කරන්නේ මැණික් කර්මාන්තය ගැන. මේවෙන් වෙන හානිය අහිංසක පතල් කම්කරුවා පතලයක් කපලා පරිසර හානියක් සිදු වෙන්නේ නෑ. ඒ එක්කම කියලා තියෙනවා ගංගාවල පතල් කැපීම දිය යුතුයි කියලා ගරු සභාපතිතුමනි. ගංගාවල පතල් කැපීම දුන්නොත් මේක අපිට මහ මුහුදක් වෙයි. ඒ නිසා ඉවුරු ඛාදනය නොවෙන ආකාරයට දීලා තියෙනවා නම් පරිසර හානියක් නොවෙන ආකාරයට වරදක් වෙනවා නම් ඒක නිවැරදි වෙන්න ඕනේ. ඒකයි අපි බලාපොරොත්තු වෙන්නේ. පහුගිය කාලයේ මන්ත්‍රීතුමා ඔබතුමා දන්නවා ඇති අර සීතාවක ගගේ කපාපුවා ඒවා ටොන් ගණන් මැණික් අරන් ගියපුවා මේවා රාජ්‍ය මැණික් සංස්ථාව හරහා කරන ඒවානේ. අරවා එහෙම නෙමෙයිනේ කළේ. ඒ තුළින් වක්‍රව කළා. මේවා ගරු සභාපතිතුමනි ගත්තහම සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාගේ යෝජනාව වැදගත්. නමුත් මී බලපත්‍ර දීමෙන් පරිසරයට වෙන හානිය වලක්වා ගැනීම සඳහා රාජ්‍ය මැණික් සංස්ථාව මීට වඩා උනන්දු කරවන්න ඕනේ. මීට වැඩිය නීති තද කරවන්න ඕනේ. මේ තුළින් තමයි පරිසරය ආරක්ෂා කරන්න වෙන්නේ. අහිංසක පතල් කම්කරුවෙක් බලපත්‍රයක් අරගෙන හය රියන්,දොළොස් රියන්, නව රියන් පතලක් දාලා පරිසර හානියක් වෙන්නේ නෑ ගරු සභාපතිතුමනි. ඇරත් මම කියනවා ගගේ ,ඇලේ,දොළේ පතල් ගැරීමට අවසර දෙනවා කියන්නේ පරිසර හානිය වෙනවා කියන එක සම්පූර්ණයෙන්ම තහනම් නීතිය වෙනවා. පරිසරය විනාශ වෙන තමයි වෙන්නේ ගරු සභාපතිතුමනි. අපේ ඇල,දොළ ගත්තහම ඉවුරු ඛාදනය තුළින් අපේ පොඩි ඇළ ගඟක් බවට පත් වෙනවා. මුහුදක් බවට පත් වෙනවා. මේකෙන් පරිසරය විනාශ වෙනවා. ඒ නිසා සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව වැදගත්කමක් තියෙනවා. මේක සංශෝධණය වෙන්නට ඕනේ සරල විය යුතුයි කියන එක ගරු සභාපතිතුමනි මම එහෙම කියන්නේ නෑ. තවත් තද කරන්න ඕනේ මේ රාජ්‍ය මැණික් සංස්ථාවෙන් දෙන බලපත්‍රය. විශේෂයෙන් බැකෝ වලට. දෙන ඒවා නීති තද කරලා මෙ පරිසරය ආරක්ෂා වෙන ආකාරයට වැඩ කරන්න කියලා ඉල්ලනවා ගරු සභාපතිතුමනි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ගරු සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමනි. මීළඟට අරුණ නිලන්ත ජයසිංහ මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී නිලන්ත ජයසිංහ*
***கௌரவ உறுப்பினர் நிலந்த ஜயசிங்ஹ***
*Hon.Member Nilantha Jayasinghe*
-------------------------------------------

ගරු සභාපතිතුමනි ඇත්තටම ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාට මම ස්තූතිවන්ත වෙනවා රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් විදිහට අපේ රත්නපුර ජනතාවගේ එකම රැකියාව විදිහට තිබුණ මැණික් සම්පත පිළිබඳව යෝජනාවක් මේ පළාත් සභාවට ඉදිරිපත් කිරීම පිළිබඳව. ඇත්තටම ගරු සභාපතිතුමනි මම විමසීමක් කරනවා මේ යෝජනාව මේ කතා කරන අවස්ථාවේදී රාජ්‍ය මැණික් සංස්ථාවේ කවුරු හරි නිළධාරියෙක් මෙතෙන්ට ඇවිල්ලා ඉන්නවා නම් අපි මං හිතන්නේ මේ පළාත් සභාවේ කතා කරන දේ පිළිබඳව ඉතාම අත්‍යාවශ්‍ය කාරණාවක් වෙනවා. ඒ නිළධාරීන් මේ පිළිබඳව දන්නේ නෑ. එහෙම නැත්නම් මාධ්‍ය හරහා ගිහිල්ලා දැන ගත්ත දෙයක් වෙන්න පුළුවන්. නැත්නම් අපි ලිඛිතව දන්වපු දෙයක් වෙන්න පුළුවන්. ඊට වඩා කාලෝචිතයි සෑම යෝජනාවක්ම ආයතනය නියෝජනය කරන නිළධාරියෙක් හෝ කවුරු හරි මේ පළාත් සභාව ඇතුළට ගෙන එනවා නම්. ඒක අපිට අත්‍යාවශ්‍ය කාරණාවක් වෙනවා. මොකද අද මේ වනවිට මැණික් බලපත්‍ර ලබාගැනීමේදි ඉතාම අසීරු කාරණාවක් වෙලා තියෙනවා සාමාන්‍ය ජනතාවට මැණික් බලපත්‍රයක් ලබා ගැනීම. තමන්ගේ පුද්ගලික ඉඩමක තනි අයිතියක තියෙන ඉඩමක වුණත් අපි ඔය පිළිබඳව යෝජනාවක් ඉදිරිපත් කළා. පහුගිය කාල වකවානුව තුළ අනිල් කොස්වත්ත කියලා සභාපතිවරයෙක් හිටියා. ඒ සභාපතිවරයා මැණික් සම්පතින් ලැබෙන ආදායම විදේශ ආදායම කොච්චරද ලංකාවේ තියෙන පතල් කොච්චර දීලා තියෙනවද ලයිසන් කොච්චර දීලා තියෙනවද කියලා ඒ ආදායම පතල් සංඛ්‍යාවෙන් බෙදලා හැම පතලකින්ම මෙච්චර මාසයකට මුදලක් හම්බ වෙනවා කියලා හිතේ තියාගෙන සංගණන හදපු කාලයක් තිබුණා. නමුත් අද ඒවා වෙනස් වෙලා අද මේ වනවිට මේ මැණික් ගැරීමේ බලපත්‍ර දීම මං හිතන්නේ අර සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා කිව්වා වගේම බලවතාව මුදල් තියෙන පුද්ගලයාට පමණක් සීමා වෙලා තියෙනවා. ගියවර මම සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කළා. රක්වාන ගඟේ ගබ්බෙල ග්‍රාම නිළධාරී වසමේ කරගෙන යන පතල් කර්මාන්තයක් පිළිබඳව. මහ ගඟේ මේ වනවිටත් බැකෝ දාලා සකර් හයි කරලා පතල් කරනවා. සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා පරිසරය ආරක්ෂා කරන්න ඕනේ කියලා. නමුත් ඒකට මධ්‍යම පරිසර අධිකාරියේ කිසිම බලපෑමක් නෑ. මං හිතන්නේ මැණික් සංස්ථාව ඊයේ දිනයේදී මේ යෝජනාව පළාත් සභාවේ කතා වෙනවා කියලා දැනගෙනද මං දන්නේ නෑ ඊයේ දිනයේදී මට ආරංචි වුණා ඒ පතල් පොලවල් වලට ගිහිල්ලා පොඩ්ඩක් බලලා ආවා කියලා. හැබැයි ඒ සියළු දෙනා දන්නවා මැණික් සංස්ථාවෙන් එනවා කියලා දන්නවා. ඉතාමත් කණගාටුදායක කාරණාවක්. මොකද පරිසරය ආරක්ෂා කරන්න වැඩ පිළිවෙලක් පහුගිය රජය තුළ තිබුණා. පරිසර පොලීසිය කියලා එකක් ස්ථාපනය වෙලා තිබුණා. රත්නපුර දිස්ත්‍රික්කයට පොලිස් ස්ථාන දෙක තුනක්ම තිබුණා ඒ පරිසර පොලීසියේ අංශ වෙන් කරලා. නමුත් අද ඒ සියල්ල අයින් කරලා. දැන් අහපුවහම කොළඹ විතරයිලු තියෙන්නේ. හැබැයි කොළඹින් ඉන්නවද කොතනටද කතා කරන්නේ කාටද කතා කරන්නේ කියලා කිසිම දෙයක් අපි දන්නේ නෑ. මහා ලොකුවට පරිසරය ගැන ජන මාධ්‍යට කතා කරනවා. හැබැයි ඒ ජන මාධ්‍යයට කතා කරන නායකයෝ කවදාකවත් පහළට බැහැලා පරිසරයට වෙන හානිය පිළිබඳව තමන්ගේ ගෝල බාලයෝ ටික කරන හානිය පිළිබඳව කිසිම වෙලාවක හොයලා බලලා නෑ. ඒ නිසා තමයි අදත් ඒ ගබ්බෙල ගඟේ පතල් කර්මාන්තය මේ විදිහට වෙලා තියෙන්නේ. මම නම් වශයෙන්ම කියන්නම්

ඒ පුද්ගලයෝ කවුද කියලා. ගයාන් ගුරුගේ, ගුරුගේ මැණික් අධිපතිතුමාගේ පුතා තමයි ඒ පතල් කර්මාන්තය කරගෙන යන්නේ. ඉතාමත් පරිසර හානියක් සිද්ධ වෙනවා. මොකද වීඩියෝ තියෙනවා. මම එතෙන්ට ගිහිල්ලා මට විරුද්ධව පැමිණිලි දෙකක් ඉදිරිපත් කරලා තියෙනවා රක්වාන පොලීසියේ. මොකක්ද තර්ජනය කළා කියලා. මම ගියේ ගමේ මිනිස්සු ඇවිල්ලා මට කිව්වා ගඟේ නාන්න බෑ කියලා වතුර බොර වෙනවා කියලා. මට ඇවිල්ලා කියන කොට ඒ මිනිස්සුන්ගේ ප්‍රශ්නය ඒ මිනිස්සුන්ගේ අවශ්‍යතාවය විසඳන්න එතෙන්ට ගියාට පස්සේ මම ගියේ තර්ජනය කරන්න කියලා. ඒවගේ මගේ ඊට එහා පැත්තේ අල්ලපු ඉඩම මගේ. මගේ පියාගේ ඉඩමක්. එතුමා ගිහිල්ලා මැණික් සංස්ථාවේ සභාපතිවරයාට ලිඛිතව ලිපියක් ඉදිරිපත් කළා මේ වගේ අසාධාරණයක් සිද්ධ වෙනවා. පරිසර හානියක් සිද්ධ වෙනවා. මගේ ඉඩමටත් මේ වගේ හානියක් සිද්ධ වෙනවා කියලා. නමුත් කිසිම ක්‍රියා මාර්ගයක් මේ වන තෙක් මැණික් සංස්ථාව හෝ මධ්‍යම පරිසර අධිකාරිය අරගෙන නෑ. ඒ නිසා මැණික් සංස්ථාව පිළිබඳ කලකිරීමක් තියෙන්නේ. රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව විදිහට අපි සියළු දෙනාගේ කර්මාන්තය මැණික් කර්මාන්තය. අද මැණික් කර්මාන්තය ඉතාමත් පහළ තත්ත්වයට වැටිලා තියෙනවා. එදා හිටිය සාමාන්‍ය වෙළෙන්දා ගමේ කම්කරුවාගේ පුතා දලන් කෑල්ලක් අරගෙන විශාල මැණික් මුදලාලි කෙනෙක් වුණ කාල වකවානුවක් තිබුණා. අද ඔහුට මැණික් කර්මාන්තයෙන් ඉස්සරහට එන්න බැරි තත්ත්වයක් උදා වෙලා තියෙනවා. ඒක අද එක්තරා සීමා සහිත පිරිසක් අතට පමණක් ගිහිල්ලා තියෙනවා. මැණික් සංස්ථාව එතන ඉඳන් තමන්ගේ රාජකාරිය ඉෂ්ඨ කරනවා නෙමෙයි. මුදලට යට වෙලා ඒ මුදල් ටික අරගෙන ඔවුන් ඒ මුදල් වලින් තමයි යැපෙන්න පටන් අරන් තියෙන්නේ. රජයෙන් ලැබෙන මුදලින් නෙමෙයි. ඉතාමත් කණගාටුයි. ඒ නිළධාරීන් ඇඳුමක් ඇඳගෙනද මේ තැන් වලට යන්නේ කියන එක මට දැන ගන්න අවශ්‍යයි. එතුමන්ලා එතෙන්ට යන කොට එතන ඉන්න අය දන්නවා අද මැණික් සංස්ථාවෙන් එනවා. අපි මේ ටික අයින් කරන්න ඕනේ. සකර් මැෂින් එකක් හයි කරලා ගඟේ ඒක ඇහුවහම පස්සේ පොලීසියට ගිහිල්ලා මෙන්න මේ මෙහෙම එකක් තියෙනවා කියලා කිව්වට පස්සේ පැමිණිල්ල මෙහෙයවන අවස්ථාවේ එතකොට කියනවා ඒක වතුර ඉහින්නලු තියෙන්නේ. වතුර ඉහිනවා දවල්ට. රෑට ඒකට අවශ්‍ය හෝස් ටික හයි කරලා සකර් මැෂින් ටික හයි කරලා සකර් කරලා ගඟේ තියෙන ඉල්ලන් ටික ගන්නවා. අපිට ඒක ප්‍රශ්නයක් නෑ. ඉල්ලන් ටික ගත්තට කමක් නෑ. හැබැයි මේ සිදුවන පරිසර හානිය පිළිබඳව කාටද කියන්නේ කවුද වගකියන්නේ කියන එක පිළිබඳ ප්‍රශ්නයක්. අපි පළාත් සභාවේ පැය ගණන් කතා කළත් යෝජනා ඉදිරිපත් කරලා කතා කළත් අද මාධ්‍යවේදියාට බැරි වෙලා තියෙනවා ඒක මාධ්‍ය තුළින් හෝ ඉදිරියට ගෙනි යන්න. මම දැක්කා මොකද මම පහුගිය දවසක කතා කළ දෙය ඇත්තටම මං ලංකාදීප පත්තරේ මාධ්‍යවේදියාට ස්තූතිවන්ත වෙනවා ඉතා කුඩා කොටසක් හෝ පත්තරයට දාලා තිබුණා. හැබැයි අනිත් මාධ්‍යවල ඒක ගියේ නෑ. අපේ මාධ්‍යට මුහුණ පෙන්වන එක නෙමෙයි අවශ්‍යතාවය වෙලා තියෙන්නේ. අපිට මේ වෙන අසාධාරණය මාධ්‍ය තුළින් හෝ රටට දැනුවත් කරලා මේ රටේ වෙන පරිසර හානිය වළක්වන්න. ඒ පරිසර හානිය වැළැක් වුවොත් අපිට මේ පක්ෂ දේශපාලනය නෙමෙයි අපි මේ කතා කරන හැමදේම නෙමෙයි අනාගතයට මේ පරිසරය විනාශ වෙලා ඉතාම අඳුරේ අඳුරු යුගයට මේ රට පත් වෙනවා කියන එක මතක් කරන්න ඕනේ. අපේ සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමා කිව්වා සීතාවක ගඟේ පතල් කපනවා කියලා. මම අහලා තියෙන විදිහට මැණික් සංස්ථාව පතල් කපන්න පටන් අරන් තියෙන්නේ දැන්. මැණික් සංස්ථාව පතල් කපන්න ස්ථාපනය කරලා තියෙන්නේ. මොන ආකාරයකින්

මොන විදිහකින් කරනවද මං දන්නේ නෑ නියාමක ක්‍රමයක් නෙමෙයි වෙන්නේ 99% ක් මැණික් සංස්ථාව. ගමේ මිනිස්සුන්ට පඩියක් දෙන්නේ දැන්. පහුගිය කාල වකවානුව තුළ අපි දැක්කා පතල් කම්කරුවන්ට රක්ෂණයක් හැදුවා. මැණික් සංස්ථාවෙන්. දැන් ඒවා වෙනස් වෙලා. නව සභාපතිවරු ඇවිල්ලා මේ සභාපතිවරු මැණික් ගැන දන්නේ නෑ, පතල් කර්මාන්තය ගැන දන්නේ නෑ. රත්නපුර දිස්ත්‍රික්කයේ කිසිම කෙනෙක් ඒ සංස්ථාව තුළ නෑ. ඒ නිසා මැණික් සංස්ථාව තුළින් මේ කරගෙන යන වැඩ පිළිවෙල ඉතාමත් කණගාටුදායක තත්ත්වයකට මේ රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාව පත් වෙනවා. මේ මැණික් කර්මාන්තය ආරක්ෂා කරන්න අපේ පළාතට සබරගමු පළාතට සමන් දේවාලය වගේම, සිරිපාදය වගේම මැණික් කර්මාන්තයත් එක හා සමානව තියෙන තැනක්. ඒ නිසා මැණික් කර්මාන්තය ආරක්ෂා කිරීමේ වගකීම අපේ පළාත් සභාවේ අපි සියළු දෙනාටම තියෙනවා. ඒ නිසා මැණික් කර්මාන්තය ආරක්ෂා කරලා මැණික් ව්‍යාපාරිකයෝ ආරක්ෂා කරන වැඩ පිළිවෙලකුත් සැදිය යුතුයි. ඒ නිසා අපේ සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාට මම ස්තූතිවන්ත වෙනවා මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කරලා අද මැණික් කර්මාන්තය වැටිලා තියෙන තැනින් ගොඩ ගන්න අවශ්‍ය වැඩ පිළිවෙලක් නිර්මාණය කරන්න කියන ඉල්ලීම කිරීමට මේ පළාත් සභාව තුළින් හෝ මධ්‍යම රජයට හරි එහෙමත් නැත්නම් අදාල ආයතන තුළින් බලපෑමක් කිරීමට කටයුතු කිරීම තුළින් හරි දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලක් තුළින් මැණික් කර්මාන්තය ආරක්ෂා කිරීමට මින් ඉදිරියට හෝ මැණික් කර්මාන්තය හෝ වේවා වෙනත් යෝජනාවක් පිළිබඳව යම්කිසි ආදරයක් තියෙනවා නම් මෙම යෝජනාව ඉදිරිපත් කරන්න පෙර මෙම යෝජනාව පළාත් සභාවේ අපි මෙහෙම කතා කරනවා සහා රැස්වීමට සහභාගි වීමට අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් ගරු මන්ත්‍රීතුමාට නැවතත් ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තූතියි ගරු අරුණ නිලන්ත ජයසිංහ මන්ත්‍රීතුමනි. මීළඟට ගරු යෙහෙයියා එම්.ඉෆ්ලාර් මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*

-----------------------------------------

ගරු සභාපතිතුමනි විශේෂයෙන් සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද යෝජනාව එක පැත්තකින් සාකච්ඡා කරන මොහොතේ ඒකේ සත්‍යතාවයකුත් තියෙනවා ඒකේ කාසියේ දෙපැත්ත වගේ හොඳ නරක කියන දෙකම තියෙනවා. අපි රත්නපුර දිස්ත්‍රික්කය ගත්තහම ගරු සභාපතිතුමනි සබරගමු පළාතේ විශේෂයෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ බහුතරයක් ජීවත් වෙන්නේ මැණික් කර්මාන්තයෙන්. ඒ එක්කම මැණික් කර්මාත්යෙන් ජීවත් වෙච්චි බහුතරයක් ඉන්න ඉඩම්වල ගොඩ ඉඩම්වල තියෙන පතල් විශාල ප්‍රමාණයක් කපලා ඉවර වෙලා දැන් ගැඹුරු පතල් මුහුද හා සමාන ගැඹුරු පතල් ක්‍රම යෝගයක් තමයි දැන් යන්න වෙලා තියෙන්නේ. මම කතා කරන මමත් මැණික් කර්මාන්තයේ දීර්ඝ කාලයක් ඉඳලා ඒවෙන් පෝෂණය වෙලා ඒවෙන් ඉහළට ගිහිල්ලා දැන් ඒ කර්මාන්තයේ නොකළත් අපි හොඳට අත්දැකීම් රාශියක් තියෙන උදවිය. ගරු සභාපතිතුමනි එතුමා කියන

කතාවේ එක තැනක ඇත්තක් තියෙනවා මැණික් කර්මාන්තය කරන රත්නපුර දිස්ත්‍රික්කය ගත්තහම බහුතරයක් මේ සඳහා යෙදිලා ඉන්නේ. රත්නපුරේ කිව්වහම අපිට මාළු බාන්න එහෙම නෙමෙයි හම්බ වෙන්නේ මැණික් කර්මාන්තය. මැණික් කර්මාන්තය මට මතක් වෙන්නේ අපේ හිටපු සභාපතිවරයෙක් තමයි අපේ හිටපු ප්‍රධාන අමාත්‍ය අසෝක ජයවර්ධන මැතිතුමාත් මෙතන ඉන්නවා. ඒ එක්කම මට නිලන්ත ගරු මන්ත්‍රීතුමා කතා කළහම මට පොඩි දෙයක් මතක් වුණා. මේ සභාපතිවරයා මේ සභාපතිවරයා කොහේවත් නෙමෙයි ඇහැලියගොඩ බුළුගහපිටියේ පදිංචි කෙනෙක් තමයි අද ඉන්න මැණික් සංස්ථාවේ සභාපතිවරයා. අනිත් පැත්තෙන් ගත්තහම මේ විෂයපතයේ ඉන්නේ වර්තමානයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ පරිසර අමාත්‍යාංශය හරහා තමයි කෙරෙන්නේ. ඇත්ත වශයෙන් ඔබතුමාගේ නායකයා තමයි මේකේ ඇමතිවරයා.

ඒ එක්කම ගරු සභාපතිතුමනි මම මේ කල්පනා කර කර හිටියේ මේක පැහැදිලිවම ගත්තහම අපි මේකේ වෙන මොකුත් නෙමෙයි අපි කාගේත් අරමුණ බලාපොරොත්තුව සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාගේත් අවශ්‍යතාවය තියෙන්නේ මැණික් කර්මාන්තය කරන අයට බලපත්‍ර ගැනීම පහසු කිරීමටත් ඒවගේම මැණික් කර්මාන්තය තුළින් පරිසර හානිය වෙනවා නම් ඒ හානිය වලක්වලා ඔවුන්ට බලපත්‍ර දීමෙන් තොරව කටයුතු කිරීමත් තමයි බලාපොරොත්තු වෙන්නේ. අපි ඒක එක හෙලාම එකඟ වෙලා කටයුතු කරනවා වගේම අපි ඒකට පක්ෂග්‍රාහීව කතා කරනවා. වෙන මොකුත් නිසා නෙමෙයි පරිසර හානියට අපි කවුරුත් විරුද්ධයි.

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*
-----------------------------------------------------

ඔබතුමා කතා කරන කොට ටී.වී. එකේ හෙන්ට්‍රි මොන් කොමරි කියලා වැටෙනවා. මෙතුමාගේ පින්තූරයත් එක්ක.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------

හොඳයි සභානායකතුමා මම ඒක පරීක්ෂා කරලා බලන්නම්. නෑ කාගේවත් නම් තවම කතා කරන කොට වැටෙන්නේ නෑ. හරි ඔබතුමාගේ අවස්ථාව ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

ගරු සභාපතිතුමනි මම ඔබතුමාව දැනුවත් කරන්න හදන්නේ ඉතාම වැදගත් යෝජනාවක් සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා ගෙනාවේ. ඒවගේම එතුමා බලාපොරොත්තු වෙන්නේ වෙන මොකුත් නෙමෙයි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

හරි හරි ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කතා කරන්න . සභානායකතුමා මම ඒක පරීක්ෂා කරන්නම්. ඒක එහා පැත්තෙන් වෙන කාරණාවක්. ඔබතුමාගේ අවස්ථාව ඔබතුමා කතා කරන්න. ඒක ඔබතුමාගේ කතාවට බාධාවක් වෙන්නේ නෑ.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
----------------------------------------

ඒවගේම මම මේ කියාගෙන එන්නේ වැදගත් යෝජනාවක් මේ මැණික් කර්මාන්තයේ බහුතරයක් යෙදිලා ඉන්නේ විශේෂයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ. අනිත් එක ලෝකයේම ප්‍රසිද්ධ නගරයක් තමයි මිනි පුරය කියයි. රුවන්පුරය කියයි. රත්නපුරය කියනවා. මේක හැදිලා තියෙන්නේ වෙන හේතුවක් නිසා නෙමෙයි මැණික් කර්මාන්තය නිසා. නමුත් අද අපිට වෙලා තියෙන්නේ මේ සියල්ලටම වෙන මොකුත් නිසා නෙමෙයි ගරු සභාපතිතුමනි මේකේ අඩුපාඩු තියෙනවා. ඒවගේම මේකට බලපත්‍ර දීමේදී අක්‍රමවත් ක්‍රමවේද තියෙනවා. මේවා පිළිබඳව සොයලා බලලා කටයුතු කිරීම වැදගත්. ඒවගේම අපේ මන්ත්‍රීතුමා ඉස්සෙල්ලා ඉල්ලීමක් කළා නිලන්ත මන්ත්‍රීතුමා යම් දෙයක් කත කරනවා නම් අදාල ආයතනයේ යම්කිසි පුද්ගලයෙන් සහභාගී වෙනවා නම් වැදගත්. මොකද ඒ පිළිබඳව ඒ අය සටහන් කරගෙන ඒ අයගෙන් ඉහළ අයට දැනුවත් කරලා යමක් සිදු වෙයි කියන හැඟීම අපි හැමෝම තුළ තියෙනවා. මේ යෝජනාවක් වශයෙන් ගේන එක නෙමෙයි. මේක ප්‍රායෝගිකව සහ මේකේ අඩුපාඩු අපි දැනුවත් කිරීම තුළින් සහ ඒ අයගේ අඩුපාඩු තියෙනවා නම් ඒවා නිවැරදි කරගෙන සමාජයේ යමක් යහපතක් කිරීම තමයි බලාපොරොත්තු වෙන්නේ. නැත්නම් මේක සමහරවිට ඔබතුමා කියන්න පුළුවන් මේක විෂයපතයට නෑ. මේක මධ්‍යම ආණ්ඩුවෙන්. රේඛීය අමාත්‍යාංශයෙන්. නමුත් ඕනම දෙයක් තිබුණොත් අපේ පළාත් සභාව තුළ අපේ ප්‍රදේශය තුළ අපේ ජනතාවට යමක් වෙනවා නම් ඒක කතා කිරීම සහ ඒ සඳහා විසඳුම් ලබාදීම අපි සියළු දෙනාගේ යුතුකම වගකීම වෙනවා. ඒ නිසා මේ යෝජනාව මම එක පැත්තකින් අනුමත කරන ගමන් අනිත් පැත්තෙන් මේ තියෙන පරිසර හානිය අවම කිරීම සහ මැණික් සංස්ථාව සහ පරිසර දූෂණය ගැන කතා කරන කොට වර්තමාන ජනාධිපතිතුමා තමයි පරිසර ඇමතිතුමා. තමුන්නාන්සේලාට වැඩියෙන් මේක කියලා කතා කරලා විසඳ ගන්න පුළුවන්. ඒවගේම මේ ප්‍රදේශයේ මේ කර්මාන්තය ආරක්ෂා කිරීම සහ මම නම් අනිත් පැත්තෙන් බැකෝ යන්ත්‍ර යෙදීම එක හෙලාම විරුද්ධ වෙනවා. වෙන මොකුත් නිසා නෙමෙයි පරිසරය දැඩි ලෙස හානි වෙනවා. මොකද ඒ කර්මාන්තය ආරම්භ කරලා කරගෙන ගියාට පස්සේ ඒ අය නැවත ඒ වලවල් වහන ක්‍රමයක් නෑ. ඒවගේම වටේ පිටේ විශාල ප්‍රමාණයක් හානියක් සිද්ධ වෙනවා. ඒවගේම මේක කරලා කරලා දුෂ්කර ප්‍රදේශවල කළාට කමක් නෑ. මේක නගරබදත් සිදු වෙනවා මේක. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙසත් මේ යෝජනාව අපි අනුමත කරමින් මේ සම්බන්ධයෙන් මැණික් හා ස්වර්ණාභරන අධිකාරිය සහ පරිසර ඇමතිතුමා දැනුවත් කරලා ඒවගේම සභාපතිතුමා දැනුවත් කරලා යම් සහනයක් අපේ ප්‍රදේශයේ ජනතාවට සහ මැණික් කර්මාන්තය ආරක්ෂා කිරීමට ඒ තුළින් ජීවත් වෙන ජනතාවට සහනයක් සැලසීමට සියළු දෙනාටම අවස්ථාවක් උදා වේවා යැයි ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තූතියි ගරු යෙහෙයියා එම්.ඉෆ්ලාර් මන්ත්‍රීතුමනි. මීළඟට අකිල සාලිය එල්ලාවල ගරු මන්ත්‍රීතුමා. එතුමා සභාවේ නැහැ. මීළඟට ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*
----------------------------------------------------------

ගරු සභාපතිතුමනි සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද යෝජනාව මම ස්ථිර කරමින් මම සඳහන් කරන්න කැමතියි එතුමාගේ යෝජනාවෙන්ම ඒ වචන කීපයෙන්ම එතුමා අදහස් කරන දේ පැහැදිලිවම සඳහන් කරලා තියෙනවා. මේ සභාව හැම අවස්ථාවකම මාසයකට දෙපාරයකට වරක් හැම අවස්ථාවකම මැණික් ගැරීම පිළිබඳව කතා කරලා තියෙනවා. කරුණු පැහැදිලි කරලා තියෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ගරු සභානායකතුමා ඔබතුමාට හාධා කරනවා නෙමෙයි. අපි ඉල්ලීමක් කලා මෙය විකාශනය කරපු ආයතනයට පාර්ලිමේන්තුවේ ආකාරයටම ගරු මන්ත්‍රීවරයෙක් කතා කරන කොට එතුමාගේ නම ප්‍රදර්ශනය වෙන ආකාරයට ස්ක්‍රීන් එක තුළ දාන්න ලැස්ති කරන්න කියලා. ඉතිං මේ වෙලාවේ ඊට අදාල කණ්ඩායම ඇවිල්ලා පොඩි පරීක්ෂණ කටයුත්ක නිරත වෙලා තියෙනවා. අපි ඒක දැනුවත් වෙලා නැති එක තමයි ඒක වෙලා තියෙන්නේ. ඒ සඳහා කළබල විය යුතු නෑ කියන එකයි දැනුම් දෙන්නේ. ඔබතුමාගේ අවස්ථාව.

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*
----------------------------------------------------------

බොහොම ස්තූතියි ගරු සභාපතිතුමනි. මම සභානායකවරයා හැටියට එය පෙන්වා දිය යුතු නිසා මා ඔබතුමාට පෙන්වා දුන්නේ. මම මේ යෝජනාව ගැන කතා කරන කොට ගරු සභාපතිතුමනි සභාවේ නොයෙක් වර මේ යෝජනාවේ සඳහන් කළ කරුණු පිළිබඳව සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා ඉතා පැහැදිලිව සඳහන් කළ කරුණ පිළිබඳව අපි කතා කරලා තියෙනවා. සෑම මසකට දෙවරකට වරක් මේ සභාව ගැඹුරින් සාකච්ඡා කරලා තියෙනවා. බැකෝ යන්ත්‍ර ගැන මැණික් ගැරීම සාකච්ඡා කරලා තියෙනවා. මැණික් ව්‍යාපාරය ගැන කතා කරලා තියෙනවා. විදේශ විනිමය ගැන කතා කරලා තියෙනවා. නමුත් අපි ලබලා තියෙන ප්‍රතිඵල නම් ඉතාම කණගාටුදායකයි කියන්න. අපි ලබලා තියෙන ප්‍රතිඵල අඩුයි මදියි කියන එක තමයි සඳහන් කරන්න ඕනේ. ඒ නිසා තමයි සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාට ඉතා පැහැදිලි ලෙස මෙවන් යෝජනාවක් සභාවට ගෙනෙන්නට සිද්ධ වෙලා තියෙන්නේ. ඒ නිසා අපි මේ මධ්‍යම රජය අවධානය යොමු කරලා කටයුතු කළ යුතු දෙයක් මේක. අපි සඳහන් කරන්නට කැමතියි ගරු සභාපතිතුමනි මැණික් සංස්ථාව ඇති වන්නට ප්‍රථම මේ කටයුත්ත සිද්ධ කලේ කච්චේරිය මගින්. කච්චේරියේ එක නිළධාරියෙක් තමයි මේ සියළු කටයුතු

සිද්ධ කළේ. ඒ කාලයේ මේ වගේ අහන්න ලැබුණේ නෑ. පරිසර දූෂණය වගේ ඒවා පිළිබඳව. ඒවගේම නොයෙක් ආකාරයේ ආරවුල් පිළිබඳව නීති විරෝධී ලෙස මැණික් ගැරීම පිළිබඳව කිසිම ආකාරයකින් හානියක් සිදු වෙන ආකාරයක් පිළිබඳව අහන්න ලැබුණේ නෑ. ඒක නිසි ආකාරයට මැණික් කියන්නේ සම්පතක්. ඒ සම්පත ලබාගෙන ඒ සම්පතින් ප්රයෝජනය ලබන්නට මීට වඩා වැඩ පිළිවෙලක් අවශ්‍යයි කියන එක තමයි මැණික් ගැරීම පුළුල් කරලා මැණික් සංස්ථාව පිහිටනු ලැබුවේ. පොළොවේ තියෙන සියළුම භූගත සම්පත අයිති වෙන්නේ රජයට. රජයට අයිති භූගත සම්පත් ජනතාවට ලබා ගන්නට අවස්ථාව සලසා දෙන කොට නීති සම්පාදනය කරලා නීති ක්‍රියාත්මක කරලා ඒවා නිවැරදිව ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වෙනවා. මේ නිසාම තමයි මැණික් සංස්ථාව බිහි වුණේ. මැණික් සංස්ථාව බිහි වෙලා කාලයක් යන කොට මැණික් සංස්ථාවෙන් කෙරෙන කටයුත්ත ප්‍රමාණවත් නැති නිසා මිනිසා මැණික් හා ස්වර්ණාභරන අධිකාරිය පිහිටවනු ලැබුවා. මැණික් හා ස්වර්ණාභරන පර්යේෂණ පුහුණු අධිකාරිය පිහිටවනු ලැබුවා. හැම එහෙකින්ම සිදු කරනු ලබන්නේ ගරු සභාපතිතුමනි මේ රටේ තියෙන විශාල සම්පතක් මේ රටේ ජනතාවට රටේ පරිසරයට හානියක් නොවන ආකාරයට ඒවා ගොඩ අරගෙන ඒවායින් රටට විශාල ආදායමක් විශාල විදේශ විනිමය ආදායමක් ලබා ගැනීම තමයි බලාපොරොත්තු වෙන්නේ. එහෙම වෙන කොට මේ සඳහා විශේෂ අවධානය යොමු විය යුතුව තියෙනවා. මීට වඩා වැඩියෙන් මේකට ක්‍රමසම්පාදනය කළ යුතුව තියෙනවා. ආරක්ෂාව පිළිබඳව පරිසරය ආරක්ෂාව පිළිබඳව ඒවගේම ඒවෙන් ලබන ප්‍රයෝජනය වැඩියෙන් ලබා ගැනීමේ උපක්‍රම සොයා ගැනීම අවශ්‍ය වෙනවා. නමුත් අද මැණික් සංස්ථාවටත් සිද්ධ වෙලා තියෙන්නේ මැණික් ගැරීමට සිදුවන හානිය වලක්වා ගැනීමට මුළු කාලයක් මුළු නිළධාරී මණ්ඩලයත් යොදවන්නට තමයි සිද්ධ වෙලා තියෙන්නේ. මේක ලොකු අවධානයකින් කටයුතු කළ යුතු දෙයක්. මණ්ඩලයක් පත් කරලා මේ කරුණු පිළිබඳව විශ්ලේෂණය කරලා බලලා මේවා පර්යේෂණ කරලා මේවාට නිසි විසඳුම් ලබාදීමේ වහාම ක්‍රියාත්මක කළ යුතු වැඩ පිළිවෙලක් අවශ්‍ය වෙනවා. මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට සඳහන් කළා අපි පළාත් සභාව විදිහට අපිට මේ ගැන කටයුතු කරන්න පුළුවන් ආකාරයට මොකද අපේ පළාත් සභාවට මේ නීති රීති වෙනස් කර ගැනීමේ පුළුවන්කමක් නෑ. නමුත් අපිට ඒකට සහාය ලබා දෙන්නට ක්‍රමවේදයක් තියෙනවා. අන්න ඒ නිසා ගරු සභාපතිතුමනි අපිට සඳහන් කරන්නට ඕනේ සම්ප්‍රදායික ක්‍රම වලින් මැණික් ගරන කොට සිදු වන හානිය අඩුයි. නමුත් යන්ත්‍රෝපකරණ නොයොදා විශාල වශයෙන් මැණික් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් රටට තියෙනවා. එහෙම නම් ඒ යන්ත්‍රෝපකරණ යොදා මැණික් ගැනීම පිළිබඳව සහ එසේ කිරීමේදී සිදු වන හානිය වලක්වා ගෙන කටයුතු කිරීම පිළිබඳව අපේ රජය අවධානය යොමු කිරීම අවශ්‍ය වෙනවා. ඒ නිසා මම නම් විශ්වාස කරන්නේ අපේ රජයේ බලධාරීන්ගේ වැඩි අවධානයක් යොමු විය යුතුයි. මැණික් ගැරීම පිළිබඳව. සම්ප්‍රදායික මැණික් ගැරීම ඒවගේම විශාල වශයෙන් යන්ත්‍රෝපරණ මගින් සිදු කරනු ලබන මැණික් ගැරීම පිළිබඳවත් ලොකු අවධානයක් ඒවා ක්‍රියාත්මක කිරීමත් නීති සම්පාදනයත් අවශ්‍ය වෙනවා. ජනතාව දැනුවත් නොකිරීම මැණික් සංස්ථාව මගින් මා විශ්වාස කරන විදිහට එක දුර්වල ස්ථානයක් හැටියට සඳහන් කරන්න පුළුවන්. බලපත්‍ර ලබා දෙන අය අඩු ගානේ මාස හයකට වරක්වත් කැඳවලා මාස තුනකට වරක්වත් කැඳවලා ඒ අය විසිනි අනුගමනය කළ යුතු වැඩ පිළිවෙල පිළිබඳව සඳහා මේ පිළිබඳව ලැබිල තියෙන පැමිණිලි ඒ අයට දැනුවත් කරලා එවා වලක්වා ගැනීමේ වැඩ පිළිවෙලක් තියෙනවා ද කියන එක නම් මට දැන ගන්න නෑ. මම මැණික් සංස්ථාවේ සභාපතිවරයා හැටියට කාලයක් කටයුතු කළා. කෙටි කාලයක්. ඒ කාලය තුළ මම මැණික් ගරන බලපත්‍ර ලබා ගත්ත අය

කැඳවලා ඒ අයව දැනුවත් කරලා අප වෙත ලැබිලා තියෙන පැමිණිලි පිළිබඳව ඒවා දැනුවත් කරලා ඒවා නොකරන්නට ඒවෙන් වගබලා ගන්නා විදිහට ඒ අයට උපදෙස් ලබාදීමේ මාලාවක් අපි සකස් කරලා තිබුණා. මම හිතනවා ඒවගේ වැඩ පිළිවෙලකුත් අපිට අවශ්‍ය වෙනවා. අපිට පරිසරය ආරක්ෂා කර ගන්න ඕනේ. ප්‍රධාන වශයෙන් අපේ පරිසරය ආරක්ෂා කරන රටේ ජනතාව ආරක්ෂා කරන්න විශාල වශයෙන්. ඒවගේම මැණික් සම්පත් බොහෝ රට වලට නැති විශාල ධනයක් උපයන්නට පුළුවන් අපේ රටට මේ දිස්ත්‍රික්කයට විශාල ධනයක් උපයන්නට පුළුවන් මැණික් කර්මාන්තය මීට වඩා නඟා සිටුවීමත් අවශ්‍ය වෙනවා. ඒවගේම වැඩි අවධානයක් යොමු විය යුතුයි කියා නැවත සඳහන් කරමින් මා සඳහන් කරන්නට ඕනේ අපි බලධාරීන්ගේ අවධානය යොමු කරන ගමන් මේ පිළිබඳව යෙදෙන ක්‍රියා කරන නිළධාරීන් පිළිබඳවත් ඒවගේම පොලිසිය පිළිබඳවත් අපි දැනුම් දෙන්න ඕනේ සංස්ථාව මගින් මැණික් හා ස්වර්ණාභරන අධිකාරිය මගින් රජය මගින් ඒ අයත් නිරතුරුවම දැනුවත් කරන්න ඕනේ ඒ අයගේ රාජකාරී කටයුතු ඉටු කරන කොට සිදු වෙලා තියෙන වැරදි තියෙනවා නම් ඒ පිළිබඳව. ඒවගේම ලැබිලා තියෙන චෝදනා තියෙනවා නම් ඒ නිළධාරීන් පොලීසියේ නිළධාරීන් දැනුවත් කරලා ඒ අයට ඒවෙන් වැළකී කටයුතු කරන්නට නිසි මාර්ග සහ දිය යුතුව තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි මම ස්තූතිවන්ත වෙනවා සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාමත් වැදගත් යෝජනාවක් ඒ යෝජනාව අපි නැවත නැවත මේ සභාවේ කතා කිරීමටත් වඩා අපි සඳහන් කරන්නට ඕනේ ඒ පිළිබඳව මධ්‍යම රජය මගින් නිසි බලධාරීන් විසින් අවශ්‍ය කරන ක්‍රියාමාර්ග අරගෙන නිති සම්පාදනය කරලා මීට වඩා ක්‍රමවත් වැඩ පිළිවෙලක් මැණික් ගැරීමේ සම්ප්‍රදායක් සහ යන්ත්‍රෝපකරණ යොදා මැණික් ගැරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව අපේ ඉඩම් පරිහනරය පිළිබඳ ඒ සැලැස්මේ තිබෙන අඩුපාඩුකම් පිළිබඳව අපි පාරවල් කපන කොට අපි ගොඩනැගිලි තනන කොට ඒ අපේ භූගත සම්පත් යට වෙලා යන අවස්ථාත් තියෙනවා. ඒ නිසා ඒවා පිළිබඳවත් අපි සැලසුම් සකස් කල යුතුයි. අපි පුළුල් වැඩ පිළිවෙලක් අපිට මේ කාරණය පිළිබඳව රජය දැඩි අවධනායක් යොමු කරන්නට වෙනවා කටයුතු කළ යුතුයි. මැණික් හා ස්වර්ණාභරන අධිකාරියටත් ඒවගේම මැණික් හා පර්යේෂණ පුහුණු අධිකාරියටත් තිබෙන බලතල ක්‍රියාත්මක කරලා නිවැරදිව ක්‍රියාත්මක කරලා අවංකව ක්‍රියාත්මක කරලා කටයුතු කළොත් මේවෙන් වැලකිලා අපේ රටේ පරිසරයත් ආරක්ෂා කරගෙන විශාල ධනයක් උපයන්නත් පුළුවන්කම තියෙනවා කියන එකත් මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

----------------------------------------------------------

ස්තූතියි ගරු සභානායකතුමනි. මීළගට අජිත් කුමාර මැද්දෙගම මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

----------------------------------------------------------

ගරු සභාපතිතුමනි සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ඉතාමත් වැදගත් යෝජනාවක්. එතුමා මැණික් ගැරීම සම්බන්ධව වගේම පරිසරය සම්බන්ධවත් මූලිකත්වය දීලා තියෙනවා මේ යෝජනාවේ. ඉතාමත් වැදගත්. එතුමා දෙපැත්ත කැපෙන ආයුධයක් තමයි පාරට දාලා තියෙන්නේ. මොකද මැණික් මට මතකයි අපේ පළාත් සභාවේ එක්තරා

අවස්ථාවක පළාත් සභා මන්ත්‍රීවරයෙක් කිව්වා අම්මගේ බඩේ තිබ්බත් මැණික් අපි ගරනවා කියලා. ඒ තරම් මැණික් වැදගත් කියලා. ඒවගේම එක්තරා රාජ්‍ය උසස් නිළධාරීයෙකුට නිලන්ත මන්ත්‍රීතුමාගේ ගම පැත්තේ අසරණ මනුස්සයෙකුගේ ඉඩමක් කඩ කඩ දොළුත් එක්ක සම්බන්ධ කරගෙන මැණික් ගරන කොට ඒ පිළිබඳව මම කතා කළහම ඒ නිළධාරියා මගේන් අහපු ප්‍රශ්නය තමයි සබරගමුවේ සංස්කෘතිය මොකක්ද කියලා. අපේ සබරගමුවේ සංස්කෘතිය කිව්වහම නොයෙක් නොයෙක් දේවල් තියෙනවානේ. එතුමා කිව්වා ඔබතුමා දන්නෙ නෑ මොකක්ද සංස්කෘතිය කියලා. සබරගමුවේ සංස්කෘතිය තමයි මැණික්. අපි දීර්ග වශයෙන් කල්පනා කළොත් ඒක ඇත්ත. සංස්කෘතිය වෙනස් වෙනවා. මැණික් ආර්ථිකයත් එක්ක මිනිස්සුන්ට මිළ මුදල් ලැබීම සහ අනිකුත් සංස්කෘතිය දේවල් අපිට එකතු වෙනවා. ඒවා කාලයත් තියෙන කොට සංස්කෘතිය අංග බවට පත් වෙනවා. ඒක හරි. ඒක තමයි ගරු සභාපතිතුමනි ඇත්ත. සබරගමුවේ සංස්කෘතිය මැණික් කියලා තියෙද්දී පරිසරයත් රැක ගෙන මැණික් ගරන්නේ කොහොමද කියලා ඉතාම අපහසු කාරණයක්. ඒකයි මම කිව්වේ ඔබතුමා දෙපැත්ත කැපෙන අයුධයක් තමයි මේ වෙලාවේ සභාවට ඉදිරිපත් කළේ. අපේ ඉෆ්ලාර් මන්ත්‍රීතුමා කිව්වා වගේම සමාජයෙන් ඔබට දොස් සහ ඔබට ගුණ ඇති වෙයි මේ යෝජනාව අනුව.

ගරු සභාපතිතුමනි මැණික් කියන්නේ අපේ දිස්ත්‍රික්කයේ තියෙන සම්පතක්. අපේ නමත් රුවන්පුරය. හැබැයි අපිට තාම බැරි වෙලා තියෙනවා ඒ මැණික් සම්පත විද්‍යානුකූලව කාටත් බෙදලා යන්න පුළුවන් විදිහේ ක්‍රමවේදයක් තුළ මේ මැණික් සම්පත ගොඩට අරගෙන අවශ්‍ය මිළ අපිට ඒ සඳහා ලබා දෙන්න. අපේ නිලන්ත මන්ත්‍රීතුමා කිව්වා දලන් කැල්ලක් අරගෙන කවුරු හරි පොහොසත් වෙච්චි යුගයක් පහුගිය ඒ කාලයේ තිබුණා කියලා. හැබැයි දලන් කියලා වයිරෝඩ් කැල්ලක් හරි පසින්ගල් කැල්ලක් හරි ගත්ත එක්කෙනා තමයි එහෙම පොහොසත් වෙන්නේ. විකුණන එක්කෙනා දළමට වික්කට පසින්ගලයක් තිබ්බොත් තමයි එයාට සල්ලි හම්බ වෙන්නේ. එහෙම තමයි පොහොසත් වුනේ. ඒ කියන්නේ මැණික් කියන දේ පිළිබඳව අද වටිනාකම ,තක්සේරුව, එහි තියෙන ගුණාත්මකභාවය ඒකේ තියෙන දෘඩතාවය පිළිබඳ විද්‍යානුකූලව දන්න තියෙන ප්‍රමාණය ඉගෙන ගත්ත ප්‍රමාණය මිනිස්සුන්ගේ බොහොම අවම මට්ටමක තියෙන්නේ. ඒ නිසා මේ මැණික මෙච්චරයි වටින්නේ කියලා කියන්න බෑ. ඒක එක එක්කෙනාට සාපේක්ෂව වැඩි වෙනවා. ඒ නිසා අපිට කියන්න බෑ පරිසර හානිය නොවන විදිහට මැණික් ගරන්නේ කොහොමද කියන එක ගැන හරි අමාරු ප්‍රශ්නයක්. මේක කථිකාවතක් ඇති වෙන්න ඕන කාරණාවක්. කොහොමද අපි පරිසර හනියක් නොවන කහවත්ත ප්‍රදේශයේ ගඟ ගත්තහම ඒ කාලයේ ගඟ අඩි 25 ක් 30 ක් තියෙන්න ඇති. අද අඩි 250 ක් 300 ක් තියෙනවා. මේ ඊයේ පෙරේදා ගලලා නෙමෙයි මේ අවුරුදු ගාණක් තිස්සේ අරවා මෙයාගේ අරවා අහවලාගේ කියලා කියනවා හොඳට. සමහර වතු පිටින් සමහරු බලහත්කාරයෙන් අවි ආයුධ තියාගෙන අරන් ගිය යුගවල් තිබුණා. පරිසරය පැත්තක තියාගෙන ඉල්ලන් ගොඩ තමයි ප්‍රධාන දේ වුනේ. අපේ අසෝක ජයවර්ධන මැතිතුමා මතක් කලා වගේ එතුමා මැණික් සංස්ථාවේ හිටපු සභාපතිවරයෙක් හැටියට සමහර ගොඩනැගිලි සමහර පාරවල් වලට යට වෙලා තියෙනවා අපේ මේ සම්පත. සමහර වෙලාවට මිළ කළ නොහැකි ආර්ථික වටිනාකමක් තියෙන සම්පත් අපේ රටට අපේ ගොඩට මුදල් ගලා ගෙන එන ක්‍රමයක් අපි මේ මිහිදන් කරලා තියෙන්නේ. සමහර ජලාශ යට කරගෙන තියෙනවා. රත්නපුර දිසාපති කාර්යාලයේ යටත් තියෙන්න පුළුවන්. මේ යටත් තියෙන්න පුළුන්. හැබැයි මේ අපේ සම්පතක් ජාතික සම්පතක් හැටියට

තියෙන විශ්වාසය උඩ ඉඳගෙන අපේ සලිත මන්ත්‍රීතුමා මතක් කළා වගේ පරිසරයටත් හානියත් අවම කරගෙන වෙන්නේ නෑ කියලා කියන්න බෑ. අවම කරගෙන මේ සම්පත් අරගෙන තමයි මේ දේවල් ඉදි කරන්න ඕනේ කියන එක විශ්වාසයි. අපිට මතක් එක පළාත් සභා දවසක යෝජනාවක් ගෙනාවා අපේ දිවංගත අපේ ඇමතිතුමෙක්ගේ පියා. ඔබතුමාගේ මාමණ්ඩි. කහවත්තේ හට්ටන්ගේ පාර ඒ පාරේ මැණික් ටික ගැරුවට පස්සේ පාර හදන්න කියනවා. නැත්නම් කොච්චර පාර හැදුවත් වැඩක් නෑ අර පල්ලෙහායින් හෝදා යනවා. පාර හදලා ඉවර කරන්නත් බෑ. මේ මැණික් ටික ගරලා දුන්නට පස්සේ පාර හැදුවා නම් හොඳයි. ඒක හරි වටිනවා. අපේ සම්පතක්නේ. එවැනි ක්‍රමවේදයක් ක්‍රියාත්මක වෙනවා නම් මේක වටිනවා. හැබැයි මේක ජාතික ආණ්ඩුවට අයිති ප්‍රශ්නයක්. හැබැයි අපිට සෘජුවම බලපාන ප්‍රශ්නයක් අපේ පළාත් සභාවට. ඒක නිසා අපි මැදිහත්කරුවෝ හැටියට සුදුසු යෝජනා ක්‍රමවේදයක් කරීකාවතක් සිදු විය යුතුයි කියන එක තමයි මගේ අදහස.

ඒවගේම දැන් අපේ මන්ත්‍රීතුමාගේ යෝජනාව අනුවම ඇත්ත කතා කරනවා නම්. දැන් පරිසරයටත් හානියක් නොවන විදිහට. ඒවගේම යන්ත්‍ර සූත්‍ර වැඩි වශයෙන් භාවිතා නොකර කටයුතු කරනවා නම් දුප්පත් මනුස්සයාටත් අමාරුයි මේ වැඩේට අත ගහන්න. මට මතකයි දැනට අවුරුදු 30 කට පමණ පෙර නියාමක පතල් ක්‍රමයක් තිබුණා දුප්පත් අයත් එකතු කරගෙන සමිතියක් හදලා මැණික් සංස්ථාවෙන් ගරනවා නෙමෙයි. ඒ සමිතිය හරහාම මැණික ගරන ව්‍යාපාරයක් තිබුණා. ඒ අයටම අපිට ඒ සම්පත ටික දෙන්න පුළුවන්. එවැනි ක්‍රමවේදයක් පරිසරයට හානියක් නොවන විදිහට අපේ අසෝක ජයවර්ධන මැතිතුමා කිව්වා විදිහට තාක්ෂණ ආයතනවල උපදෙස් හා මඟ පෙන්වීම යටතේ පරිසර හානිය අවම කරගෙන එම සංවිධාත්මකව මැණික් සම්පත වෙළඳ පොළට ගෙන ඒමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනවා නම් මං හිතන්නේ සාමාන්‍ය ජනතාවටත් මේක බෙදිලා යන විදිහට ක්‍රමවේදයක් වෙයි. ඒ නිසා අපි විශ්වාස කරනවා සලිත මන්ත්‍රීතුමාගේ යෝජනාව නැවත සංශෝධනය කරන්න හරි එතුමාට පොඩි වචන දෙකක් හරි සිද්ධ වුනේ කාගේ හරි බලපෑමක් වෙන්න ඇති මේ වචන දෙකට බලපානවා කියලා . ඇත්ත මේක ඉතාම අපහසුවෙන් තමයි මේ යෝජනාව ගේන්න ඇත්තේ. අපි ස්තුතිවන්ත වෙනවා අත්‍යාවශ්‍යයි මැණික් ගැරීම සබරගමුවට. අත්‍යාවශ්‍යයි අපේ රටට පරිසරය ආරක්ෂා කර ගැනීමට.

ඒ නිසා ඒ දෙක සංකලනය කරගෙන කොහොමද හානියක් වෙන විදිහට මේ කටයුතු කරන්නේ කියලා කරීකාවතක් ඇති කරගෙන අපි යෝජනාවක් සකස් කරන්න ඕනේ ගරු සභාපතිතුමනි මේ මූලික කරගෙන රජයට ඉදිරිපත් කළ යුතුයි කියන දේ මගේ අදහසක් හැටියට මතක් කරමින් ඔබතුමාට කාලය ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-------------------------------------------------------

ස්තුතිවන්ත වෙනවා ගරු අජිත් කුමාර මැද්දෙගම මන්ත්‍රීතුමාට. මීළඟට ගරු අජිත් ශාමින්ද මන්ත්‍රීතුමාට.

***ගරු මන්ත්‍රී අජිත් ශාමින්ද***
***கௌரவ உறுப்பினர் அஜித் ஷாமின்த***
*Hon.Member Ajith Shyaminda*

---------------------------------------------------------

ගරු සභාපතිතුමනි සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව පිළිබඳව මමත් යම් දෙයක් කියන්න බලාපොරොත්තු වෙන්නේ. විශේෂයෙන් අජිත් කුමාර මන්ත්‍රීතුමා පැහැදිලි කළා වගේම මැණික් කර්මාන්තය අපේ පළාතට අවේනික කර්මාන්තයක්. අපි දන්නවා මේ කර්මාන්තය ආරක්ෂා කරගෙන ඉන්න හින්දා තමයි මැණික් සංස්ථාවත් ඒ කාලයේ පිහිටෙව්වේ ආචාර්ය එන්.එම්.පෙරේරා මැතිතුමාගේ සංකල්පයක් අනුව. එදා එතුමා මේ සංකල්පයක් අනුව එතුමා ඉදිරිපත් කළේ මේ අයාලයේ යන කර්මාන්තයකගෙන් මේ රටට හොඳ ආදායමක් ලබා ගැනීමත් එක ක්‍රමවේදයකට අනුව මැණික් අපනයනය සහ මැණික් ගැරීම ක්‍රමවේදයකට සිදු කිරීම. දැන් අපි දන්නවා ප්‍රායෝගිකව යම් අපේක්ෂා ඇතැම් විට ගිලිහිලා තියෙනවා කියලා අපිට පෙන්වා ගරු සභාපතිතුමනි. දැන් නිලන්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වගේම සීතාවක ගඟේ මැණික් ගැරීම කැපීම් කටයුතු මම දන්නවා මගේ ගේ ළඟ තමයි ඒ කටයුතු කෙරෙන්නේ. ලොකු ප්‍රසිද්ධියක් තියෙනවා එතන මැණික් නිදියක් තියෙනවා කියලා. රටේ තියෙන විශාල මැණික් නිදියක් එතන තියෙනවා කියලා පසුගිය කාලයේත් එක නොයෙකුත් අන්දමට මැණික් ගත්තා. දැන් මේ වනවිට මැණික් සංස්ථාව මගින් තමයි ගන්නේ. මොකද ඒකේ කොටස් වලින් 99% ක්ම සංස්ථාව නියාමන ක්‍රමයට කියලා ඒ කිම්දුන් කට්ටිය භාර අරගෙන තිබුණට එගොල්ලන්ට ගරු සභාපතිතුමනි සියයට දශම ගාණක් තමයි හම්බ වෙන්නේ. ඒ කියන්නේ සාමාන්‍ය මිනිහාට ඒකෙන් වරප්‍රසාදයක් ලැබෙන්නේ නෑ. කුළියක් තමයි දෙන්නේ දෛනික වැටුපක් වගේ රු.3000/- ක් වගේ ඒක බලා ගන්න ක්‍රමයක් වගේ බලා ගන්න අයටත් යම් නියාමන ක්‍රමයකට යම් සේවයක් අරන් තියෙනවා. ඒගොල්ලන්ටත් කුළියක් දෙන්නේ. මේකේ ආදායම තනිකරම මුදවා ගත්ත නැති ප්‍රදේශයේ තියෙන කැම්ප් එකක් වගේ තමයි තියෙන්නේ. එස්.ඩී.එෆ්. එක දාලා. ඒ යන කට්ටිය ලොකු විදිහට පරීක්ෂා කරලා දැඩි ආරක්ෂාවක් දාලා එස්.ඩී.එෆ්.එකෙන් දාලා තමයි ඒ කටයුතු කරන්නේ. අපි කමක් නෑ ඒ ආරක්ෂාව දැම්මට. මෙතන තියෙන ප්‍රශ්නය ගරු සභාපතිතුමනි මේක මීට වඩා ලිහිල් වෙන්න ඕනේ. මේක ජනතාවට සංස්ථාවෙන් එක්කෝ මේක වෙන්දේසි කළා නම් එක්කෝ ටෙන්ඩර් දැම්මා නම් එක්කෝ ඒ නියාමන ක්‍රමයට ගත්තා නම් ඒගොල්ලන්ටත් සැලකිය යුතු මුදලක් ලැබෙන විදිහට දශම ගාණක් නෙමෙයි අඩුම ගානේ 1% හේ 2% ලැබෙන්න ගත්තා නම් යම් සාධාරණයක් තියෙනවා. ඒවගේම තමයි අපි දන්නවා සීතාවක සහ කැළණි ගඟේ අපේ පළාතේ පහුගිය කාලයේ විශාල ලෙස ලෙස අනවසර මැණික් ගැරීම් කළා. සීතාවක ගඟේ අද වෙන කොටත් අනවසර මැණික් ගැරීම් කරනවා. පොලීසිය දවස් දෙකකට සැරයක් ගිහිල්ලා වැටලීම් කරනවා. ඒ වැටී අරවා මේවා කපලා දානවා. කැළණි ගඟේත් ඒහා සමානව කෙරෙනවා. කවදාකවත් අපි දන්න කාලයක ඒක වෙන්දේසි කළේ නෑ. අපි දන්නවා පහුගිය කාලවල්වල නම් අවුරුදු දෙකට තුනකට සැරයක් මේ ගංගා කැළණි ගඟ දුන්නේ නෑ. සීතාවක ගඟ ,ගඟ මැද මැණික් ගැරීමට මේ කලු ගඟ හා වෙනත් ගංගා වෙන්දේසි කළා. ඒ එක්ක යම් වෙන්දේසි වලින් කට්ටිය අරගෙන යම් ආදායමක් සහ මුදල් දීලා තමයි ගන්නේ. දැන් මේ වෙන කොට ඒ වෙන්දේසි නොකිරීම නිසා තනිකරම අනවසර මැණික් ගැරීමක් පමණයි වෙන්නේ මේ වෙන කොට දැන් මැණික් ගැරීම හැමදාම ගරනවා. ආණ්ඩුවට ආදායමකුත් නෑ. ඒකෙන් අතරමැදියෝ තමයි පෙලක් පොලිස් නිළධාරීන් ගියහම නීතිය අකුරට කෙරෙනවා. පෙළක් පොලිස් නිළධාරින් ගියහම යම් මොනවා හරි අරගෙන ඒගොල්ලෝ ආපහු එනවා. මේ දේ

කෙරෙනවා. මේක මං කියන්න බලාපොරොත්තු වුණේ ගරු සභාපතිතුමනි අර පහුගිය කාලවල්වල වගේ වාර්ෂිකව හරි වර්ෂ දෙකකට සැරයක් හරි වෙන්දේසි ක්‍රමයකට ඒවා දුන්නා නම් එක පැත්තකින් සංස්ථාවට රජයට ආදායමක් එනවා. ඒක ක්‍රමානුකූලව කෙරෙනවා. මේ නොදීම නිසා කිසිම ආණ්ඩුවට ආදායමකුත් නෑ. ඒ ජනතාවටත් එතන ගහ ගැනීම් රණ්ඩුවීම් වල කපා ගැනීම් අවුරුද්දකට එකක් දෙකක් සිදු වෙනවා. ඒ නිසා මේ සංස්ථාව කටයුතු කරන ආකාරය ගැන සෑහීමට පත් වෙන්න බෑ. අපි ඉල්ලා සිටින්නේ ගරු සභාපතිතුමනි පළාත් සභා අපි දකිනවා අපේ සභානායකතුමා කියනවා වගේ මේ මාස තුනකට හතරකට සැරයක් අපේ මන්ත්‍රීතුමන්ලා මේ මැණික් කර්මාන්තය ගැන මේ ගරු සභාවේ කතා කරනවා. සංස්ථාවේ නිළධාරීන් ,ඉහළ නිළධාරීන් දවසක් කළා වගේ මේ ස්ථානයට කැඳවලා අපිට සාකච්ඡාවක් අපේ මන්ත්‍රීවරුන්ගේත් අදහස් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ අදහස් ඉතා වැදගත් වෙනවා. මොකද ඒ අය කටයුතු කරන්නේ මේ පළාත් සභාව ගැන කිසිම තැකීමකින් තොරව තමයි ඒ සංස්ථාවේ සභාපතිතුමා ඇතුළු ඒ කාර්යය මණ්ඩලය කටයුතු කරන්නේ.

ඒ නිසා සෘජුවම අපේ පළාත් සභාවේ දැවෙන ප්‍රශ්නයක් නිසා මේකට මැදිහත්වීම අවශ්‍ය වෙනවා. ඒ ගැන පැහැදිලි කරමින් ඒවගේම තමයි සලිත මන්ත්‍රීතුමා මේ යෝජනාවෙන් ප්‍රකාශ කර සිටින්නේ මේ බලපත්‍ර ගැනීම මීට වඩා සරල ආකාරයකට කරල දෙන්න කියලා. අපි දන්නවා ගරු සභාපතිතුමනි බැංකුවකට ගියත් අනිකුත් බලපත්‍රයක් ගත්තත් හැම දේම ලිහිල් කරලා තියෙන්නේ. ජනතාවට දැන් මේක ලේසියෙන් කර ගන්න පුළුවන් තත්ත්වයක් හදලා තියෙන්නේ. සංස්ථාවේ පමණයි මේක එන්න එන්න අමාරු කරලා තියෙන්නේ. ඒකෙන් යමක් පැහැදිලි වෙනවා දුප්පත් කෙනෙකුට යමක් කර ගන්න බැරි කෙනෙකුට තමන්ගේ ඉඩමේ ලයිසන් එකක් ගන්න බෑ. ඒක එයාට වෙනවා වෙන කෙනෙකුට දීලා මුදලාලි කෙනෙකුට හරි පුළුවන් කෙනෙකුට දීලා කීයක් හරි දීලා බලා ගෙන ඉන්න. මේවා ඉතාම සරල ක්‍රමයකට තිබුණා නම් ඒගොල්ලන්ටම ගිහිල්ලා බලපත්‍රයක් අරගෙන කරන්න පුළුවන් වෙනවා. ඒ නිසා මේ ක්‍රම මම අර මුලදී කිව්වා වගේ සංස්ථාව ආරම්භ කරන අවස්ථාවේ ඒ නායකයින්ගේ තිබුණ සංකල්ප නෙමෙයි දැන් ක්‍රියාත්මක වෙන්නේ. දැන් එක එක්කෙනාගේ න්‍යාය පත්‍රය අනුව පුද්ගලික වාසි වරප්‍රසාද වෙනුවෙන් තමයි මේ කටයුතු කරන්නේ. ඒ නිසා මම මීට වඩා කාලය ගන්න බලාපොරොත්තු වෙන්නේ නෑ. නැවත වතාවක් මම ඉල්ලා සිටින්නේ ගරු සභාපතිතුමනි මේ අවුරුද්ද ඉවර වෙලා හරි ඒ සංස්ථාවේ සභාපතිතුමා ඒ නිළධාරිනුත් එක්ක අපේ මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් දෙන්න අපිට තියෙන ප්‍රශ්න මොකද මෙතන කතා කළාට හරි තොරතුරු ඒ අයට යන්නේත් නෑ. ඒ නිළධාරීයෙක් අපිට කැඳවා ගන්න අපිට බැරි වෙලා තියෙනවා. ඒ නිසා ඒ අවස්ථාවක් ලබා දෙන්න මැදිහත් වෙන්න කියලා නැවතත් මතක් කර සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ගරු අජිත් ශාමින්ද මන්ත්‍රීතුමා. මීළඟට ගරු නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*

------------------------------------------------------------

ගරු සභාපතිතුමනි සලිත මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ඉතාමත් ප්‍රායෝගික සහ අපේ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නෙමෙයි අපේ සබරගමු පළාතටම වටින යෝජනාවක්. අපේ මැණික්වල ඉතිහාසය ගරු සභාපතිතුමනි බැලුවහම බුදුහාමුදුරුවෝ ඉන්න සමයේත් අපේ රටේ මැණික් පුටුවට ආරවුලක් වෙලා කැළණියේ අපේ විහාරස්ථානයේ නිදන් කරලා තියෙන්නේ අපේ මැණික් පුටුවක්. ඉතිහාසයේ ලංකාවේ මැණික් පිළිබඳව එච්චර කාලයකට ගිහිල්ලා තියෙනවා. අද ගරු සභාපතිතුමනි මෙච්චර ඉතිහාසයක ඉඳලා අද 2016 අවුරුද්ද දක්වා මේ මැණික් කර්මාන්තය කරගෙන ආවේ සාමාන්‍ය භූගත පොළොවේ සහ ගංගා ඇළ දොළ. ගංගා ඇළ දොලවල මැණික් කර්මාන්තයේ යෙදිලා සිටින්නේ ගංගා ඇල දොළ දෙපැත්තේ ඉන්න ජනතාව. ගගේ ඉවුරුවල සහ ගඟ ආශ්‍රිතව ඉන්න ජනතාව ඒ අයගේ යැපුම් කර්මාන්තය හැටියට තිබෙන්නේ මේ ගඟේ තිබෙන වැලි පොඩ්ඩක් ගරලා මැණික් කැටයක් හොයා ගෙන ඒකෙන් ජීවත් වෙන ක්‍රමවේදය තමයි අපේ ඉතිහාසය පුරාම රත්නපුර දිස්ත්‍රික්කයේ තිබෙන්නේ. සමනළ කන්දේ ඉඳලා එන කළු ගඟ ගම්මාන වලට ආරම්භ වෙන ගිලීමලේ උඩහා රත්ගඟ ප්‍රදේශයේ ඉඳලා මේ පැත්තෙන් ඉංගිරියට මායිම්ව යන ගඟ මැද මැණික් කර්මාන්තයේ යෙදුණා. ගගේ තියෙන වැලි පොඩ්ඩක් ගරලා ඇඳුම් උදැල්ලකින් ඇඳලා මැණික් කැටයක් හොයා ගෙන තමන්ගේ ආර්ථිකය සරිකර ගත්ත ජනතාව ලක්ෂ සංඛ්‍යාත සහ විශාල ජනතාවක්. අද මේකට මොකද වෙලා තියෙන්නේ ගරු සභාපතිතුමනි අද ගඟට බැහැලා ගඟේ මැණික් ගරා ගන්නට බෑ. මම කියපු රත්ගඟ ප්‍රදේශයේ ඉඳලා රත්නපුර ආසන්න මායිමේ ඉඳලා බැලුවහම ගරු සභාපතිතුමනි ඇඳුම් පතල් තියෙනවා දාහකට වැඩියි. ඇඳුම් පතල් කර්මාන්තයේ යෙදෙන ඇඳුම් පතල් වලවල් මේ ඇඳුම් පතලක හය දෙනෙක් වැඩ කළා නම් හය දාහක් මේ ගගේ රත්නපුර නගරයේ සහ රත්නපුර අවට පතල් කර්මාන්තයේ යෙදිලා ඉන්නවා. ඒ අයගේ යැපුම් පවුලක් පස්දෙනෙක් හිටියොත් තිස් දාහක වැඩි ප්‍රමාණයක ජනතාව ජීවත් වුණේ නගරයේ සහ රත්නපුර ප්‍රදේශය අවට තිස් දාහකට වැඩි ප්‍රමාණයක් මේ පතල් වලින් යැපිලා තමන්ගේ ජීවිතය සරිකර ගත්තා. මේ ඊයේ පෙරේදා වෙන කොට ඕනේ නම් ගණන් කරලා බැලුව හැකි ගරු සභාපතිතුමනි රත්නපුර දේවාලයට එහා පැත්තේ පොලීපිටියේ ඉඳලා මේ පල්ලෙහා ගඟ ගාවට බැලුවහම හරියට ඇඳුම් වලවල් පන්සීයක් තියෙනවා ඕන කෙනෙකුට ගිහිල්ලා ගණන් කරන්න කියන්න. ඒ නිසා මෙච්චර කාලයක් මේ ගගේ ඇඳුම් වලවල් දැම්ම කියලා කිසිම වෙලාවක ගඟ නැති වෙලා නෑ. සිරිපාල මන්ත්‍රීතුමා ගඟ මුහුදක් වෙයි. දැන් අවුරුදු පන්දාහක හයදාහක තිස්සේ මේ ගගේ වැලි ගැරුවා. හැබැයි ගඟට කිසිම හානියක් වෙලා නෑ. ගඟ එක කාලයකට එක පැත්තක් ගොඩ වෙනවා. තව කාලයක් යන කොට අනිත් ඉවුර ගොඩ වෙනවා . මේක තමයි අපේ සම්ප්‍රදායික කර්මාන්තයේ හැටි.

ඒ නිසා මම කියන්නේ අද ගඟට බැහැලා මැණික් කැටයක් ගරන්නට යන අහිංසක කම්කරුවා අහිංසක දුප්පත් මනුස්සයා ඔහුට උදැල්ලක් අරගෙන ගඟට බැස්සට පස්සේ එස්.ඩී.එෆ්.එකෙන් ඇවිල්ලා ඔහුව අරගෙන යනවා හිරේ. ඔහුට ගහනවා රු.50000/- ක දඩයක්. මෙහෙම ගැහුවහම අපේ සාම්ප්‍රදායික කර්මාන්තය ගගේ අයිතිය අපේ අයිතිය මැණික් කර්මාන්තයේ අයිතිය අපිට සම්පූර්ණයෙන් නැති වෙලා ජන ජීවිතය මහ ලොකු අවුලකට පත් වෙලා තිබෙනවා. පහුගිය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව සමයේත්

එස්.ඩී.එෆ්.එක මේ විදිහට ආවා. ඇවිල්ලා අල්ලන්න හදන කොට අපි මැදිහත් වෙලා ආරක්ෂ ලේකම්තුමාට කිව්වා මේ ගගේ වැඩ කරන ඉවුරට හානියක් නොකර ගගේ වැලි ටික ගරලා ආයේ වැලි ටික ගඟට දාන මැණික් කැටේ අතට ගන්න ඒ අහිංසක ජනතාවට හානියක් කරන්න එපා කිව්වහම ඒ ආරක්ෂක ලේකම්තුමා වහාම එස්.ඩී.එෆ්. එක අයින් කර ගත්තා. හැබැයි මේ ආණ්ඩුව ආවට පස්සේ වර්තමාන රජය තාමත් පොලිසිය ඍජුවම ක්‍රියාත්මක කරගෙන යනවා. එස්.ඩී.එෆ්.එක නැවතත් කරගෙන යනවා. තාම එනවා. මම වගකීමකින් කියනවා. දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටුවේ ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා තින්දුවක් ගත්තා හැමෝටම ඔන්න ගඟට බැහැලා වැඩ කරන්න පුළුවන් කියලා තීන්දුවක් අර ගත්තා දේශපාලන අධිකාරිය සහ මැණික් සංස්ථාව ඉන්න ඉස්සරහා. පහුවදා උදේ පාන්දර කුරුවිට ගෝනපිටියේ ඇල්ලුවා පතල් හතරක්. එල්ලාවල ඇල්ලුවා පතල් දොළහක්. ඒ තීන්දුව ගත්ත දාට පහුවදාම. එදා ඉඳලා කිසිම කෙනෙක් බහින්නේ නෑ ගඟට. මේක සත්‍ය කතාවක්. පස්සේ මම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමාට කතා කරලා ඇහුවා මොකද ඔබතුමන්ලා මේ තීන්දුව ගැන කියන්නේ. හැබැයි සම්බන්ධීකරණ කමිටුවේ තීන්දුවක් ගත්තා වුණාට අපිට කිසිම ලිඛිත නිර්දේශයක් අපිට කිසිම තීරණයක් නීතියක් කියලා නෑ කටයුතු කරන්න කියලා. මම වගකීමෙන් කියන්නේ. එහෙම කියලා නෑ කාටවත්. හැබැයි එහෙම කරන්න බැරි වෙන්න පුළුවන්. හැබැයි ගගේ වැලි ටික ගරලා වැලි ටික ගඟට දාලා ආයේ මැණික් කැටේ අතට ගන්න කෙනාට ඒ අයිතිය තියෙනවා. ඒක පොලීසියට නැති කරන්නත් බෑ. දේශපාලඥයින්ට නැති කරන්නත් බෑ. ඒ නිසා මේක අද මේ ආණ්ඩුව ගත්ත සම්පූර්ණ වැරදි ක්‍රියාදාමයක්. අද වැසිකිලියට ගිහිල්ලා හොඳා ගන්න ගඟට බහින්න ගියත් උදැල්ල අතට ගත්ත මිනිහාත් අල්ලලා හිරේ දානවා. අද මේ තත්ත්වයට මේ ආණ්ඩුව සම්පූර්ණයෙන් වගකිව යුතුයි. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන ඔබතුමන්ලා මේ පිළිබඳව අත්‍යාවශ්‍යයෙන් කටයුතු කළ යුතුයි. ඔබතුමන්ලා නායකත්වය ගන්නේ නෑ. ඔබතුමන්ලා මඟ අරිනවා. සිංහල අවුරුදු සමය එන්නේ. හෙට අනිද්දා වෙන කොට අද හොරු වැඩි වෙලා. අද සුළු මැණික් ව්‍යාපාරිකයා මේසන් වැඩ කරනවා. වඩු වැඩ කරනවා. සේරම බිඳ වැටිලා. සමහරු කියනවා මේ ආණ්ඩුව පාලනය කරන මේ ආණ්ඩුවේ නායකයින්ගේ කන්දොස්කිරියාවද මං ඒ අයගේ චාන්ස් එක නැති හින්දද දන්නේ නෑ. අපිට මැණික් ගලක් හම්බ වෙන්නේ නෑ කියලා කියනවා. මෙහෙන් නීති දාලා තද කරනවා. මේක මැණික් කර්මාන්තයට මෑත ඉතිහාසයේ හඬපු ලොකුම කණ කොකා හඬපු කාලය තමයි මෙ කාලය. ඔවුන්ට බලපත්‍රයක් ගන්න බෑ. බලපත්‍රයේ ගාස්තු වැඩි කලා එක පැත්තකින්. සමාන්‍ය මිනිහාට බලපත්‍රය ගන්න බැරි වෙන තත්ත්වයට පත් කරලා තියෙනවා. ඒවගේම ඉඩම්වල නිරවුල්භාවය ගැන අවුරුදු දහයක පැටිකිරියේ ඉඳලා පටන් ගත්තා. මේගොල්ලෝ හදන්නේ මැණික් කර්මාන්තය සාමාන්‍ය ජනතාවගෙන් අයින් කරලා මහා පරිමාණයේ කොම්පැනි කාරයින්ට මේ ජාවාරම මේ මැණික් කර්මාන්තය දෙන්න තමයි හදන්නේ. ඒක තමයි ඔබතුමා නිහඬව ඉන්නේ. ඔබතුමාට පුළුවන් ගඟට බැහැලා මැණික් කැටයක් ගන්න අහිංසක ජනතාවට කතා කරලා ඒ අවශ්‍ය නායකත්වය දෙන්න. පියවර ගන්න. අද පොලීසියෙන් ඇවිල්ලා අල්ලගෙන යන කොට ඔබතුමන්ලා කවුරුවත් කතා කරන්නේ නෑ. වැඩක් නෑ රත්නපුරේ ඉඳලා රත්නපුරේ මැණික් කර්මාන්තය අද සම්පූර්ණයෙන් බිඳ වැටිලා තියෙනවා.

ඒ නිසා මේකට නායකත්වය ගන්න පක්ෂ භේද වැඩක් නෑ. මේක අපේ කර්මාන්තය. මේක අපේ උරුමය. මේක අපේ අනාදිමත් කාලයේ ඉඳලා අපේ

තිබ්ච්ච් කර්මාන්තය. ඒ නිසා මේක වෙනුවෙන් අපි කතා කරන්නේ නැත්නම් මේ පළාත් සභාව මැදිහත් වෙන්නේ නැත්නම් අපිට අයිති කාරණාවක් නෙමෙයි. හැබැයි අපිට පුළුවන්කම තිබෙනවා ජනතාවත් එක්ක ගිහිල්ලා වැලි පොඩ්ඩක් ගරලා ඒ මැණික් කැටේ ගන්න කරන්න. හැබැයි ඉවුරු හානි කරනවා නම් ඒක වැරදියි.

ඒවගේම තමයි ගරු සභාපතිතුමනි බැකෝ පතල් කර්මාන්තය. අද මොකද මේ නීති වැඩි වෙලා තියෙන්නේ. සලිත මන්ත්‍රීතුමා යෝජනා කරලා තිබෙන්නේ . එතුමා කියනවා අද නීති වැඩියි. මේ නීති සරල කරන්න කියලා. ඇයි සරල කරන්න කියලා කියන හේතුව. ඒ රාජ්‍ය ආයතන වලට නීති දාන්න වෙලා තියෙනවා. අද බැකෝ පතල් පර්වස් දහයක කපන්න කියපුවහම බැකෝ පතල් කර්මාන්තයේ යෙදිලා ඉන්න කට්ටිය අක්කර දෙක තුනක් අල්ලගෙන ගහනවා දැන් අපේ පැත්තට වතුර නෑ. දවස් කීපයයි පැවුවේ අද වතුර නෑ. හැබැයි පතල් කර්මාන්තයට කණ කොකා හැඬලුවේ බැකෝ පතල් කර්මාන්තය ආවට පස්සේ. ඒකට පහුගිය කාලයේ හිටපු අයත් වගකියන්න ඕනේ. බැකෝ පතල් කර්මාන්තයට බලපත්‍ර දීපු අය සම්පූර්ණයෙන්ම වගකියන්න ඕනේ. ඒ නිසා මැණික් කර්මාන්තය එක්තරා කණ්ඩායමකගේ දෝතට පමණක් ඇවිල්ලා ගියා. සාමාන්‍ය ජනතාවගෙන් සුළු මැණික් කර්මාන්තකරුවාගෙන් ඒක ආපහු අරගෙන ගියා. ඒ නිසා බැකෝ පතල් කර්මාන්තය නවත්තනවා තියලා සම්බන්ධීකරණ කමිටුවේ තීන්දු ගත්තු අද පරිසර ඇමතිවරයාව ඉන්න අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට තාම බැරි වෙලා තියෙනවා මෙතන ඇවිල්ලා බොරු කියලා ගියා හැබැයි තාම බැරි වුණා එතුමාට මේක නවත්තන්න. එතුමා ව්‍යාපාරිකයන්ගේ අතකොළුවෙක් බවට පත් වෙලාද කියන කාරණාව. අපි අහනවා බය නැතුව මේ රටේ පරිසර ඇමතිවරයාව ඉන්න අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගෙන්. එහෙම නම් එදා එයා සම්බන්ධීකරණ කමිටුවට ඇවිල්ලා එතුමා ගත්ත තීන්දුව. බැකෝ පතල් නවත්තනවා කියලා කියලා දවස් පහක් හයක් හෙමින් සැරේ වැඬේ නතර කරලා සතියක් දෙකක් ව්‍යාපාරිකයෝ එකට එකතු වෙලා කිව්වට පස්සේ ඔන්න ආයේ දුන්නා. හැබැයි මේකෙන් වෙච්ච පරිසර හානිය. අලුතින් දෙන්නේ නෑ කියලා කියනවා. අලුතින් දෙන්නේ නෑ කියලා තියෙන ටික දීර්ඝ කරනවා. ඒකනේ කරන්නේ. ඕක තමයි වැඬේ. තලගොයා කබරගොයා කරලා කනවා. සමහරු මම පෙන්වන්නම් බැකෝ පතල් ලයිසන් නැතුව රත්නපුර දිස්ත්‍රික්කයේ බැකෝ පතල් කපනවා. මම වගකීමෙන් කියනවා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*

----------------------------------------

මන්ත්‍රීතුමාගෙන් එවැනි දෙයක් තියෙනවා නම් මෙතන ප්‍රකාශ කරනවාට වඩා මම කියනවා ඔබතුමා ලිඛිතව හරි කියනවා නම් පැහැදිලිවම ඒක අල්ලීමට කටයුතු කරන්න ඕනේ. නීති විරෝධී වැඩ. ඒ එක්කම ඔබතුමාට හොඳටම අයිතියක් තියෙනවා වන් වන් නයින් ගැහුවත්. මෙවැනි දේවල් අක්‍රමවත් දේවල් අපි නැවැත් විය යුතුයි. කවුරු කළත්. ඔබතුමා කරන්නේත් නෑ. අපි කරන්නේත් නෑ. එහෙම නම් කවුරු හරි පුද්ගලයෙන් බලය අතර අරන් කරනවා නම් අපි පැහැදිලිවම දන්නවා නම් මේක නතර කිරීම ඉතාමත් වැදගත්. මම ඉල්ලීමක් කරනවා ලිඛිතව පොලීසියට, මැණික් හා ස්වර්ණාභරන අධිකාරියට අතිගරු ජනාධිපතිතුමාට හෝ ඔබතුමාගේ

නායකයාට හෝ මේක දැනුවත් කරන්න. එහෙම නැත්නම් අපිට කියන්න. පුළුවන් නම් 119 හරි ගහලා ඉක්මනින්ම අත්අඩංගුවට ගන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*

----------------------------------------------------------

ලිඛිතව අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත් මැණික් සංස්ථාවේ සභාපතිතුමාටත් ලිඛිතව ලියුම් යවලා ඒවාට පිටපතකුත් ආයේ මට එවලා තියෙනවා. හැබැයි ලයිසන් නැතුව පතල් කපන කට්ටිය කපනවා. ඉෆ්ලාර් මන්ත්‍රීතුමා වගකීම භාර ගන්නවා නම් ලිඛිතව මම දෙන්නම්. ඔයාටත් කරන්න පුළුවන් දෙයක් නෑ මේ ආණ්ඩුවේ. පුළුවන් නම් ගමේ මිනිහාට මැණික් කැටයක් ගරන්න කියලා කියන්න.

ලිඛිතව මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට නම් ටිකයි ස්ථානත් එක්කලා බැකෝ පතල් ලයිසන් නැතුව කපන වණ්ඩින්ගේ නම් ටික දාලා ඇරියා. උත්තර ඇවිල්ලා තියෙනවා. හැබැයි ඒගොල්ලෝ පතල් කපනවා. ඔබගේ ලිපිය ලැබුණා. ඒ ලිපිය මම යොමු කළා මැණික් සංස්ථාවේ සභාපතිට. මෙන්න ඔබතුමාගේ පිටපත. පිටපත ඇවිල්ලා තියෙනවා. (ගරු සභාපතිතුමාගේ නියමය පරිදි හැන්සාඩ් එකෙන් ඉවත් කරන ලදී.)

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

----------------------------------------------------------

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන් කතාව නතර කරන්න.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*

----------------------------------------------------------

ගරු සභාපතිතුමනි මට අවස්ථාව දෙන්න මම කිව්වේ පරිසර ඇමතිට. (ගරු සභාපතිතුමාගේ නියමය පරිදි හැන්සාඩ් එකෙන් ඉවත් කරන ලදී.)

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***
*Hon.Member Nihal Farook*

--------------------------------------------

අතිගරු ජනාධිපතිතුමා නමින් කියපු දේවල් හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

----------------------------------------------------------

මෙතුමා රීති ප්‍රශ්නයක් මතු කරනවා. ජනාධිපතිතුමා නමින් තියෙන ඒවා හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න. කතාව අවසන් කරන්න.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***

*Hon.Member Naminda Anurapriya*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි සම්බන්ධීකරණ කමිටුවේ ගත්ත තීන්දු ගැන මම කතා කළේ. තීන්දුවක් ගත්තා. ඒ තීන්දුව එතුමා ක්‍රියාත්මක කරනවා කියලා සම්බන්ධීකරණ කමිටුවේ ගත්ත තීන්දුව වාර්තාවේ තියෙනවා. ඒ වර්තාවේ තියෙන දේ එතුමා අද කරලා නෑ, ඒ නිසා එතුමා බොරුවක් කියලා තියෙන්නේ. ඒක ඇත්තක් කියලා කියන්න් මට මොකද? මට එහෙම කියන්න බෑ. එතුමා බොරුවක් කියලා තියෙනවා නම් එතුමා කිව්වේ බොරුවක්. මේ රටේ ජනාධිපති. ඒක මම ඉල්ලා අස් කර ගන්න කැමති නෑ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

හරි එතුමා කතා කරන්නේ මහවැලි ඇමතිවරයා වශයෙන්. එතුමාට අවස්ථාව දුන්නා. ජනාධිපතිතුමා විවේචනය වෙලා තියෙනවා නම් අපි ඒක හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න කිව්වා. දැන් ඔබතුමා අවසන් කරන්න නමින්ද මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*

-----------------------------------------------------------

මම කියන්නේ බැකෝ පතල් ක්‍රමය අවසන් කරන්න ඕනේ. සාමාන්‍ය ගමේ මනුස්සයාට අයිති ගම. ගගේ වැලි කැටයක් ගරලා මැණික් කැටේ ලබා ගැනීමේ අයිතිය ඒ සාමාන්‍ය ජනතාවට ස්ථාපනය කරලා දෙන්නට ඕනේ. ඒවගේම මැණික් කර්මාන්තය සුරකින්නට මේ කර්මාන්තය අපේ ජනතාවට ලබා දෙන්නට අවශ්‍ය කටයුතු කරන්නට ඕනේ. සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කරන්න ඕනේ කියන යෝජනාව කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි. ගරු නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමනි. මීළඟට ගරු කේ.එල්.රත්නායක මන්ත්‍රීතුමා. එතුමා සභාවෙ නැහැ. මීළඟට ගරු මන්ත්‍රී වරුණ ලියනගේ මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී වරුණ ලියනගේ***
***கௌரவ உறுப்பினர் வருண லியனகே***
*Hon.Member Waruna Liyanage*

---------------------------------------------

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. අද ඇත්තටම සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා ඉතාමත් වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළ දවසේ මේ සම්බන්ධයෙන් මටත් කතා කරන්න අවස්ථාවක් ඔබතුමා හදිස්සියේ හරි ලබාදීම ගැන ස්තූතිවන්ත වෙනවා. ඇත්තටම මේ පළාත් සභාවට ඇවිල්ලා මගේ පළවෙනිම යෝජනාවත් මේ මැණික් කර්මාන්තය නඟා සිටුවන්නට දාපු යෝජනාවක්. හැබැයි එදා මම යෝජනා කරලා ඉදිරිපත් කළ කරුණු මැණික් සංස්ථාවට එදා ගියේ නෑ. එදා ගියේ නැති නිසා මට අදත් ආපහු නැවතඔබතුමා ඉදිරියේ කතා කරන්න වෙලා තියෙනවා. මොකද ගරු සභාපතිතුමනි මට එදා කතා කරපු

යෝජනාව යවන්න තියා ඉඳගන්න පුටුවක් නැති තැනක් තමයි තිබුණේ. ස්ථානයවත් තිබුණේ නෑ. ඒ නිසා යෝජනාව ගන්නේ නැනේ. එදා අපිට කතා කරන කොට යෝජනාව අදාල ආයතනයට යන්න තියා අදාල පුටුවවත් ලැබුණේ නෑ පළාත් සභාවේ. රංජිත් බණ්ඩාර ඇමතිතුමා ආවට පස්සේ තමයි අපිට පුටුව හරි ස්ථානය ලැබුණේ. එහෙම තමයි අද අපි මේ පළාත් සභාවේ ඉන්නේ. කොහොම හරි මට මතකයි රංජිත් බණ්ඩාර ගරු ඇමතිතුමා ඉන්න කාලයේ මමත් එතුමාට ඉදිරිපත් කරලා කරුණු මේ සංස්ථාවෙන් ජනතාවට ඇති වෙච්චි කරුණු අපි ඉදිරිපත් කරලා සංස්ථාවේ සභාපතිතුමා සභාවට නෙමෙයි අපේ සාකච්ඡා කාමරයට ගෙනල්ලා උපදෙස් දීලා ඒවා ක්‍රියාත්මක කර ගත්තු ආකාරය අපිට මතකයි.

ඒවගේම රංජිත් බණ්ඩාර සභාපතිතුමා ඉද්දී අපි ඉල්ලීමක් කළා මැණික් සංස්ථාවෙන් එදා සංස්ථාවේ තියෙන නඩු ටික ඉක්මනට ඉවර කරලා දාන්න පරීක්ෂා කරන එක නීති නිළධාරියයි හිටියේ එදා. අපි කිව්වා හතර දෙනෙක්වත් පත් කරන්න කියලා. ඒ අනුව අද ලෝයර්ස්ලා හතර දෙනෙක් පත් කරලා නඩු ඉක්මනින් ඉවර කරලා අද නැවත ලබාදීමට ගන්න පුළුවන්කම අපිට ඇති වෙලා තියෙනවා. ඒ නිසා අපි පළාත් සභාවෙන් කතා කරලා ඒවා ජයග්‍රාහනය කරපු අවස්ථා තියෙනවා. ඒ නිසා ඇත්තටම අපි ඉතාමත් සංතෝස වෙනවා. ඒ නිසා සලිත මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන්නේ පරිසරයත් රැක ගෙන සාමාන්‍ය ජනතාවට මේ බලපත්‍රය ගන්නේ කොහොමද කියන එක තමයි ඉතාමත් වැදගත් වෙන්නේ කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා සලිත මන්ත්‍රීතුමා යෝජනා කරපු එක අනුව මමත් විශ්වාස කරනවා පතල් හිමියෙක් විදිහට ඒවගේම පතල් කර්මාන්තයේ නියැලිලා ඉන්න කෙනෙක් විදිහට විශාල ප්‍රශ්නයක්. ඒවගේම අපේ දිස්ත්‍රික්කයට පමණක් නෙමෙයි අපි මේ කතා කරන කොට මේ රටටම මේ කර්මාන්තය බලපානවා. එතකොට මාතලේ දිස්ත්‍රික්කයේ මොණරාගල දිස්ත්‍රික්කයේ ,රත්නපුර දිස්ත්‍රික්කයේ,රත්නපුර දිස්ත්‍රික්කයේ අපි කතා කරන කොට මේ වැරදි පෙන්වලා දීලා හදා ගන්න එක තමයි ඇත්තටම බලාපොරොත්තු වෙන්නේ. මොකද අනිත් දිස්ත්‍රික්කවල මේක සුළු පරිමාණයෙන් කරන්නේ. ඒ නිසා අපි යෝජනා කරන්නේ ගරු සභාපතිතුමනි මේ සාමාන්‍ය ජනතාවට බලපත්‍රයක් ලබාගැනීමේදී ඇති වෙන ගැටළු ගත්තට පස්සේ මම දැක්ක ගැටළුවක් තමයි තමුන්නාන්සේ දන්නවා අපේ කල්තොට ගත්තට පස්සේ අපේ දිස්ත්‍රික්කයේ කෙලවරේ මායිමක්. එතකොට කල්තොට ඉන්න කෙනෙක් හදිස්සියේ ඇප්ලිකේෂන් එකක් අරන් බලංගොඩින් ආපහු මෙහේ රත්නපුර ගෙනල්ලා දීලා ඇප්ලිකේෂන් එක කොළඹට යන කොට විශාල ප්‍රමාදයක් සිදුවෙනවා මේ ඇප්ලිකේෂන් එක සඳහා අයඳුම් පත්‍ර එන කොට. ඒ නිසා මම ඉල්ලීමක් කරන්නේ ඔබතුමාගෙන් මේක සංස්ථාවට දැනුවත් කරලා බලංගොඩ ක්‍රියාත්මක නිළධාරීට ලයිසන් එක දීමේ අවස්ථාවක් ලබා දෙන්න. එතකොට විශාල ගැටළුක් තියෙනවා අපි දැක්කා ඇන්.ඇම්.පෙරේරා මැතිතුමා තමයි මේ මැණික් සංස්ථාව මේ තත්ත්වයට ගෙනල්ලා තියෙන්නේ. එතකොට 73 පනතින් තමයි මේක තියෙන්නේ. එතකොට මේ වනවිට 93 දී නැවත සංශෝධනයක් සිද්ධ වෙලා තියෙනවා. නැවත සංශෝධනයේදීත් මේ සභාපතිතුමාට ඇරෙන්න මේ ලයිසන් එක නිකුත් කිරීම තහනම්. එතකොට සභාපතිතුමා රත්නපුර දිස්ත්‍රික්කයට කී සැරයක් ආවද කියලා මම දන්නේ නැහැ. ඒවගේම මාතලේ දිස්ත්‍රික්කයේත් තියෙනවා ලයිසන්. එතකොට මොණරාගල දිස්ත්‍රික්කයේත් තියෙනවා ලයිසන්. එතකොට මේවා අත්සන් කිරීමට සභාපතිතුමාටම සිද්ධ වෙනවා. එතකොට ගරු සභාපතිතුමනි අපි ඉල්ලීමක් කරන්නේ රත්නපුර දිස්ත්‍රික්කය සඳහා මාසයකට දවස් දෙකක් අඩුම තරමේ එනවා නම් මේ ප්‍රශ්නය

නිරාකරණය කර ගන්න පුළුවන් වෙනවා. මොකද සභාපතිතුමාම ලයිසන් එකේ අත්සන් කරන්න ඕනේ නිසා. ඒවගේම අපි ඉල්ලීමක් කරන්නේ බලංගොඩින් ලයිසන් එකක් ගත්ත එක්කෙනාට බලංගොඩින්ම ලයිසන් එක ගන්න හදා ගන්න පුළුවන් නම් මං හිතන්නේ කල්තොටින් එන සාමාන්‍ය ජනතාවට මේ ලයිසන් එක ගන්න පුළුවන් වෙනවා. ඒවගේම ලයිසන් එක ගන්න ක්‍රමවේද අපි සාකච්ඡා කරන්න මෙතන සභාපතිතුමා ගෙනල්ලා අපිට අවස්ථාවක් ලබා දෙනවා නම් ඔබතුමා අපිටත් කරුණු ඉදිරිපත් කරන්න පුළුවන් කියලා විශ්වාස කරනවා.

ඒවගේම පරිසර හානිය පිළිබඳවත් කතා කරන්න ඕනේ. මොකද මෙ මැණික් ක්ෂේත්‍රය ගැන ගත්තට පස්සේ අද අපිට කතා කරන්න වෙන්නේ දැලි පිහියෙන් කිරි කනවා වගේ. මොකද හොඳත් කතා කරන්න පුළුවන්. නරකත් කතා කරන්න පුළුවන්. හොඳ කතා කළත් හොඳයි කියයි. නරක කතා කරලා හොඳ දේ පැහැදිලි කරලා දෙන්න ගියොත් ගමට යන්න බැරි වෙනවා. ඒවගේ තත්ත්වයක් තමයි තියෙන්නේ.

අපි බැකෝ ගැන කතා කළා. පතල් කර්මාන්තය ගැන කතා කරනවා. හැබැයි වාසියක් වුනේ නැති වුණාම පතල එහෙම්මම නතර කරලා දාලා සියළුම දෙනා යනවා යන්න. හැබැයි අයිතිකාරයාට පතල වහ ගන්නවත් කෙනෙක් නෑ. එතකොට බැකෝ පතලුත් එහෙම තමයි. පතල් වහපු නැති ස්ථාන රත්නපුර දිස්ත්‍රික්කයේ ගත්තහම අතිවිශාල ප්‍රමාණයක් තියෙනවා කියලා මම විශ්වාස කරනවා. ඒවගේම අපිට

මේවා වහ ගන්න බැරි නිසා මේ වන කොට පැල්මඩුල්ල ප්‍රදේශයේ ජලය ගන්න බැරි තත්ත්වයට ඇවිල්ලා තියෙනවා මොකද මේ කැකිල්ල පල්වීමෙන් මේ ලී පල්වීමෙන් භූගත ජලය ළිංවල මේ වන කොට වතුර බොන්න බැරි තත්ත්වයට ඇවිල්ලා තියෙනවා. ඒ නිසා මැණික් සංස්ථාව මේවාට යම්කිසි මුදලක් රඳවාගෙන තියාගෙන ඉන්නවා. ඒ නිසා අපි ඉදිරිපත් කරලා මේවෙන් මේ වලවල් ටික වහ ගන්න ඕනේ. බැකෝ පතල් තියෙනවා. වලවල් තියෙනවා. පතල් සාමාන්‍ය පතල් තියෙනවා. වහගන්න බැරුව. ඒ නිසා මේවා වහන්න කියලාත් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න ඕනේ. ඒවගේම ගරු සභාපතිතුමනි ඔබතුමාට කියන්න ඕනේ මේ පතල් කර්මාන්තය කෙරෙන කොට සමහරක් වෙලාවට අපේ දිස්ත්‍රික්කය ගත්තහම සමහරක් තැන්වල ගෙවල් සාදලා තියෙනවා. නමුත් පැරණි පතල් කපපු ඉඩම්. නමුත් ආපහු අල්ලපු ඉඩමේ පතලක් කපන කොට මේ ගේ කඩා වැටෙනවා. මේ ගේ ඉරි තලනවා. ඒ නිසා විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තියෙනවා. මොකද ඒ ලයිසන් හිමියාට ගිහිල්ලා මැණික් සංස්ථාවට ගිහිල්ලා පැමිණිලි කරලා ලයිසන් හිමියාගෙන් මේ වෙන කොට වන්දියක් ගන්න බැර තත්ත්වයක් ඇති වෙලා තියෙනවා. මොකද පරණ ලයිසන් එකක් ඉදිරිපත් කළහම අර පදිංචි වෙලා ඉන්න එකේ කපපු එකේ පරණ එකක් ඉදිරිපත් කළහම වන්දි ගෙවන්න විදිහක් නෑ. පතල් කපලා තියෙනවා. එතකොට අල්ලපු ඉඩමේ අඩි 35 ක් අඩි 50 ක් ඇතින් කැපුවත් වැඩක් නෑ ඉරි තලනවා. නමුත් සාමාන්‍ය ජනතාවට ගෙදරට වන්දියක්වත් ගන්න බැරි තත්ත්වයට පත් වෙලා තියෙනවා. ඒ නිසා මේ වගේ දේවල් අපි ඉදිරිපත් කරලා සංශෝධනය කරලා මේ පතන සංශෝධනය කරන්න අපි පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කරන එක තමයි විය යුත්තේ කියලා අපි විශ්වාස කරමින් සලිත මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඔබතුමා පෞද්ගලිකව මැදිහත්

වෙලා ඉක්මනින්ම අපිට අවස්ථාවක් ලබාදීලා මේ කරුණාකර සාර්ථක කර ගන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින් ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි ගරු වරුණ ලියනගේ මන්ත්‍රීතුමනි. මීළඟට ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.

***ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.***
***கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார***
*Hon. Minister Ranjith Bandara*
---------------------------------------------

ගරු සභාපතිතුමනි අපේ සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරමින්, සංශෝධන සහිතව අපි අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් මැණික් කර්මාන්තයේ නියැලෙන පුද්ගලයන් හැටියට අපි මැණික් සම්පත කොහේද තියෙන්නේ අපි එතන. ඒක තමයි සාමාන්‍යයෙන් කතන්දරය. සලිත මන්ත්‍රීතුමා යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නේ මල නොතලා රොන් ගන්න. පරිසරයට හානියක් නොකර මැණික් සම්පත නෙලා ගන්න. බොහොම අමාරු කාර්යයක් මේක. මොකද එදා මැණික් සංස්ථාව පිහිටෙව්වේ ආචාර්ය එන්. එම්. පෙරේරා මැතිතුමා ඒ පිහිටොන කොට එතනින් පස්සේ මේ මැණික් කර්මාන්තය රත්නපුරෙන් , හසලක මැණික් ගල ගන්නවා කියන කතන්දරයට එන්න තරම් පෙළඹුණේ මොකක්ද මේ මුදල මත හඹා යන ආර්ථිකයක් අපිට ලැබුණ නිසා. ඒ නිසා මැණික් සම්පත එදා අපේ පැරණි මුතුන්මිත්තන් මැණික් සම්පත ඒක තමාගේ සයිඩ් බිස්නස් එකක් තමා ගොවිතැන් බත් කරලා ජීවත් වෙන කොට ඒකෙ ලියද්දක් ඉතුරු කර ගන්නවා මේ මැණික් ගරා ගන්න. එහෙම තමයි මැණික් ගැරුවේ. ඒක අද මුදල මත හඹා යන මැණික් සම්පත අද මුදල මත ඉක්මනින් නෙලා ගෙන සාම්ප්‍රදායික ක්‍රමයෙන් බැහැරව ගිහිල්ලා තමන්ගේ ඉදිරි පරම්පාරවට කාටවත් ඉතුරු කරන්නේ නැතුව බැකෝ යොදලා සම්පත සූරා ගෙන කන යුගයක් අද වෙලා තියෙන්නේ. ඒක මේ රටේ විතරක් නෙමෙයි මුළු ලෝකයේ යන විදිහ මේ ආර්ථික ක්‍රමය අනුව අපිට මේක නවත්තා ගැනීමේ අපහසුවක් තියෙනවා. හැබැයි අපිට මේක පරිසරය ආරක්ෂා කර ගත්තේ නැත්නම් මේ මොන සම්පත නෙලා ගත්තත් අපිට මේ ඉදිරි පරම්පරාවට මේ ලෝකයක් ඉතිරි වෙන එකක් නෑ.

ඒ නිසා අපි දකිනවා විශේෂයෙන් අර නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නය අපි ගඟක පතලයක් එහෙම නැත්නම් ගඟක උදැල්ලක් දාලා සාම්ප්‍රදායික ක්‍රමයට මැණික් කැටයක් ගන්න කොට ඒ දේ පමණයි ගන්නේ. හැබැයි අද බලන්න රත්නපුර පානදුර පාරේ ,රත්නපුර කොළඹ පාරේ වැලි ලොරි කොච්චරයක් යනවාද. ඔක්කෝම යන්නේ අද පානදුර පාරේ සහ කොළඹ පාරේ.

ඒවගේම මොණරාගල දිස්ත්‍රික්කයේ වගේම විශාල ප්‍රදේශයකට මේවා විසිරිලා ගියා. ව්‍යාපාරිකයෝ බහුලව ඇති වුණා මේ රටේ. ඒ ඇති වෙලා 77 විවෘත ආර්ථිකයත් එක්ක මේ මුදල මත හඹා යනවා. අර අජිත් කුමාර මැද්දෙගම මැතිතුමාගේ කතාවේදී කිව්වා අර බඩේ හිටියත් අම්මගේ බඩේ හිටියත්

එහෙම නම් මැණික් ගලක් මැණික් ගල් දෙකක් තුනක් තමයි ගරා ගන්නේ. අනිත් වැලි ටික එහෙම් පිටින්ම ගඟට දාන්නේ. එතකොට පරිසරය විනාශ වෙන්නේ මැණික් ගැරීමට වඩා මේ වැලි ගොඩ දැමීම නිසා තමයි පරිසරය විශාල වශයෙන් හානි සිද්ධ වෙන්නේ. අපි දැක්කා මේ කඩුවෙල පාරේ

යන කොට දැන් ගඟ කඩුවෙල පාර අයිනේ තියෙන්නේ. මෙහේ ගඟ එදා අපි ගඟේ වැලි ගොඩ උඩ පිනුම් ගහපු මිනිස්සු. පොඩි කාලයේ. නමුත් අද වැලි දකින්න නෑ. වැලි ටික අරගෙන යනවා. අද මේ මැණික් සම්පත අපි ගඟේ විතරක් නෙමෙයි ඇළ දොළ ගංගා විතරක් නෙමෙයි. අපේ ගොඩ ඉඩම්වල වතුකරයේ විශාල මැණික් සම්පත තිබෙනවා. එදා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිතුමා අසෝක ජයවර්ධන මැතිතුමාත් කතා කළා මේ සම්බන්ධව. අපි කියන්නේ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ඒ අය මැණික් සොයා ගන්නේ නෑ. මැණික් සොයා ගන්නේ අහිංසක පතල් කම්කරුවා. කොහේ හරි ඉල්ලමක් හොය ගන්නවා. මැණික් ගලක් හොයා ගත්තාට පස්සේ මැණික් සංස්ථාව එනවා. ඒක වෙන්දේසි කරලා සල්ලි ගන්නවා. ඔච්චරයි කරන්නේ. අද මොකද සීතාවක ගඟේ වෙලා තියෙන්නේ. සීතාවක ගඟේ පහුගිය කාලයේ ලයිසන් දීලා පතල් කපන්න අවසර දුන්නා. ගඟ යට දිය යට ගිය අය බෝතල්වල මුට්ටිවල මැණික් ටික ඔබලා. පැත්තක දාලා කොහේ හරි ඉවුරක ගහලා ආවා. මැණික් ටික ගොඩට ආවේ නෑ. අවේ 25% විතර ගොඩට. අද තාමත් තියෙනවා මැණික් මුට්ටිවල ,බෝතල්වල ගහලා ඇවිල්ලා කවුද දිය යට ගිය කිමිදුන්කරුවෝ. අද ඒ නිසා තමයි ආරක්ෂාව දාලා කාටවත් නොදී මැණික් සංස්ථාව විසින් මැණික් ගැරුවා. මේවා තමයි ඇත්ත කතන්දරය. මේ නිසා අපි පරිසරයත් එක්ක මැණික් ගරා ගැනීම සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව කාලෝචිත යෝජනාවක්. ඒ නිසා මම මතක් කරන්න ඕනේ දේශපාලනය ගැන කතා කරනවා නෙමෙයි.

බෝල ජොයින්ට් එකක් හරි විකිණෙන්නේ. මැණික් සම්පත නෙලා ගත්තොත් තමයි රෙදි කඩේකට ගිහිල්ලා අපිට රෙද්දක් ගන්න පුළුවන් වෙන්නේ.

ඒ නිසා මැණික් ආර්ථිකය අද මේ ජන ජීවිතයට ඉතාමත් කිට්ටුවට බැඳිලා තියෙන කර්මාන්තයක්. ඒ නිසා කර්මාන්ත අමාත්‍යවරයා හැටියට අපි උත්සාහ කරනවා මේ බලපත්‍ර ලබා ගැනීමේදී පහුගිය කාලයේ මට මතකයි සභාපතිතුමා කාලයේ මැණික් සංස්ථාවේ සභාපතිතුමා අපි රත්නපුරට පළාත් සභාවට ගෙනල්ලා සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ යෝජනා අදහස් අරගෙන අපි යම් ලිහිල්භාවයක් දුන්නා මැණික් බලපත්‍ර ලබා ගැනීමට අහිංසක ජනතාවට. නමුත් අද අහිංසක ජනතාවට කබලෙන් ලිපට වැටිලා තියෙනවා. මොකද මැණික් බලපත්‍රයක් ගන්න ඒ අය මැණික් ගලක් ගරලා විකුණන ගාන අද යනවා මැණික් බලපත්‍රයක් ගන්න. සාමාන්‍ය දලන් කැල්ලක් අරගෙන විකුණන ගාන. ඒ නිසා ඉතාමත්ම අසීරුයි. ගරු සභාපතිතුමා ඔබතුමාගේ මැදිහත්වීම අපිට මේ වෙලාවේ අවශ්‍යයි. විෂයපතය පළාත් සභාවේ නැති වුණාට. අපි ජීවත් වෙන දිස්ත්‍රික්කයේ ප්‍රදේශයේ මේ කර්මාන්තය හා අපි සම්බන්ධ වෙලා ඉන්නේ. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා වර්තමාන සභාපතිතුමා ඔබතුමාගේ මැතිවරණ කොට්ඨාශයෙ ඉන්නවා කියලා ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා කිව්වේ. ඒ නිසා එතුමාව පළාත් සභාවේ මන්ත්‍රීවරුන් වෙන අපි මුණ ගස්සලා මේ තියෙන ගැටළු සම්බන්ධයෙන් යම්කිසි විසඳුමක් ලබා ගන්න

අද රටේ තියෙන ආර්ථිකයේ අමාරුකම අද සිංහල අවුරුද්ද එනවා කඩේකට ගිහිල්ලා බඩු ටික ගන්න අද ජනතාවට අපහසුයි. රත්නපුරේ ඉෆ්ලාර් මන්ත්‍රීතුමා කිව්වා මාළු බාන්න නෙමෙයි රත්නපුරේ මැණික් සම්පත තියෙන්නේ. මැණික් සම්පත ලැබුණොත් තමයි ඉෆ්ලාර් මන්ත්‍රීතුමාගේ

සම්බන්ධීකරනය කරන්න. ඒවගේම අපි තවත් ඉල්ලීමක් කරනවා අතිගරු ජනාධිපතිතුමා පරිසර පිළිබඳ ඇමතිතුමා හැටියට එතුමා ඇවිල්ලා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී පොරොන්දුවක් වුණා. අපි එදා හිටියා. එතුමා කිව්වා මේ බැකෝ වලට ආයේ අලුත් ලයිසන් දෙන්නේ

නෑ නිකුත් කරන්නේ නැහැ කියලා. නමුත් ඒක අද ඒ ආකාරයෙන්ම සිද්ධ වෙනවා. ඒක තමයි නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා සඳහන් කළේ. ඒ ආකාරයෙන්ම සඳහන් කළා. එතුමා අවේ 2015 ජනවාරි 08 පත් වුණේ ජනාධිපතිවරයා විදිහට. පෙබරවාරි නැත්නම් මාර්තු මාසයේ ආවා රත්නපුරට. අවුරුද්දක් වෙලා. අවුරුද්ද ඉවරයි. අයේ මේ අප්‍රේල්. බලපත්‍රය එසේම ක්‍රියාත්මක වෙනවා. ඔබතුමා සොයලා බලන්න. මේ තියෙන්නේ මැණික් බලපත්‍රයක්. මේ දීලා මාසයක් වෙනවා. බලපත්‍රය තාම ලැබිලා නැති බලපත්‍රයක් ගරු සභාපතිතුමනි. 2015 මාර්තු මාසයේ කිව්වේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මේ සියල්ලක්ම බලපත්‍ර අහෝසි වුණාට පස්සේ කරන්නම් කියලා. තාමත් ඒ බලපත්‍ර ක්‍රියාත්මක වෙනවා. ඔබතුමා දකිනවා. ඔබතුමා මේ යන කොට දකිනවා.

ඒ නිසා අපි ඉල්ලීමක් කරන්නේ මැණික් සංගම් තියෙනවා. අපේ ව්‍යාපාරික සංගමය කියලා එකක් තියෙනවා. ඒවගේම සුළු මැණික් ව්‍යාපාරික සංගමය කියලා තියෙනවා. මේ සංගම් දෙක එකට පැහෙන්නේ නෑ. ව්‍යාපාරික සංගමය අතිගරු ජනාධිපතිතුමා හම්බ වෙලා කියනවා ජනාධිපතිතුමනි අපිට මේ මේ දේවල් වලට අවසර දෙන්න කියලා. ඒකට අවසර දෙනවා. ඊට පස්සේ සුළු මැණික් ව්‍යාපාරිකයෝ ගිහිල්ලා කියනවා මේ බැකෝ වලට ලයිසන් දෙන්න එපා කියලා. අන්න ආයේ නවත්තනවා. මේක කරන්න බෑ. හරි හෝ වැරදි එක තීන්දුවක් ගන්න ඕනේ. නායකයෙක් වුණහම ඒක තීන්දු කරන්න ඕනේ. හොඳට හොයලා බලලා හරි තීන්දුව

ගන්න ඕනේ. අන්න ඒකයි. මම අතිගරු ජනාධිපතිතුමාට දොස් කියනවා නෙමෙයි. පරිසර ඇමතිවරයා හැටියට එතුමාට මේ සම්බන්ධව ලියලා ඇරලා මේ ගරු සභාවේ යෝජනාවක් හැටියට එතුමාට දන්වලා යවන්න කියලා ගරු සභාපතිතුමාට ඉල්ලීමක් කරමින් ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ස්ථිර කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

එතුමා පිළිතුරු කතාව කළේ. ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. දැන් මිත්‍රවරුනි සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා විසින් විවිධ යෝජනා විවිධ අදහස් ඒවගේම විවිධ විවේචන ඒවගේම නිර්දේශ ඉදිරිපත් කරනු ලැබුවා. මේ කාරණාව සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පොදුවේ බලපාන දීර්ඝ කාලයක ඉඳලා දිගින් දිගට සකච්ඡා වෙමින් ඉස්සරහට එන කාරණාවක්.

පළමුවෙන්ම ගරු සලිත මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ඉදිරිපත් කරන ලද සංශෝධන සහ එක එක ගරු මන්ත්‍රීතුමන්ලා විසින් ඉදිරිපත් කරන ලද කරුණු මත පදනම් කරගෙන ඒ සඳහා බලාපොරොත්තු වෙන ආකාරයේ සහනය ලබා ගැනීම සඳහා අදාල බලධාරීන් වෙත යොමු කිරීම සඳහා පළමුව කටයුතු කරන අතර , සභාවේ දෙවනුව ආපු ඉල්ලීම තමයි වර්තමාන මැණික් සංස්ථාවේ සභාපතිතුමා සමඟ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලාට සාකච්ඡාවක් සඳහා අවස්ථාවක් ලබා දෙන්න

කියලා. ඉතිං මම ඒ සඳහා සභාපතිවරයා හැටියට මොකද මෙතෙක් සභාවට අවස්ථාවල් ලබාදීම සඳහා යෝජනාවක් වෙලා තිබුණේ නැහැ. අද තමයි සාකච්ඡාවක් සඳහා යෝජනාවක් ඉදිරිපත් වුණේ. ඒ සඳහා ඉදිරි කාලයේදී කඩිනමින්ම මැණික් සංස්ථාවෙ සභාපතිතුමා අදාල බලධාරීන් සමඟ ඔබතුමන්ලාට සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු සූදානම් කරනවා.

ඒවගේම මතක් කරන්නට ඕනේ පහුගිය දිනකදී මෙම ගරු සභාවේ යෝජනා වුණා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාවක් ලබා දෙන්න කියලා. අපි ඔබතුමන්ලා විසින් කරන ලද ඉල්ලීම අදාල කමිටුව වෙත යොමු කරපුවහම අදාල කමිටුව විසින් දැනුම්දීමක් කරලා තියෙනවා පස් වෙනිදා ඒ කියන්නේ අද දවස වෙන කොට සියළු කටයුතු අවසන් කරන්න සූදානම් කරලා තියෙනවා. ඒ සඳහා එතුමන්ලාට මෙහේට එන්න හැකියාවක් නොමැති නිසා හැකියාවක් තියෙනවා නම් ගරු මන්ත්‍රීතුමන්ලාව එතුමන්ලාගේ යෝජනා අදහස් ඉදිරිපත් කිරීම සඳහා අදාල කමිටුව වෙත යොමු කරන්නට කටයුතු කරන්න කියලා. අපි කටයුතු සූදානම් කළා. ඊයේ දවස වෙන කොට වාහනයකුත් සූදානම් කළා. හැබැයි කිසිම මන්ත්‍රී කෙනෙක් ඒකට සහභාගී වෙන්නට අවස්ථාව ලැබුණේ නැහැ. ඒ නිසා ඒ බවත් මතක් කරන්නට ඕනේ. කමිටුව ඊයේ 11.00 ට සූදානමින් සිටියා. සබරගමු පළාත් සභාවේ ගරු මන්ත්‍රී තුමන්ලාගේ අදහස් ලබා ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමන්ලා යන්න කවුරුවත් ඉදිරිපත් නොවිච්චි නිසා අපිට ඒ අවස්ථාව ලබා ගන්නට හැකියාව ලැබුණේ නැහැ. ඒ බවත් සභාවට මතක් කරමින්. ඉදිරි කාලයේදී ඉතාම කෙටි කාලයකදී සභාපතිතුමා ඇතුළු එතුමන්ලා ගෙනල්ලා තමුන්නාන්සේලා සමඟ සාකච්ඡාවක් ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරනවා.

මීළඟට යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රභාත් මහේෂ් ද අල්විස් මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2016/05 යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා එතුමාට අපි අවස්ථාව ලබා දෙනවා.

***ගරු මන්ත්‍රී ප්‍රභාත් මහේෂ් ද අල්විස්***
***கௌரவ உறுப்பினர் பிரபாத் மஹேஷ த அல்விஸ்***
*Hon.Member Prabath Mahesha de Alwis*
---------------------------------------------------

ගරු සභාපතිතුමනි මෙම යෝජනාව මීළඟ සභා වාරයට යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

ස්තූතියි ගරු මන්ත්‍රීතුමනි.

***ගරු මන්ත්‍රී වරුණ ලියනගේ***
***கௌரவ உறுப்பினர் வருண லியனகே***
*Hon.Member Waruna Liyanage*
--------------------------------------------

ගරු සභාපතිතුමනි සමාවෙන්න ඕනේ. ඉස්සෙල්ලා කිව්ව කාරණය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ කරුණු ඉදිරිපත් කරන්න මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා. නමුත් සඳුදා දවස් ඊයේ මට යන්න බැරිවීම ගැන මගේ පෞද්ගලික කාරණයක් නිසා මම ස්තූතිවන්ත වෙනවා ඒ අවස්ථාව ලබාදීපු එක සම්බන්ධව. ඇත්තටම අපි සාකච්ඡා කර ගත්තා මන්ත්‍රීවරුත් එක්ක අද දවසේ සකච්ඡා කරලා ෆැක්ස් පනිවිඩයක් මාර්ගයෙන් කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාවක් දෙන්න කියලා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------

ඒක ගැටළුවක් නෑ. ගරු මන්ත්‍රීතුමා. ඔබතුමන්ලා සභාවෙන් කරන ලද ඉල්ලීමට

කටයුතු කළා. නැත්නම් සභාවේ යෝජනා වෙනවා සමහරක් වෙලාවට එතනින් එහාට ගත්තු ක්‍රියාමාර්ග ගැන සඳහන් වෙන්නේ නෑ කියලා. ඊළඟට සභාපතිතුමා ඇතුළු මැණික් සංස්ථාවේ නිළධාරීන් සමඟ සාකච්ඡාවක් ඒකත් අද තමයි යෝජනාවක් වුණේ කැඳවලා ක්‍රියාත්මක කරන්න කියලා. ඒ පිළිබඳව සභාව දැනුවත් විය යුතු නිසයි කතා කළේ. ඒක ගැටළුවක් නෑ ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න***
***கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன***
*Hon.Member Salitha Karunaratne*

---

ගරු සභාපතිතුමනි ඒ පිළිබඳව සාක්ෂි දුන්නා. කමිටුවට.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ඒ පිළිබඳව මම දැනුවත් වෙලා හිටියේ නැහැ. පටලවා ගන්න එපා මේ ගරු සභාවේ ඉල්ලීමක් කළා මේ සභාව

වෙලාවේදී ඒ සඳහා අවස්ථාවක් ලබා දෙන්න කියලා. ඒ අනුව තමයි. මම මේ කතා කරන්නේ ඒ කාරණාව පිළිබඳව. ඒ අනුව කමිටුව දැනුවත් කරලා කමිටුවෙන් වෙලාවක් ඉල්ලගෙන ඒ පිළිබඳව කටයුතු සූදානම් කළා. යම් ගරු මන්ත්‍රීතුමෙක් ඒ කමිටුවට ගිහිල්ලා කරුණු ඉදිරිපත් කළා නම් මම ඒ පිළිබඳව දැනුවත් වෙලා හිටියේත් නෑ. ඒ කාරණාව නෙමෙයි. මේ සභාවෙන් ඉල්ලන ලද කාරණාව තමයි මම මතු කළේ. ඒ කාරණාව පිළිබඳව තමුන්නාන්සේලා ඉදිරිපත් කළා නම් ඒ පිළිබඳව මම බොහොම ස්තූතිවන්ත වෙනවා. ඒකට දායකවීම පිළිබඳව.

මීළඟට ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන 6/1/2016/06 යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා ඔබතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*

---

ගරු සභාපතිතුමනි ඒ යෝජනාවත් මීළඟ සභා වාරයට ඉදිරිපත් කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තූතියි ගරු නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ යෝජනාවත් ඊළඟ සභාවට ගන්න කියලා යෝජනා කරන්නේ. ගරු මන්ත්‍රීතුමා ඊළඟ සභාවට. ස්තූතියි.

මීළඟට ගරු මන්ත්‍රී ජී.ඇම්.කරුණාපාල මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2016/07 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*

---

ගරු සභාපතිතුමනි මේ යෝජනාව ඊළඟ සභාවට කල් දාන්න බෑ. 2016 සිංහල අවුරුද්ද එන්න පටන් ගන්නවා. ඒ නිසා අර යෝජනා දෙක ලබන සභාවට කල් දාපු ගරු මන්ත්‍රීතුමන්ලා දෙපලට ප්‍රථමයෙන්ම ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා.

අපේ සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාගේ යෝජනාව මේ යෝජනාවටත් ඒකාබද්ධයි. රත්නපුර දිස්ත්‍රික්කයේ බහුතරයක් කෘෂිකර්ම අපනයන වගාව මත ජීවත් වෙනවා සමහම මැණික් කර්මාන්තය තමයි ඒ ජන ජීවිතය ආලෝකමත් කරපු කර්මාන්තය. ඒකට කණ කොකා හැඬුවා කියලා කියලා වැඩක් නෑ. ඉරිදා මහ ලොකුවට පාරිසරික කියලා කුමන්ත්‍රණ පවත්වලා යන අයගේ සහෝදරයෝ අන්න තල්දූවේ පාලම යට ගරනවා. එස්.පී.සී. මොන එකක් කැදෙව්වත් මට කමක් නෑ. ඇත්ත කියන්නේ. අන්න පාරිසරික ගැන කතා කරන ලොක්කාගේ සහෝදරයෝ තල්දූවේ පාලම යට ගරයි. දැන් රංජිත් බණ්ඩාර ඇමතිතුමාගෙ උත්තරේදී මම කතා නොකර හිටියා. තමුන්නාන්සේලාට ලොක්කෝ දෙන්නෙක් හිටියා. හරි ආදරෙයිනේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට වැඩියෙන්ම ආදරේ යූ.එන්.පී. එකේ අය. එයාට උත්තර දෙන්න මං කැමති නෑ. ඔයා බාලයෙක්නේ. ඕනේ නම් පත්තරයෙන් හරි මොකකින් හරි අහගන්න. තමුන්නාන්සේලාට ලොක්කෝ දෙන්නෙක් ඉන්නවා මේ රටේ. එක්කෙනෙක් ජනාධිපතිතුමා, අනිත් එක්කෙනා රනිල් වික්‍රමසිංහ මැතිතුමා. ඔයිට වැඩිය ලොක්කෝ ඉන්නවෑ. අද කියන එක හෙට වෙනස් කරනවානේ. දැන් ඊයේ පෙරේදා ප්‍රකාශනයක් කළා ගොවි ජනතාව පිළිබඳව. තැනින් තැන දැන් පොහොර ඉල්ලලා කෑගහනවාය. එතකොට වකුගඩු රෝගියෙක් මැරෙන සංඛ්‍යාව දන්නේ නෑ. පොහොර ඉල්ලන්නේ කියලා. හරි යන්නේ නැනේ. දහ අට පොහොර නම් පොහොර දෙන්න ඕනේ. ඒක වෙනත් පොහොර හදනවා නම් කාලයක් දෙන්න ඕනේ. එහෙම නැතුව දැන් කියන එක හවසට රත්නපුරේ ඇවිල්ලා මහා පාරිසරික උත්සවයක් කළා. මම නම් ඉල්ලා අස් කර ගන්නේ නෑ සභාපතිතුමා කිව්වත්. හැබැයි ඉතිං මම මල් ගහන්නේ නෑ. මල් ගහලා කුඩුවේ හිටපු කතා (සෝෂාව)

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

කරුණාපාල මන්ත්‍රීතුමා ඔබතුමා මාතෘකාවට අදාලව කතා කරන්න. මේ සභාව අනවශ්‍ය තැනකට ගෙනි යන්නේ නැතුව. ඔබතුමා කතා කරන්න.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*

-----------------------------------------------

පාරිසරික සම්මන්ත්‍රණයක් කළා අපි බොහොම සංතෝසයෙන් අපිට එදා එන්නට විදිහක් නෑ. අපි මහ පොළොවට ආදරෙයි. අපි ගහ කොළට,ඇල වේල්ලට ආදරෙයි. ඒ නිසා අපි සිය කැමැත්තෙන්ම අපේ ස්තූතිය ප්‍රකාශ කර සිටියා. නමුත් එකක්වත් සිදු වුනේ නෑ. සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමා මේක මේ කාලීන මාතෘකාවක් සිංහල අවුරුද්ද කියන්නේ. ඔබතුමා ළඟ ඉන්න අයටත් මා ළඟ ඉන්න අයටයි හැම කෙනාටම වටිනවා බඩු මිළ අඩු කළොත්. හරියට අඩු වෙයි. හැබැයි ඉතිං රුපියල් දාහට කරවල කිලෝ එකක් ගන්නට බෑ. දැන් මේ මං කියාගෙන ආවේ කතාව. ඒකාබද්ධයි. මැණික් ව්‍යාපාරය හා සිංහල අලුත් අවුරුද්ද

අද තුට්ටුවක් නෑ කාගේවත්. පතල් කපන්න විදිහකුත් නෑ. පහුගිය සතිය වෙන කොට කැකිල්ල ටැක්ටරයක් අරන් ගිහිල්ලා රු.50000/- ක් දඩ ගැහුවා. ඔන්න නිමල් විජේනායක මන්ත්‍රීතුමා තමුන්නාන්සේත් දන්නවා. රත්නපුර දිස්ත්‍රික්කය වටා මුහුදක් නෑ. මේකේ තියෙන්නේ මැණික් ගලක්. ඒකට අද පුදුමාකාර කරදරයක්. සංස්ථාවේ සභාපති අපේ අල්ලපු ගමේ. ඒ නිසා එතුමාට කතා කරා කියලා මට කරන්න දෙයක් නෑ. ඊයේ පත්තරේ මම කියවන විට ඉරිදා දිවයින පත්තරේ එක සභාපතිතුමෙක්ගේ කාර්යාලය අලුත්වැඩියා කරන්න රුපියල් කෝටියයි. අනේ කිව්වේ කොහොමද අපි බස් එකේ යන්නේ කියලා. අපි අර උඩින් යන ඒවා පාවිච්චි කරන්නේ නෑ කියලා.

ඒ එක්කම පාර්ලිමේන්තුවේ යෝජනාවක් ගෙනල්ලා මේ මොන තරම් ආර්ථික ප්‍රශ්න තිබුණත් ඇමතිවරුන්ට අලුතින් වාහන ගේන්න. දැන් ගිය සතියේ තිබුණා ආයතන ප්‍රධානීන්ගේ රැස්වීමක්. විශ්‍රාම යන කොට මේ රජයේ සේවකයෙකුට ලැබෙන එකම වත් පොහොසත්කම තමයි වාහන බලපත්‍රය. ඒවා නෑ කට්ටියට. එහෙම තියෙන අවධියක දැන් 13 වෙනිදා ආරම්භ වෙන සිංහල අවුරුද්දේදී මිනිසුන්ට ඉතියෝපියාව මතක් කර ගන්න තමයි සිද්ධ වෙන්නේ. හැම භාණ්ඩයකම බඩු මිළ

වැඩියි. සාමාන්‍යයෙන් සිරිතක් තියෙනවා ගම්බද කඩේක කියන්නේ නෑ ලුනු නෑ කියලා. ගෙදරක ලුනු අඩු කරන්නේම නෑ. ලුනු කියන්නේ අත්‍යාවශ්‍ය හා සාම්ප්‍රදායික තිබිය යුතු දෙයක්. දැන් කඩේකට ගියහම හොඳට යහපාලන කඩේකින් මම ඇහුවා ළඟ. ලුනු තියෙද. නෑ ලුනු. හැබැයි තියෙනවා රු.80/- ට ඒවා ඉන්දියානු ලුනු. මාතෘකාව අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිළ අඩු කිරීමට කරන බලපෑමක්. අඩු වශයෙන් මේ අහිංසක මිනිස්සුන්ගේ මනාපයෙන් හා ඡන්දයෙන් මේ බලය ගත්ත උදවිය පොඩ්ඩක් හිතන්න ඕනේ අහිංසක දුප්පත් මිනිස්සු. මම කණගාටු වෙනවා එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරු මොන හේතුවක් නිසාද මං දන්නේ නෑ එන්නේ නැත්තේ. හිටියා නම් අද වටිනවා. අපිට පොහොර මිළ පොහොර ලබාදීමට විරුද්ධ වුණොත් ගමට යන්න බෑ. මැණික් ප්‍රශ්නය ගැන කතා නොකලොත් අපිට නගරයට යන්නට බෑ. නමුත් අපේ සහෝදර මන්ත්‍රීවරු ඒවා තුට්ටුවකටවත් ගණන් ගන්නේ නැතුව කොහොම හරි මහ ඇරියා මොකක් හරි මාතෘකාවක් දාලා.

දැන් අජිත් කුමාර මැද්දෙගම මන්ත්‍රීතුමා කිව්වා මැණික් ගලක් අම්මගේ බඩේ තිබුණත් ගන්න හදනවා කියලා. මං දන්නේ නෑ ඔබතුමා කියපු එක මම කිව්වේ. අහගෙන හිටියා යාන්තම්. බොරු එහෙම නෑ අම්මා ඊට වැඩිය උතුම්. එහෙම බාල වචන කතා කරන්න හොද නෑ මේ උත්තරීතර සභාවක. මැණික් ගලද අම්මද වටින්නේ. ඔබතුමාගේ කතාවේ මම මේ කියන්නේ. සමහර මන්ත්‍රීවරු නෙමෙයි.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

---------------------------------------------------------

මම කිව්වේ නෑ. සමහර මන්ත්‍රීවරු කිව්වේ.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල***
***கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால***
*Hon.Member G.M.Karunapala*

----------------------------------------

මේ මැණික් කියන එක කොහොම හරි කීයක් හරි හොයා ගන්න කටයුතු කරන කර්මාන්තයක්. ඒක වෙනම දෙයක්. අද මගේ මාතෘකාව. මගේ මාතෘකාව ළඟ එන සිංහල හින්දු අලුත් අවුරුද්ද ඉලක්ක කරගෙන අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිළ අඩු කරන ලෙස වත්මන් රජයට බලකර සිටින අතර මෙම යෝජනාව ඉතා ඉක්මනින් අදාල බළධාරීන් වෙත යොමු කරන මෙන් ඉල්ලමි. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සහල්, පිටි,සිනි,කිරිපිටි,කරවල, හාල්මැස්සන් සහ ටින්මාළු සහ ලූනුවේ. හැම දේකම බඩු මිළ ඉහළ ගිහිල්ලා. මොන තරම් කතා කරවද. මම එදාත් කිව්වා ජාත්‍යන්තර සම්බන්ධතා වැඩි දියුණු කරාගෙන ගිවිසුම් අත්සන් කරලා තියෙනවා කියලා. එක ගිවිසුමක්වත් අත්සන් කරලා නෑ. අභියෝගයකට කියන්නේ තව යහපාලන ආණ්ඩුවට බෝක්කුවක් වත් හදා ගන්නට බෑ. විවෘත කරන්නේ අපේ ඒවා. පළාත් සභාවේ මහ ඇමතිතුමා කාරුණික වෙලා සල්ලි දෙන හන්දා මොකක් හරි හදන්නට පුළුවන්. ඒක නෙමෙයිනේ මහා පරිමාණ කර්මාන්ත කොච්චර ආවද. ඊයේ පෙරේදා මට අහු වුණා පොඩි සටහනක්. ඉතා පැහැදිලිවම කියනවා රත්නපුර පානදුර පාරේ අධිවේගී මාර්ගය පටන් ගන්නවා. බෙන්තර හරහා යන අධිවේගී මාර්ගය පටන් ගන්නවා. කෝප් සිටියත් පටන් ගන්නවා. පටන් ගත්තේ නැත්නම් තව ලොකු ණයක් ගෙවන්න වෙනවා. ඒක හින්දා ගරු අගමැතිතුමා දැන් චීන වන්දනාවේ යනවා හෙට අනිද්දා. අනේ චීනෝ අපිට සල්ලි ටිකක් දෙන්න කියලා. කතාවක් තියෙනවා කොණ්ඩය බැඳපු චීනුන් වගේ කියලා. චීනෝ අපේ රටට ඇවිල්ලා ගම්මානවල ඇවිදලා ඔරලෝසුව හරි මොනවා හරි විකුණනවා. අපිත් ඉතිං හරී ලාභයි කියලා ගන්නවා. චීනෝ ඉතිං ඒගොල්ලන්ගේ උපරිම මුදලට තියලා. ඉක්මනින් දුවනවා පස්සට හැරිලා. ආපහු ඉල්ලයි කියලා. චීනෝ දුවනවා ආපස්සට හැරිලා මම අර දුන්නු එක ආපහු දෙයි කියලා. අපි ඉක්මනින් ආපස්සට දුවනවා . අඩු මුදලට ගත්ත ඒවා ආපහු ගනියි කියලා.

ඒවගේ තමයි දැන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා දැන් චීන වන්දනාවේ යනවා අනේ චීනෝ අපිට දියව් සල්ලි කියලා. නැත්නම් ඉවරයි මගේ යහපාලනය කියලා. ඒ යහපාලන ආණ්ඩුවේ අපි කියන්නේ මේ සිංහල හා හින්දු මිනිස්සුන්ට අවුරුද්දට අර කැකුළු හාලේ කිරි බතක් උයාගෙන කන්නට මේ බඩු මිළ අඩු කරන්න. අපේ අබේනායක මන්ත්‍රීතුමා දන්නවා කොච්චර වී තියේද ඇඹිලිපිටියේ. බොරු නෙමෙයි. එතුමා ඉන්න කණ්ඩායම හින්දා මේවාට උත්තර දෙන්නේ නෑ. මගේ මිත්‍රයා. රු.24/- ට වත් විකුණා ගන්නට බෑ. සම්බා. යෝත් කියන්නේ මොකක්ද ප්‍රමිතියෙන් තොරයි. ඒ එක්කම එක ගොවි මහත්තයෙකුගෙන් ගන්නේ රුපියල් ලක්ෂ දෙකක වී විතරයි. මේ පම්පෝරි කතා. බැරියෑ මේවා අඩු මුදලකට අරන් දෙන්නට මේ හාල් ටික. සිංහල අවුරුද්දට කන්නට. දැන් එළවළු එහෙම කතා කළොත් කියයි කාලගුණික දේශගුණික හේතුවක් නිසා මේක කරන්න දෙයක් නෑ. අපි කියන්නේ අනිත්‍ය. ඉන්දියානු ධීවරයින් ආයුධ පෙන්වලා ලංකාව වටේ අපේ සීමාවෙන් ඇතුළත ඇවිල්ලා අපේ උදවිය මාළු දැල් දැම නවත්තලා තියෙනවා. එහෙම නම් අද මාළු මිළ ඇගේ මාළු තමයි නටන්නේ. මාළු කඩේට ගියහම. ඒක හින්දා මම කාලය ගන්නේ නෑ තමුන්නාන්සේලාගේ. අපි බල කරන්නේ මේ ආණ්ඩුවට. මේ ආණ්ඩුවේ බලධාරින්ටත් අපි බල කරන්නේ හාල් ටිකයි. කිරි පිටි ටිකයි. ටිං මාළු ටිකයි . මේ ඊයේ පෙපෙර්දා වෙන කොට රු.4/- කින් කිරි පිටි වැඩියි. පාන් ගෙඩිය ඊටත් වඩා ඉහළට ගිහිල්ලා. දැන් චතුකරයේ මිනිස්සු පුදුමාකාර පීඩනයකට ලක් වෙලා. පාන් පිටි වැඩියෙන් පාරිභෝජනය කරන්නේ අජිත් කුමාර

මන්ත්‍රීතුමා මෙතන කෑ ගහනවා වගේ අර එළියට ගිහිල්ලාත් කෑ ගහන්න රවී කරුණානායක වගේ අර හැම වෙලාවේම කෑගහන මනුස්සයා වගේ මම කිව්වා කියලා කියන්න. මම දන්නවානේ එයා කරපු වැඩ ටික. දැන් මේ විදිහට ගියොත් එහෙම ස්ථිර සාර මිනිස්සුන්ට පුදුමාකාර සහනයක් ඇති වෙනවා. ඒ හින්දා මේ අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිළ අඩු කරන්නට කියලා අපි තමුන්නාන්සේලා දෙගොල්ලෝම එක්කහු වෙලා බල කිරීමක් කරමු. නැත්නම් අවුරුදු වලට ගියොත් එහෙම අර මාවනැල්ලේ වුණ සිද්ධිය තමයි වෙන්නේ. ඒවගෙ. ඒ හින්දා මම කාලයක් ගන්නේ නෑ. මේ අත්‍යාවශ්‍ය කරුණු ගැන කථිකාවතක් ගොනු කරලා අවශ්‍ය තැන් වලට යොමු කරමින් මේ සිංහල අවුරුද්දට අඩු වශයෙන් කට්ට සම්බොලත් එක්ක කිරි බත් කන්නටවත් බඩු මිළ අඩු කිරීමට බල කරන්නට කියලා යෝජනාව අදම ක්‍රියාත්මක වෙන්න කියලා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---------------------------------------------------------------

ස්තුතියි ගරු කරුණාපාල මන්ත්‍රීතුමනි. මීළඟට සිරිල් පල්ලේපොල මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල***
***கௌரவ சிரில் பல்லேபொல***
*Hon.Member Cyril Pallepola*

---------------------------------------------------------------

ගරු සභාපතිතුමනි පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුනි. මගේ හිත මිත්‍ර කරුණාපාල සිංහල අවුරුද්දට, හින්දු අවුරුද්දට බඩු මිළ අඩු කරන්නට කියලා යෝජනාවක් ගෙනාවා. බොහොම කාලෝචිතයි. බඩු මිළ අඩු වෙන්නට ඕනේ සිංහල අවුරුද්දට.

ගරු සභාපතිතුමනි මට මතක් වුනේ මැණික් ගැන කතා කරන කොට මේ මැණික් ව්‍යාපාරය ආරම්භ කලේ හිටපු ඇන්.ඇම්.පෙරේරා මැතිතුමා. මම ඊයේ පෙරේදා මම මැණික් ව්‍යාපරය ගැන දන්නේ නෑ. මටත් හිතුණා මගේ වෙළක කපන්න ඉල්ලමක් දාන්න ඕනේ කියලා. රුවන්වැල්ල ඉඹුලාන වෙල් යායේ පොඩි ඉල්ලමක් දාන්න ඇප්ලිකේෂන් දාලා වැඩ ටික කරන කොට මම ඊයේ පෙරේදා ගියා මැණික් සංස්ථාවේ . මේ කතා කරන මන්ත්‍රීවරයා ඇහැලියගොඩ දැන ගන්නට ඕනේ ඒ කාර්යාලයට යන්න පාර නෑ. ගිහින් වාහනය නවත්තන්න තැනක් නෑ. ගිය පාරිභෝගිකයෙකුට මේ අවුරුදු 25 ක් 30 ක් තිබුණ ආණ්ඩුවට මැණික් සංස්ථාවේ හොඳ කාර්යාලයක් දාගන්න බැරි වෙලා තියෙනවා. ඒ ගැන මම කණගාටු වෙනවා. මම ගිය

සතියේ ගියා ඇහැලියගොඩට. ඉඳ ගන්න ගිය කෙනෙකුට පුටුවක් නෑ හරියට. එහෙම තැනක තමයි ගරු සභාපතිතුමනි ඇහැලියගොඩ මැණික් සංස්ථාවේ කාර්යාලය පවත්වාගෙන යන්නේ එහෙම කතා කරන කොට ගරු සභාපතිතුමනි මම මේ දැකපු දේ. මම ගිහින් කරපු දේ. මම ගිහින් මුහුණ දෙන්නට වුණ දේ ගැන මම මේ කතා කරන්නේ. මම මැණික් ගැන දන්නේ නෑ. මම දන්නේ තිරිවාන ගලයි මැණික් ගැන මම අඳුරන්නේ නැති නිසා. ඒක නෙමෙයි ගරු සභාපතිතුමනි මගේ හිත මිත්‍ර මන්ත්‍රීතුමා කියනවා මේකේ සහල්,පිටි,සීනි බඩු මිළ අඩු කරන්න කියලා. මොකද මට න්‍යාය පත්‍රය ඊයේ තමයි හම්බ වුනේ. මම කොළඹ ගිහිල්ලා එන්න රෑ වුණා. මට මේක අධ්‍යයනය කරන්න වෙලාවක් තිබුණේ නෑ. මම උදේ

බලන කොට බඩු මිළ ගැන තමයි තිබුණේ. මම කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම උදේ එන කොට සිල්ලර කඩ ටික වහලා. මොකද අරින්නේ අටට,නවයට. බඩු ටිකත් ගන්න බැරිව ගියා. මම ඒකට මම දැම්මේ දෙහිඕවිටින් ඇහැලියගොඩට. ලඟම ලොකුම තොග බඩු කඩේ සෙන්ටර් ස්ටෝර්ස් ඇහැලියගොඩ. මම ගියා කඩේට. මම ගිහිල්ලා බඩු ලිස්ට් එක දුන්නා කඩේට. බඩු ටික ගත්තා. මම මොනවද ගත්ත බඩු ටික. මම ගන්නවා හාල් කිලෝ පහක්. රු.330/- යි. නෙස්ටමෝල්ට් ටින් එකක්. රු.280/- යි. සීනි කිලෝ එකක් රු.100/- යි. පාන පිටි කිලෝ එකක් රු.90/- යි. ලොකු සැමන් ටින් එකක් රු. 130/- යි. කරුණාකරලා මම සෙන්ටර් ස්ටෝර්ස් එකෙන් බඩු ගන්නවා. මම ඔප්පු කරලා මෙන්න බිල තියෙනවා. (ඝෝෂාව) ජීප් එකේ බඩු ටික. ඔප්පු කරනවා. බොරු කියන්න එපා. ගරු සභාපතිතුමනි බාධා කරන්න එපා කියන්න. මම කාටවත් බාධා කරන්න ගියේ නැහැ. ගරු සභාපතිතුමනි මට විනාඩි පහක් දෙන්න. මගේ ජීප් එකේ තියෙනවා බඩු ටික. ගේන්නම්. (ඝෝෂාව)

මම ගෙනාවේ. ඒවගේම අල කිලෝ එකක් රු.75/- යි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කිරීමක් කරන්නේ.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*

---

කොතනද තියෙන්නේ.

***ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල***
***கௌரவ சிரில் பல்லேபொல***
*Hon.Member Cyril Pallepola*

---

සෙන්ටර් ස්ටෝර්ස්. ඇහැලියගොඩ. ජයසිරියට අල්ලපු එක. මේ බිළ. ටෙලිෆෝන් නම්බර් නෑ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ඔබතුමා මූලාසනයකට කතා කරන්න.

***ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල***
***கௌரவ சிரில் பல்லேபொல***
*Hon.Member Cyril Pallepola*

---

බඩු මළ අඩු වෙලා තියෙන්නේ. වැඩියක් නෑ. අපි කෑගලු දිස්ත්‍රික්කයේ මම හිතුවා කෑගලු දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට කෑගල්ලේ මිළ වැඩි වෙලාද කියලා. කෑගල්ලේ හොඳට ගන්න බඩු තියෙනවා. ඒ නිසා මම ආවේ උදේ. ගෙදරින් එන්නේ හයට. ඔබතුමා උගත් මන්ත්‍රීවරයෙක් හැටියට කල්පනා කරලා බලන්න මම උදේ දැදිගම ඉඳලා ආවේ උදේ හයට. උදේ හයට සිල්ලර කඩ ඇරලා නෑ. නිකන් බොරුවට කතා කරන්න එපා ගරු මන්ත්‍රීතුමා. මන්ත්‍රීවරයෙක් හැටියට ඔබතුමා කල්පනා කරලා බලන්න

මම එන කොට ඇරලා තිබුණ පළවෙනි කඩය. මම කල්පනා කරලා බැලුවා. ඇයි එහෙම බැලුවේ. මේ සම්බන්ධ මන්ත්‍රීවරයාගේ ප්‍රදේශයෙන් බඩු ගන්න මම තීන්දු කළා. ඒ නිසා තමයි අද මෙන්න සෙන්ටර් සප්ලයි එකේ එහෙම බඩු මිළ වැඩිවීමක් නෑ.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල*
*கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால*
*Hon.Member G.M.Karunapala*

-----------------------------------------

අපිත් මේ බඩු ගන්නවා අපි මේ සභාව ඉවර වෙලා යන කොට ඔය මිළට මටත් බඩු ටික අරන් දුන්නොත් (ඝෝෂාව) බොරු කියන්න එපා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

හරි ඔබතුමා කතා කරන්න.

*ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල*
*கௌரவ சிறில் பல்லேபொல*
*Hon.Member Cyril Pallepola*

------------------------------------------------------------

මේ ගානට බඩු ටික අරන් දෙන්න බැරි වුණොත් මගේ ජීප් එකෙන් ඇහැලියගොඩදී මෙතුමාට ආපහු දීලා යනවා කියලාත් මේ අවස්ථාවේදී මතක් කරනවා. සෙන්ටර් සප්ලයි එකෙන් ගත්ත බඩු මේ ගානට අරන් දෙන්න බැරි වුණොත් මගේ ජීප් එක අත්සන් කරලා මෙතුමා දෙනවා කියලාත් මේ අවස්ථාවේදී මතක් කරනවා. අභියෝග කරනවා. බොරු කියන්න අවශ්‍ය නෑ. පෙළක් මන්ත්‍රීවරු තමන්ගේ නම රැක ගන්න බොරුවට කතා කරනවා වෙන්න ඇති.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

සිරිල් මන්ත්‍රීතුමා දැන් තමුන්නාන්සේගේ කතාව කරන්න. තමුන්නාන්සේ මෙතුමන්ලාත් එක්ක වෙන වෙනම කතා කරනවා නම් සභාවේ නීති කතා කර ගන්න. දැන් මෙතනදී ඔබතුමාගේ කතාව කරලා අවසන් කර ගන්න. නැත්නම් මට කාලය අවසන් කරන්න සිද්ධ වෙනවා.

*ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල*
*கௌரவ சிறில் பல்லேபொல*
*Hon.Member Cyril Pallepola*

------------------------------------------------------------

කරුණාකරලා මට බාධා කරන්න එපා. අපි ඇත්ත කතා කරන්නේ. මමත් ඔබතුමාත් දන්න ප්‍රදේශයක් ඇහැලියගොඩ ප්‍රදේශය. සෙන්ටර් ස්ටෝර්ස් කියන එක . මේ බිළ මා අතේ තියෙනවා ගරු සභාපතිතුමනි. ඒකයි මම බඩු මිළ කිව්වේ. ගරු සභාපතිතුමනි මේවා හොරට බිල් දාන්න බෑ, මහජන නියෝජිතයෙක් හැටියට . මට මේ න්‍යාය පත්‍රය හම්බ වුනේ ඊයේ සවස. මම එහෙම නම් එහෙන් බඩු අරන් බිළ ගේනවා. මම උදේ එන කොට ඇරලා තිබුණ කඩේ. මම ඒකයි ගත්තේ බඩු. අපි ඇත්ත කතා කරන්නේ අපි මහජන නියෝජිතයෝ හැටියට අපි පළාත් සභාවට එන්නේ අපි රැඳී ඉන්නේ . අපි ඇත්ත කතා කරන්න ඕනේ. තම තමන්ගේ දේවල් රැක ගන්න. තම

තමන්ගේ නායකයෝ රැක ගන්න ඒවා කතා කරලා වැඩක් නෑ ගරු සභාපතිතුමනි. බඩු මිළ එහෙම වැඩිවීමක් නෑ. බඩු මිළ අඩුයි. එක එක පළාතට මිළ වෙනස් වෙනවා. ඒක සාමාන්‍ය සිදුවීමක් ගරු සභාපතිතුමනි. අද ඒ විතරක් නෙමෙයි ජනතාවට බඩු මිළ විතරක් නෙමෙයි ඩීසල් ටික අඩු වෙලා තියෙනවා. ත්‍රීවිල් එකේ යන්න පැට්‍රල් ටික අඩු වෙලා තියෙනවා. සහන ලැබිලා තියෙනවා. අවුරුද්ද තුළ සියළුම සහන අපිට ලැබෙන්නේ නෑ. ගරු සභාපතිතුමනි පුරා අවුරුදු 25 ක්30 ක් ඇතුළත අවුරුද්දක් දෙකක් ඇතුළත වැඩ කරන්න පුළුවන්කමක් නෑ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ඔබතුමාගේ කතාව අවසන් කරන්න.

***ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල***
***கௌரவ சிரில் பல்லேபொல***
*Hon.Member Cyril Pallepola*

---

එහෙම නම් ගරු සභාපතිතුමනි බඩු මිළේ වැඩිවීමක් නෑ කියලා මේ අවස්ථාවේදී මං මතක් කරමින් ලැබුවා වූ මේ සිංහල අලුත් අවුරුද්ද රත්නපුර දිස්ත්‍රික්කයේ හා කෑගලු දිස්ත්‍රික්කයේ ජනතාවට පමණක් නෙමෙයි සමස්ත ජනතාවටම බොහොම සාමයෙන් සමගියෙන් සිංහල අවුරුද්ද භුක්ති විඳින්න වාසනාව ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

බොහොම ස්තූතියි ගරු සිරිල් පල්ලේපොල මන්ත්‍රීතුමනි. මීළඟට නියෝජ්‍ය සභාපති උදයකාන්ත ගුණතිලක මැතිතුමා

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

ගරු සභාපතිතුමනි අපේ කරුණාපාල මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් වචන කීපයක් කතා කරන්නට ඔබතුමා අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් මම සතුටු වෙනවා. ඒවගේම මම අපේ කරුණාපාල මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙනවා. මේ යෝජනාව කරුණාපාල මන්ත්‍රීතුමා

ගෙනාවා වගේම ඒ යෝජනාවේ අත්‍යාවශ්‍ය භාණ්ඩ අහවල් ඒවා කියලා පෙන්වලා දීම සම්බන්ධව. මොකද අපි දැක්කා පහුගිය කාලයේ අත්‍යාවශ්‍ය භාණ්ඩ කියලා මිළ අඩු කිරීමක් කළා. කොත්තමල්ලි එහෙම නැත්නම් තුනපහත් අත්‍යාවශ්‍ය භාණ්ඩ හැටියට ඒ පහුගිය කාලයේ පෙන්වලා දුන්නා. ඒ නිසා මේ ජනතාවට අත්‍යාවශ්‍ය දේවල් කියලා නම් කිරීම සම්බන්ධව මම සතුටු වෙනවා අපේ කරුණාපාල ගරු මන්ත්‍රීතුමාට. විශේෂයෙන්ම අපේ ගම්වල බලපුවහම අද ඒ සිංහල හින්දු අලුත් අවුරුද්ද සමරන්න අද ජනතාවට මහා පීඩාවක් තියෙනවා. මහා ප්‍රශ්නයක් බවට පත් වෙලා තියෙනවා. අද ඒකට හේතුව තමයි ගරු සභාපතිතුමනි මුදල් සංසරණයක් වෙන්නේ නෑ. අද රබර් මිළ බැහැලා. අද තේ මිළ බැහැලා. අද තේ තිබුණත් දෙන්න ගානට දළු කඩන්න ක්‍රමයක් නෑ. මහා නියඟයක් තියෙනවා. නියඟය නිසා දළු නෑ, ඒ ආර්ථිකයත් එක්ක දළු කඩන මනුස්සයාට ආර්ථික වශයෙන් ශක්තියක් වෙන්නේ නෑ. ඉඩම් හිමියාට ශක්තියක් වෙන්නේ නෑ. එහෙම නම් මේකේ බරපතල ප්‍රශ්නයක්

තියෙනවා. තේ තියෙන මනුස්සයාට, ඒවගේම තේ තියෙන මනුස්සයාට ඒවගේම අනිකුත් ඒ පොල් මිළ අද බැහැලා තියෙනවා. මේ තත්ත්වය නිසා අද ආර්ථිකය මහා මුල් සමාජයේ සංසරණය නොවෙන තත්ත්වයට අද පත් වෙලා තියෙනවා. ඒවගේම මේ පිට රටින් ගේන සියළු භාණ්ඩවල මිළ අද වැඩි වෙලා තියෙනවා. කවුරු හරි කියනවා නම් පහුගිය කාලයට වඩා බඩු මිළ වැඩි වෙලා නෑ කියනවා නම් එහෙම කියනවා නම් ඒ කියන කෙනාගේ කටේ පුත්තලම් හොරි දාන්න ඕනේ. එහෙම ප්‍රායෝගිකව දන්නේ නෑ,එහෙම ප්‍රායෝගිකව ඉන්නේ කොහේද අර ජනතාවට කොකා පෙන්වන එක තමයි කරන්නේ.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

---

රු.135/- ට තිබුණ සීනි අද රු.100/- ට අඩු වෙලා කියන්නේ අඩු වෙලාද වැඩි වෙලාද. එතුමාගේ බලන්න ලැයිස්තුවේ. (ඝෝෂාව)

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

වැඩි නිසා තමයි දුන්නේ. මම මම අහන්නේ මේකයි දැන් ප්‍රශ්නය තියෙන්නේ 72/-ට නෙමෙයි 90/- ට තියෙනවා කියමුකෝ. 90/- ට ගන්න මහජනයාට කෝ සල්ලි. අද ගමේ ගිහිල්ලා බැලුවොත් කරනවැමියා මොකද කියන්නේ. කොණ්ඩය කපන්නේ නෑ, මිනිස්සු එන්නේ නෑ. ඇයි හේතුව එතෙන්ට යන්න කොණ්ඩය කපා ගන්න අද සල්ලි නෑ. ගරු සභාපතිතුමනි ප්‍රශ්නය තියෙන්නේ මේ වෙන කොට අද මිරිස් මෝලට යන්න බෑ පෝළිම. මේ වන කොට තුනපහ ටික කොටා ගන්න යන්න බෑ. ගමේ අද පෝළිම අද නෑ. හේතුව මොකද අද අවුරුද්දක් ඇවිල්ලා නෑ. අද මහජනයාට විතරක් නෙමෙයි අද කොහා අඬනවාද. මම නම් මේ වෙන කොහා අඬනවා අහලා නෑ. කොහාට අවුරුදු තාම දැනිලා නෑ. දැනෙන්නේ නෑ එහෙම අමාරුවක්. එහෙම පීඩාවක්. මේ කාලය තුළ තියෙනවා. මේ තරම් පීඩාවක් වෙච්ච මේ තරම් යුගයක් මේ ආණ්ඩුවක් අරන් වෙච්චි කාලයක් ,යුගයක් අපි දැකලා නෑ. අපි දෙගොල්ලෝම කතා කරලා අපි දෙගොල්ලෝම එකතු වෙලා අපි මේක විසඳන්න කටයුතු කරනවා විනා එහෙම නෑ කියලා කවුරු හරි කියනවා නම් ඒක මහා වැරැද්දක් කියලා මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

රම්‍යකුමාර මන්ත්‍රීතුමා නියෝජ්‍ය සභාපතිතුමාගේ කතාවට ඇහුන්කන් දෙන්න. ඔබතුමා කතා කරන්න.

ඒක විතරක් නෙමෙයි ගරු සභාපතිතුමනි. ඒ රුපියලේ අගය අඩුවීම නිසා ඒ පිටරටින් ගේන සියළුම භාණ්ඩවල මිළ අද වැඩි වෙලා තියෙනවා. ඒක අද නවත්තන්න විදිහක් නෑ. අද ඩොලර් වල මිළ කීයද. 150/- වත් අද මාරු කරනවා. රු.141/-

යි. රු.150/- ට මාරු කරනවා. ඔයා රු.141/- ට ගන්නවා ඇති. ඔයා දෙයි අර පල්ලේපොල මන්ත්‍රීතුමා කිව්වා වගේ. අඩුවට තියෙනවා කියලා. ඔයා කියනවා ප්‍රශ්නය තියෙන්නේ පස්සේ 147 ,148,149 ,150 ට යනකන්ම අද ඩොලර් එක ගිහිල්ලා තියෙනවා. ඒ විදිහට මේකයි යතාර්ථය කලු සල්ලි මාරු කරනවා. රු.170/- ටත් මාරු කරනවා. එහෙම තත්ත්වයකට අද පත් වෙලා තියෙනවා. ගමේ ඒ කාලයේ මහින්ද මහත්තයාගේ කාලයේ අයවැයේ සල්ලි ටිකෙන් ගමේ කොන්ක්‍රීට් ටික දැම්මා බලපුවහම යහපාලන ආණ්ඩුවෙන් කියලා තමයි දැම්මේ. අද මේ මාස තුනක් ගිහිල්ලා එක කර්මාන්තයක් එක වැලි කැටයක් ගමට දාන්න පුළුවන් වෙලා තියෙනවද. ඒ තුළින් සංවර්ධනයේ වැඩ නෙමෙයි ඒ තුළින් අර කර්මාන්තකාරයාගේ සාක්කුවට එන එක මේසන්බාස්ගේ කුළිය, කම්කරුවා ඒ වැඩේ තියෙනවා. රබර් මිළ බලපාලා තියෙනවා. ඒක අපේ මුළු දිවයිනටම බලපාලා තියෙන ප්‍රශ්නයක්. ඒ නිසා මේකෙන් ගැලවෙන්න පුළුවන්කමක් නෑ. අද ජනතාවට අවුරුදු සමරන්න පුළුවන්කමක් ලැබිලා නෑ. අවුරුද්ද ගැන හිතන්න පුළුවන්කමක් ලැබිලා නෑ. මේකෙන් අවුරුද්ද සමරන්න බැරි ප්‍රශ්නය විතරක් නෙමෙයි ජනතාවට ඇති වෙන්නේ. ඒකෙන් මන්ද පෝෂණය. ඊළඟට දරුවාගේ අධ්‍යාපනයට ප්‍රශ්නය. දරුවාට අධ්‍යාපනයට ටියුෂන් එක දෙන්න සල්ලි හම්බ කරන්න පුළුවන් වෙයිද නෑ.

කරන ඒ මනුස්සයාගේ අද ඒ මුදල් යන ක්‍රමයක් අද නෑ. ඒ නිසා තමයි මේ අමාරුව තියෙන්නේ. ඒක අපි යතාර්ථවාදීව පිළිගන්න ඕනේ. ඒක් යතාර්ථවාදීව සමහර අයට පිළිගන්න පුළුවන්කමක් නෑ. එදා පාන් රාත්තල මේකේ උත්සගෙන ඇවිල්ලා කතා කළ අය අද පාන් පිටි කිලෝ එක රු.20/- කින් වැඩි වෙන කොට ඒක කතා කරන්නේ නෑ කවුරුවත්. ලූනු කිලෝ එක දෙකෙන් පංගුවට වැඩි වෙන කොට ඒක කතා කරන්නේ නෑ කවුරුවත් .මොකක්ද අඩු වෙලා තියෙන්නේ භාණ්ඩවල මේ කාලය තුළ. කිසිම භාණ්ඩයක් අඩු වෙලා නෑ. මම විශ්වාස කරනවා මේ ආණ්ඩුව තව අවුරුදු එක හමාරක් තිබුණොත් අවුරුදු 20 කට බඩු මිළ වැඩි වුණාට වඩා මේ අවුරුදු එක හමාර තුළ නවත්තන්න මොන ජගතෙකුටවත් පුළුවන්කමක් නෑ. අද වී කිලෝ එකක් කීයද. වී කිලෝ එක රු.20/- යි. හාල් කිලෝ එක රු.80/- යි. වී කිලෝ එක අඩු වෙන කොට හාල් කිලෝ එකත් අඩු වෙන්නට ඕනේ. එහෙම නෑ. මෙහෙම තත්ත්වයට අද පත් වෙලා තියෙනවා. දැන් මේ මැණික් ගැන ඉස්සෙල්ලා කතා කළා. මැණික් ප්‍රශ්නය බලපාලා තියෙනවා. තේ ප්‍රශ්නය බලපාලා

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

අපි අවසන් කරමු ගරු නියෝජ්‍ය සභාපතිතුමා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

---

අර දරුවාගේ ගෙදර ආහාර ටික ප්‍රශ්නය තමයි එන්නේ. ඒ විතරක් නෙමෙයි ඊළඟට හොරු වැඩි වෙනවා. ඊළඟට පවුල් ප්‍රශ්න වැඩි වෙනවා. මේ තත්ත්වය ඇති වෙලා තියෙනවා. ඒ නිසා මේක නවත්තන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරන්නේ නෑ. ඒ නිසා මේවා කතා කිරීමත් විහිළුවක් බවට පත් වෙනවා. සමහර අපි මේ ප්‍රායෝගිකව අපි දන්නවා බඩු මිළ

මෙච්චරක් වැඩි වෙලා තියෙනවා කියලා. නමුත් කියන්නේ වැඩි වෙලා නෑ බඩු මිළ අඩු වෙලා තියෙනවා කියලා. එහෙම තැනක එහෙම පළාත් සභාවක කතා කිරීමත් එළක් නැහැ කියලා මම විශ්වාස කරන්නේ නෑ. ඒ නිසා ගරු සභාපතිතුමා මට වෙලාව ලබාදීම සම්බන්ධව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------

ස්තුතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මීළඟට ගරු නිහාල් ෆාරුක් ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***
*Hon.Member Nihal Farook*
-----------------------------------------------

ගරු සභාපතිතුමනි අපේ හිතවත් කරුණාපාල මන්ත්‍රීතුමා කාලෝචිත යෝජනාවක් ගෙනල්ලා මං හිතන්නේ එතුමා කිසිම තර්කානුකූලව එතුමාගේ කතාව ඉදිරිපත් කළේ නෑ. බඩු මිළ වැඩියි කිව්වා. ජනතාවට ප්‍රශ්න කිව්වා. එච්චරයි. ඊට එහා එතුමා මේ බඩු මිළ වැඩියි කියන එකට කිසිම තර්කානුකූල කරුණු ඉදිරිපත් නොකර අර ආණ්ඩුවට මට ගැහීමේ සුපුරුදු චේතනාවෙන් තමයි එතුමා කතා කළේ. අද දන්නවා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ එක්ක එකට ඉඳගෙන ඉන්න කණ්ඩායම තමයි කෑගහන්නේ.

ඒ නිසා අපි ගරු සභාපතිතුමනි යෝජනාවක් ඉදිරිපත් කරන කොට මඩ ගහන කොට තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරලා කියන්න ඕනේ. දැන් වෙලාව ඉතුරු කරා කියලා එතුමාට කියන්න හැකියාවක් නෑ. එතුමාට තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරන්න හැකියාවක් නෑ. නැති හින්දා තමයි එතුමා බාල විදිහට කතාවක් කරලා වාඩි වුනේ. ඒ නිසා මේ බඩු මිළ වැඩියි කියන එක අපි දන්නවා මේ පහුගිය ආණ්ඩු කාලයේ කොහොමද ජනතාව ජීවත් වුනේ කියන එක පිළිබඳව අපි අමුතුවෙන් කියන්න අවශ්‍ය නෑ. එදා ඩීසල් මිළ,භූමි තෙල් මිළ,පැට්‍රල් මිළ ලෝක වෙළඳ පොළේ අඩු වෙන කොට ඒක ජනතාවට සහනය දෙන්න බැරි ආණ්ඩුවක් එදා තිබුණේ. ඒ සහනය දුන්නේ නෑ, ඒ යහපාලන ආණ්ඩුව 2015 ජනවාරි 08 වෙනිදා තමයි ඒ සහනය විශාල වශයෙන් අඩු කරලා ජනතාවට දුන්නේ. ඩීසල් මිළ අඩු කරලා දුන්නේ නෑ. පැට්‍රල් මිළ අඩු කරලා දුන්නේ නෑ. භූමි තෙල් මිළ අඩු කරලා දුන්නේ නෑ. අපි අඩු කරලා දුන්නා. තමුන්නාන්සේලාට මතකයි ගෑස් මිළ ඉතිහාසයේ කවදාකවත් නොහිතපු විදිහට අඩු කරලා දීපු එකම ආණ්ඩුව වර්තමාන ආණ්ඩුව කියන එක අපි පැහැදිලිවම කියනවා ගරු සභාපතිතුමනි. මේ බොරුවට ඇවිල්ලා පරාජය දරා ගන්න බැරුව අවුරුදු 20 ක් පාලනය කරපු ආණ්ඩුවට තවමත් බලන්නේ පරාජයට පත් වුණු දවසේ ඉඳලා ආණ්ඩු බලය ලබා ගන්න තමයි මේගොල්ලෝ කල්පනා කරන්නේ.

***ගරු මන්ත්‍රී අන්නමලෙයි බාස්කරන්***
***கௌரவ உறுப்பினர் அண்ணாமலை பாஸ்கரன்***
*Hon.Member A.Basgaran*
-----------------------------------------------------------

අර අහිංසක දුගී දුප්පත් ජනතාව යන ත්‍රීවිල් එකේ ගාන කීයද කියලා අහන්න කැමතියි මෙතුමාගෙන්.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක***
***கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக***
*Hon.Member K.L.Ratnayake*
-----------------------------------------------

ගරු සභාපතිතුමා මේ සභාව මෙච්චර කල් ඔබතුමා හොඳට කරගෙන ආවා. මන්ත්‍රීවරයෙක් කතා කරනවා නම් බාධා කරනවා නම් ගරු සභාපතිතුමනි ඔබතුමාට ඒකේ ප්‍රශ්නය තියෙන්නේ. ඒ නිසා ඔබතුමා මේක මොන්ටිසෝරියක් නොකර පෙර තිබූ ආකාරයටම මේ සභාව උත්තරීතර සභාව ගෙනියන්න.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------

ඒක එකක්. එතකොට ගරු මන්ත්‍රීතුමා එතකොට ඒ කතාව වෙන් කරලා තියෙන ගරු මන්ත්‍රීතුමා දැන ගන්න ඕනේ කතා කරන්න. ඒක අනුන්ට උත්තර දෙන්න කියලා නෑනේ. තමන්ට වෙලාව දීලා තියෙන්නේ තමන්ට කාල වේලාව වෙන් කර ගන්න. පැහැදිලි කර ගැනීමට වෙලාව ඉල්ලුවොත් අපි දෙන්න ඕනේ. මන්ත්‍රීතුමාට කාලය වෙන් කරලා තයෙන කොට මන්ත්‍රීතුමා කතා කරන්න ඕනේ. මන්ත්‍රීතුමා වෙන වෙන ප්‍රශ්න වලට උත්තර දුන්නට මං මොනවා කරන්නද?

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***
*Hon.Member Nihal Farook*
-----------------------------------------------

ගරු සභාපතිතුමනි මං හිතන්නේ අපේ බාස්කරන් මන්ත්‍රීතුමාටත් පෞද්ගලිකව මම එතුමාට කියන්නම්. දැන් මගේ වෙලාව මදි හින්දා මම කතාව කරගෙන යන්නම්. අද මේ යෝජනාව දැන් වී ගැන කතා කරනවා. අපි දන්නවා එදා රාජපක්ෂ පාලන කාලයේ ලක්ෂ තුන්දාස් පන්සීයක සහල් ගබඩාවක්. වී ඇටයක්වත් ගබඩා නොකළ ලක්ෂ තුන්දාස් පන්සීයක සහල් ගබඩා හදලා. මත්තල ගුවන් තොටුපල හැදුවා අද මොක්ද තිබෙන ලාභය. මිහින්ලංකා එකේ පාඩුව කොච්චරද. එයාලංකා එකේ පාඩුව කොච්චරද. අද මේ හැම දේකින්ම ගිනි පොළියට ණය අරගෙන අද රටේ ජනතාව ණය බරින් මිරිකිලා ඉන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි මේ රට විනාශ කරලා මේ රටේ ආර්ථිකය කඩා දාලා අවුරුදු දහයක් මේගොල්ලෝ පාලනය කළා. මේ අවුරුදු දහය තුළ ජනතාවට සහන දෙන්න බැරි වුණා. දැන් සහන ගැන කතා කරනවා ගරු සභාපතිතුමනි. අපේ කරුණාපාල මැතිතුමා එතුමා 2014 අවුරුද්දට මේ යෝජනාව ගෙනල්ලා මේ බදු මිළ අඩු කරන්න එතුමා යෝජනා කළා නම් උත්තරය ලබා දෙන්න තිබුණා. එතුමා කළේ නෑ. එතුමා ආණ්ඩු පක්ෂයේ හිටියා නම් එතුමා දැන ගත්තා මේ බදු මිළ වැඩියි කියලා ගෙනාවේ නෑ යෝජනා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------

මන්ත්‍රීතුමා දැන් කාලය අවසානයි.

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***

*Hon.Member Nihal Farook*

---------------------------------------------

මන්ත්‍රීතුමා කතාව අවසන් කරන්න.

පැහැදිලිවම මේ බඩු මිළ වැඩියි වැඩියි කිව්වට කිසිම වැඩිවීමක් වෙලා නෑ, සමහර භාණ්ඩවල මිළ සුළු වැඩිවීමක් වෙලා තියෙනවා. ඒක අපි පිළිගන්නවා. හැම දෙයක්ම එක පාරට අඩු කරන්න විදිහක් නෑ. බඩු මිළ කියන්නේ අඩු වෙනවා. වැඩි වෙනවා. අපි ජනතාවට බර නොවන විදිහට වර්තමාන රජයට මේ ආර්ථික අමාරුකම් තිබුණත් අද කටයුතු කරගෙන යනවා කියන එක පැහැදිලි කරන්න ඕනේ. රජයේ සේවකයින්ගේ වැටුප රු.10000/- කින් වැඩි කරපු එකම ආණ්ඩුව මේක. ඒක කාටවත් නෑ කියන්න බෑ. ඒ සහනය ලබා දුන්නා පුද්ගලික සේවකයින්ගේ වැටුප වැඩි කරන්න අද කටයුතු කරලා තියෙනවා. මේ

වගේ දේවල් තමුන්නාන්සේලාට කරන්න බැරි වුණා. තමුන්නාන්සේලා ගොවියාට වෙඩි තිබ්බා. වතුර ඉල්ලපු මිනිස්සුන්ට වෙඩි තිබ්බා . කම්කරුවාට වෙඩි තිබ්බා. ඒක තමයි තමුන්නාන්සේලා ගේ පාලන කාලයේ වුනේ. ඒ නිසා අද මොන දේ කළත් ගරු සභාපතිතුමනි එදාට වඩා අද මෙ බඩු මිළ විශාල වශයෙන් අඩු වෙලා තියෙනවා.

විශේෂයෙන්ම අපි හාල් ගත්තහම නාඩු එදා 2015 ජනවාර මාසයේ තිබුණේ 88/- ට. අද රු.79/- ය. රතු නාඩු රු.79/- යි. මේ සතියේ මේක තමුන්නාන්සේලා ගිහිල්ලා බලන්න.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-------------------------------------------------------

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***
*Hon.Member Nihal Farook*

---------------------------------------------

සුදු නාඩු,රතු නාඩු ඒවා සියළුම මේ හාල් වර්ගවල මිළ අඩු වෙලා තියෙනවා පහුගිය කාලවලට වඩා. මේක තමයි ඇත්ත තත්ත්වය ගරු සභාපතිතුමනි. ඒවගේම සුළු සුළු භාණ්ඩවල මිළ වැඩි වෙලා තියෙනවා. නමුත් සාමාන්‍යයෙන් සමස්තයක් හැටියට ගන්න කොට පහුගිය අවුරුද්දේ අපි

දන්නවා 2015 අවුරුද්දේ මං හිතන්නේ අපේ රටේ සියළු දෙනාටම මං හිතන්නේ ව්‍යාපාරිකයින්ට...

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-------------------------------------------------------

මන්ත්‍රීතුමා දැන් අවසන් කරන්න කරුණාකරලා.

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***
*Hon.Member Nihal Farook*

---------------------------------------------

සුභදායී අවුරුද්දක් වුණා. එදා අපිට පැය ගාණක් ගියා නගරයක් පහු කරන්න. ඒවගේ තත්ත්වයක් මේ අවුරුද්දේ අනිවාර්යයෙන්ම මේ රටේ සිංහල හා හින්දු

අවුරුදු සමරන සියළු ජනතාවට ඒ සහනය ලබා දෙන්න කටයුතු කරනවා. ඒවගේම මට කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් උදා වෙන සිංහල හින්දු අලුත් අවුරුද්ද සෞභාග්‍යමත් අවුරුද්දක් වේවා යැයි ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තූතියි ගරු නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමනි. මීළඟට අරුණ නිලන්ත ජයසිංහ ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී නිලන්ත ජයසිංහ***
***கௌரவ உறுப்பினர் நிலந்த ஜயசிங்ஹ***
*Hon.Member Nilantha Jayasinghe*

---

ගරු සභාපතිතුමනි ඇත්තටම ගරු කරුණාපාල මන්ත්‍රීතුමා මෙම යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව මම ඉතාමත් ස්තූතිවන්ත වෙනවා. අද මේ යහපාලන රජය ආවට පස්සේ අවුරුද්ද අපි කනවා. අනේ මං දන්නේ නෑ මේ මන්ත්‍රීවරු කියනවා බඩු මිළ අඩු වෙලාලු. මේ යහපාලන රජය භාර ගත්තාට පස්සේ නෙමෙයි මේ හයිබ්‍රීඩ් අයවැය 2016 ඉදිරිපත් කළාට පස්සේ සාමාන්‍යයෙන් කිරි පිටි ග්‍රෑම් 400 තිබුණේ රු.265/- කට. දැන් වෙන කොට රු.325/- දක්වා ගණන් ගිහිල්ලා තියෙනවා. ඒ වෙලාවේ කිව්වා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිළ අඩු කරනවා. එහෙම කියලා අඩු කරලා පෙන්වනවා කියලා සෑමනුයි කිව්වා ලොකු ලැයිස්තුවක්. ඒ ලැයිස්තුව දුන්නා. ඉදිරිපත් කළා මිනිස්සුත් රැවටුණා. නමුත් අද වෙන කොට අවුරුද්ද ළං වෙලා මේ වෙන කොට අප්‍රේල් මාසයේ 05 වෙනිදා. රත්නපුර දිස්ත්‍රික්කයේ මේ අප්‍රේල් මාසය පටන් ගන්න කොට ලොකු තදබදයක් අපේ නගරවල තියෙනවා. මොකද ජනතාව නගරයට ඇදිලා එනවා. අවුරුද්දට තමන්ගේ අවශ්‍ය ඇඳුම් ටික ගන්න. බඩු ටික ගන්න. අද වළං දාලා තියෙන තැන වළං ගොඩ ගහලා තියෙනවා මිනිස්සු නෑ, රෙදි කඩ ටික තියෙනවා මිනිස්සු නෑ, අද නගරයේ කිසිම තදබදයක් මාර්ගයේ වාහන තදබදය පමණයි තියෙන්නේ. එහෙම නැතුව වෙනත් තදබදයක් දකින්න නෑ. මේක පක්ෂ විපක්ෂ අපි දෙගොල්ලන්ටම දකින්න තියෙන කාරණයක්. අපි බලන්න ඕනේ පක්ෂයක් බේර ගැනීම නෙමෙයි. රටක අවශ්‍යතාවය ,ජනතාවගේ අවශ්‍යතාවය ඉෂ්ඨ කරන්නේ කොහොමද කියලා තමයි අපි බැලිය යුත්තේ. සමහර අය හිතේ ඇති තමන්ගේ පක්ෂය බේර ගන්න තමන්ගේ ජාමය බේර ගන්න මේක අඩුයි මේක වැඩියි කියලා බොරුවට මවා පාලා වැඩක් නෑ. මේ යෝජනාව ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ මේ රටේ අවශ්‍යතාවයක්. සබරගමු පළාතේ ජනතාවට මේක දැනිලා තියෙනවා මේ බඩු මිළ වැඩිවීම පිළිබඳව. මේ වැඩි වෙච්චි බඩු මිළ අඩු කරන්න මේ රජයට බලපෑමක් කරන්න තමයි මේ පළාත් සභාවට මේ යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නේ. එහෙම නැතුව තමන්ගේ ජාමය බේර ගන්න නෙමෙයි. එතුමාට ඒක දැනෙනවා. මොකද අපි මධ්‍යම පංතික ජනතාවක්. මේක අපිට හොඳට දැනෙනවා. අර හිනි පෙත්තටම මුදල් එකතු කරලා හොද සුඛෝපභෝගී ජීවිත ගතකරන මිනිස්සුන්ට මේක නොතේරෙන්න පුළුවන්. නමුත් අපි මධ්‍යම පංතික ජනතාවක් විදිහට අපි අතරත් යම්කිසි සේවක පිරිසක් වැඩ කරනවා. අන්න ඒ සේවකයන්ට අලුත් අවුරුද්දට අපි කොහොමද අවුරුද්ද සමරන්න යම්කිසි දීමනාවක් දෙන්නේ. අපේ තේ මිළ වැටිලා . අපේ ඉඩ කඩම්වල ජීවත් වෙන මිනිස්සුන්ට බැරි වෙනවා ඒ තේ ආදායමින් යම්කිසි මුදලක් ඔවුන්ට වෙන් කරලා දෙන්න. අවුරුදු කන්න. අපිට වෙලා තියෙනවා ඒගොල්ලෝ එන කොට හැංගෙන්න. අද ෆැක්ටරියට ගිහිල්ලා අපේ දළු ටිකට අත්තිකාරම් මුදලක් ඉල්ලුවට පස්සේ තේ කර්මාන්ත ශාලාවේ

අයිතිකරුවන් හැංගෙනවා. මොකද අත්තිකාරම් මුදලක් දෙන්න විදිහක් නෑ. තේ මිළ රු.54/- ට බැහැලා. මට ඊයේ පෙරේදා දළු චෙක් එකක් හම්බ වුණා. රු.100/- යි. මං බැලුවා මොක්ද මේ වෙලා තියෙන්නේ කියලා. මේවා පෙන්වන්න ඕනේ. මෙන්න හොරමුල වත්ත. දළු කිලෝ 191 යි. ඇඩ්වාන්ස් ගත්තා මාසේ අන්තිමට පඩි දෙන්න ඕනේ හින්දා. මමත් මාසේ අන්තිමට පඩි ගන්න ඕනේ නිසා ගියාට පස්සේ මට චෙක් එකක් ගෙනල්ලා දෙනවා ලොරියේ රු.100/- මේක ඓතිහාසික චෙක් එකක්. ඒක හින්දා මම මේක තියා ගන්නවා. යහපාලන ආණ්ඩුව ආවට පස්සේ තේ කර්මාන්තයට වෙලා තියෙන දේ. මම පඩි නඩි බේරලා රුපියල් හත්දාස් ගාණක් පඩි නඩි බේරුවාට පස්සේ මට ඉතුරු වෙලා තියෙන්නේ රු.100/- යි. මේවාට පොහොර

යොදවන්නේ නැද්ද. ඒ කිසිම දෙයක් කරන්නේ නැද්ද. ඇඩ්වාන්ස් එක ගත්තේ මිනිස්සුන්ගේ පඩි නඩි බේරන්න. මම හැමදාම තේ කර්මාන්තයේ කරගෙන ආවේ මේ විදිහට තමයි. ඒ ඇඩ්වාන්ස් එකක් අරගෙන තමයි කලේ. නමුත් එදා ඉතුරු වුණා මුදලක්. එදා දළු කිලෝ එක රු.80/- ට යද්දී අපිට මුදලක් ඉතුරු වුණා අද ඒ මුදල ඉතුරු වෙන්නේ නෑ. ඒක වෙලා තියෙන්නේ මේ දළු කිලෝ එක පහළ වැටීමත් ඒවගේම පොහොර ටික යොදන්න විදිහක් නෑ. පොහොර නෑ කොහේවත්. පොහොර සහනාධාරය දෙනවා කියලා ඇප්ලිකේෂන් පුරවලා භාර දීලා තියෙනවා. අද මේ කිසිම කෙනෙක් පොහොර සහනාධාරය ලබපු කෙනෙක් තාම නෑ. තමුන්නාන්සේලා ළඟවත් නැතුව ඇති. දහ වෙනිදාට දෙනවද. අලුත් අවුරුද්දට කැවුම් කන්නද දන්නේ නෑ.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------

ගරු මන්ත්‍රීතුමා ඒ කසල තේ හින්දද දන්නේ නෑ.

***ගරු මන්ත්‍රී නිලන්ත ජයසිංහ***
***கௌரவ உறுப்பினர் நிலந்த ஜயசிங்ஹ***
*Hon.Member Nilantha Jayasinghe*

------------------------------------------------

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා දන්නේ නැති දේ කතා නොකර ඉන්නකෝ. ඔබතුමාට තනතුරක් හම්බ වෙලා කරුණාකර වාඩි වෙන්න. මමයි කතා කරන්නේ. තමුන්නාන්සේ නෙමෙයි. බොරුවට තනතුරු වලට වහල් වෙලා කතා කරන්න එපා.

ගරු සභාපතිතුමනි මම මේ ඊයේ පෙරේදා දැක්කා පත්තරේ දාලා තිබුණා සංවර්ධනයේ අරමුණ සබරගමුව කියලා. ඉතාමත් කණගාටුදායකයි. පොඩි පාරක් තියෙන්නේ. ඇන්දාන පාර දවසක් අර අල් ෆොජෙට් එකට නමක් දාලා තිබුණා. මේ නමත් වරද්දලා. රිලා දොල සිට අමුණුකොල හන්දිය දක්වා. රිලා දොළ නෙමෙයි රිල්ල දොළ . මොකද මේගොල්ලෝ නමවත් හරියට දන්නේ නෑ. නොදන්න නිසයි මේ ප්‍රශ්නය ඇවිල්ලා තියෙන්නේ. මේවා ඇස්තමේන්තු කළේ එක කිලෝමීටරයකට ලක්ෂ 800 යි. ඇස්තමේන්තුවක් තිබුණා. එතකොට පාරවල් රැක් දෙකකට. පළල පාර රැක් දෙකකට තිබුණ පාර අද එක රැක් එකකට අඩු කරලා ලක්ෂ හය සීයක් ආගිය අතක් නෑ, ලක්ෂ 200 න් හදන්න කියනවා. ඉංජිනේරු මහත්තයා කියනවා කිසිම ප්‍රමිතික් නෑ. අපිට කිව්වේ පාර හදලා දෙන්න විතරයි. අපිට තියෙන ගානට මේ තියන මුදලට හදලා දෙන්නම්. කාටද මේවා කතා කරන්නේ කතා කරන්න කෙනෙකුත් නෑ.

ඇයි මේක පටන් ගත්ත මනුස්සයා පටන් අරන් තියෙනවා. ගියා යනන. එතනින් එහාට කොතනකවත් හොයා ගන්න කෙනෙක් නෑ. කොන්ත්‍රාත් ආයතනයට ඕන විදිහට වැඩ කරගෙන යනවා. අපි ගිහිල්ලා ප්‍රශ්නයක් අහුවට පස්සේ ඒ මිනිස්සුන්ට උත්තරත් නෑ. අනේ මන්ත්‍රීතුමා මේකට ප්‍රශ්නයක් දාන්න එපා. මොකද දැන් මේකේ තිබුණ ක්‍රමවේදය වෙනස් වෙලා තියෙන්නේ.මේ විදිහට කරන්න ගියොත් ප්‍රශ්නයක් අවොත් අපිට කරන්න දෙයක් නෑ. අපේ ගමේ මිනිස්සුත් බයයි පාර හදා ගන්න අවශ්‍ය නිසා. සද්ධ නැතුව ඉන්නවා. මේ අනුන්ට උප්පැන්න ලියන යහපාලන ආණ්ඩුවට අහිංසක දුප්පත් මනුස්සයාගෙ බඩට වැදිලා තියෙන වෙලාවේ මේ බඩු මිළ අඩු කරන්න බැරි තත්ත්වයක් උදා වෙලා තියෙනවා. ඔන්න ආණ්ඩුවේ තත්ත්වය. ආණ්ඩුව ගත්තේ පම්පෝරි දාලා. මේ ආණ්ඩුව ලබා ගත්තේ ජනතාවට බොරු කියලා ඒ බොරු කියපු යහපාලන ආණ්ඩුවට අවශ්‍ය වෙලා තියෙන්නේ මේ ජනතාවට අවශ්‍ය ආහාරයට ගන්න් අවශ්‍ය බඩු ටිකට මිළ අඩු කරන්න බැරි වෙලා තියෙනවා. පොහොර ටික දෙනවට දෙන්න බැරි නිසා පාර වලට දැම්මා වකුගඩු රෝගය කියලා අද පොහොර ටික නෑ. වී ටික නෑ. මේ යහපාලන ආණ්ඩුව මේ රට භාර ගන්න කොට වී ටික ගාල් කරන්න තැනක් තිබුණේ නෑ. ඒ තත්ත්වයට මේ රට මුහුණ පෑවා. අද ඒ වෙනුවට කළේ කුඹුරු ටික අස්වද්දන එක නවත්තලා අවශ්‍ය පොහොර ටික දෙන්නේ නැතුව කුඹුරු ටික අස්වද්දන්න තියෙනවා. අන්න ඒවගේ අවිධිමත් වැඩ පිළිවෙලක් තියෙන ආණ්ඩුවක්,රජයක් අපි මේ රජයට බල කරලා ඉල්ල්නවා ගරු මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙනවා නැවතත් ස්තූතිවන්ත වෙනවා මෙතුමා මේ යෝජනාව ඉදිරිපත් කළේ මේ රටේ ජනතාවගේ අවශ්‍යතාවය අනුව බඩු මිළ අඩු කරන්න අපි ඒකට එකඟ වෙලා අපි කටයුතු කරනවා බව මතක් කරමින් මේ යහපාලන ආණ්ඩුවට මේක බලපෑමක් කරන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තූතියි ගරු අරුණ නිලන්ත මන්ත්‍රීතුමනි. මීළඟට ගරු නිමල් විජේනායක මන්ත්‍රීතුමා. ඔබතුමා කතා කරන්නේ නෑ. මෙ කථික ලැයිස්තුවේ ඔබතුමාගේ නම තියෙනවා. මීළඟට ගරු මන්ත්‍රී අජිත් කුමාර මැද්දෙගම මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි අපේ කරුණාපාල මන්ත්‍රීතුමා යෝජනාවක් ගෙනල්ලා තිබෙනවා. බඩු මිළ අඩු කරන්නට . වැඩියි කියලා. ඔබතුමාගේ යෝජනාවේ තියෙන බඩු මිළ පහළ හෙළීම ගැන මගේ පෞද්ගලික විරුද්ධත්වයක් නෑ. හැබැයි එදාට වඩා බඩු මිළ වැඩියි කියනවා නම් අපි ඒකට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. පැහැදිලි කිරිම් අවශ්‍ය නෑ ගරු සභාපතිතුමනි. මගේ කතාවෙන් පස්සේ පැහැදිලි කිරීම් කරන්න කියන්න. දැන් කියන්නේ 2015 ජනවාරි මාසයේ 08 වෙනිදායින් පස්සේ එදාට පෙර මේ රටේ තිබුණ බඩු මිළට වඩා අද බඩු මිළ පහල වැටිලා තියෙනවා. හැබැයි මේ තියෙන බඩු මිළට වඩා පහළින් භාණ්ඩ මහජනතාවට ලබලා දෙන්න පුළුවන් නම් ඒ තර්කයේ අපි ඉන්නවා. ප්‍රශ්නය තියෙන්නේ පසුගිය වකවානුවල අනවශ්‍ය විදිහට අදික පොළියට භාණ්ඩ අරගෙන, අධික පොළියට ණය

අරගෙන, අධික පොළියට ආධාර අරගෙන අද මේ රට විශාල අපහසුතාවයට පත් වෙලා තියෙනවා. පසුගිය 2015 ට තිබ්බ්ච ආණ්ඩුව විසින්. අද ඒවා ගෙවා ගන්න බැරිව. අද ලෝක වෙළඳ පොළේ තෙල් මිළ බැහැලා තියෙනවා. නමුත් ඒ වාසිය ඇයි අපේ ජනතාවට දෙන්න බැරි. ඩොලර් මිලියන 750 කට වැඩිය රිජින් ගිවිසුම නිසා මේ රටට අහිමි වෙලා තියෙනවා මුදල් ප්‍රමාණයක්. අද බංකොලොත්භාවයට පත් වෙලා තියෙනවා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව. ඒ මුදල් සහ ඒ මුදල්වල පොළිය ගෙවන්න ගිහිල්ලා. අද මේ අහිංසක ජනතාවට ගරු සභාපතිතුමනි ඒ වාසිය දෙන්න බැරි 2015 ට ඉස්සෙල්ලා තිබ්බ්චි ඒ බහුභූත ආණ්ඩුව කරපු අත්තනෝමතික ක්‍රියාව කියලා අපි පැහැදිලිවම මතක් කරන්න ඕනේ. එදා ඒ ණය ගත්තේ නැත්නම් රෙජින් ගිවිසුම වගේ හොර ගිවිසුම් මගින් මේ රටේ ආර්ථිකය විනාශ කලේ නැත්නම් ගරු සභාපතිතුමනි අද ලෝක වෙළඳ පොලේ තෙල් මිළ අඩුවීමේ ඒ භාග්‍ය උදා වෙන්නේ මේ රටේ දුක් විඳින ජනතාව දෙකෝටියක් වූ ජනතාව කියලා අපි තමුන්නාන්සේලාට පැහැදිලිවම කියන්නට ඕනේ. ඒ විතරක් නෙමෙයි අර පාරවල් ගැන කතා කළා. මම අහනවා නිලන්ත ගරු මන්ත්‍රීතුමාගෙන් ඔබතුමාගේ ආසනයේ ගම්වල පාරවල් හදලා තියෙනවා. මට පෙන්වන්න ඇන්දාන පාරේ මං තීරු දෙකක්. මට පෙන්වන්න ඒ පාරේ තියෙන්නේ එක මංතීරුවයි.

ගරු සභාපතිතුමනි මේ රටට ගත්තු ණය මුදල් මේ රටට ගත්තු ආධාර කෝටි ගණන් අපි ගෙවා ගෙන යනවා. අද කතා කරනවා මත්තල ගුවන් තොටුපල ගැන. ඒතට එතම ගුවත් සමාගමකින් පමණයි ගුවන යානයක් පැමිණෙන්නේ. බිය ඩුබායි ගුවන් සමාගම විතරයි ගිවිසුම අත්සන් කරපු නිසා ඒ ගුවන් සමාගම පමණක් අද මත්තල ගුවන් තොටුපලට ගේනවා. අද කෝටි ගණන් සල්ලි අරගෙන චීනයේ වන්දනාවේ ගිය තමුන්නාන්සේලා අද අපේ අගමැතිතුමා තමුන්නාන්සේලා බලන් නිකන් හරි උදව්වක් අරගන්න යන කොට අද ඒකට අවලාද කියන්න පටන් අරගෙන තියෙනවා. එදා චීනයට වැඳපු එදා චීනුන්ට කොණ්ඩ බැඳපු එවා අහගෙන හිටිය තමුන්නාන්සේලාද අද චීනයට බනින්නේ. අද චීනයෙන් මොනවා හරි උදව්වක් ගන්න පුළුවන්ද කියලා.ඒ නිසා ගරු සභාපතිතුමනි අපි කණගාටු වෙනවා අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිළ අද යම් ප්‍රමාණයකින් හරි අඩු කරන්න පුළුවන් 2015 ජනවාරි මාසයෙන් පස්සේ මේ යහපාලන ආණ්ඩුවට හැකියාව ලැබිලා තියෙනවා. අද අපේ මන්ත්‍රීතුමා ඇහැලියගොඩින් බඩු ටික අරගෙන මම කිව්වා එතුමාට අරන් එන්න බඩ පාර්සලය සභාවට කියලා. එතුමා කිව්වා බඩු පාර්සලයක සභාවට අරන් එන්න සුදුසු නැති හින්දා ගේන්නේ නැහැ කියලා. බැහැයි අරන් ගෙනාවා නම් කරුණාපාල මන්ත්‍රීතුමාට හීතල හැදෙනවා. මොකද අද ඒ බඩුවල මිළත් එක්ක එතුමා බඩු මල්ල ගෙනත් තියෙනවා. අද භාණ්ඩ මිළ යම් ප්‍රමාණයකින් අඩු වෙලා තියෙනවා. මම අහනවා ගරු සභාපතිතුමනි තමුන්නාන්සේලාට පැහැදිලි කරන්න ඕනේ නම් මගේ කතාවෙන් පස්සේ පැහැදිලි කරන්න. අද ඩීසල් මිළ 2015 අඩු කළාට පස්සේ ඒ වාසිය මහජනතාවට ගිහිල්ලා නැද්ද. තමුන්නාන්සේ ත්‍රීවිල් එක ගැන කතා කරනවා. එදා ත්‍රීවිල් එක වත්තේ ඉඳලා නගරයට එන කොට ඒ නගරයට ගහපු පැට්‍රල් ප්‍රමාණය අද තමන්ගේ සාක්කුවට දැනිලා නැද්ද. අද ඩොලර් එක ගැන කතා කළා. තමුන්නාන්සේලා කීප දෙනෙක් එක්ක අපිත් ගියානේ පහුගිය දවස්වල යුරෝපයේ. එදා යන කොට ඩොලර් එකේ ගාන කීයද. ආපහු එයාපෝට් එකට ඇවිල්ලා මාරු කරන්න ගියහම ඩොලර් එකේ ගාන කීයද. රු.141/- ට ඩොලර් එක බැහැලා තියෙනවා. මම ඒකයි තමුන්නාන්සේලාට කිව්වේ ඒ නිසා ගරු සභාපතිතුමනි මේ කරුණාපාල ගරු මන්ත්‍රීතුමාට අපි ආරාධනා කරනවා තමුන්නාන්සේලාගේ පක්ෂය නෙමෙයි

තමුන්නාන්සේලාගේ බහුතරයකගේ පක්ෂයේ නායකයා තමයි මේ රටේ ජනාධිපති හැටියට වාඩි වෙලා ඉන්නේ. අද වැරදි ගමනක යනවා නම් අඩුපාඩුවක් තියෙනවා නම් තමුන්නාන්සේලා සියළු දෙනා ඔය කියන පිරිපුන් උගත්භාවයෙන් යුත් පරිපූර්ණ පිරිසක් විදිහට අපි ආරාධනා කරනවා තමුන්නාන්සේලාට උපදේශන මණ්ඩලයක් හැටියට මේ ජනාධිපතිතුමාට උපදෙස් දෙන්න මේ බඩු මිළ අඩු කර ගන්න විදිහ ගැන. අද මේ පණ්ඩිතකමට සාටකයේ එල්ලිලා, අනාත සාටකයේ එල්ලිලා ඒකේ තියෙන වවුල්කාරකම් පෙන්වන්න මේ සභාවට ගේන කොට හිතන්න ඕනේ මේ 2015 ට ඉස්සර වෙලා මේ රට අනාත වෙච්චි තත්ත්වය මේ යුද්ධයේ ජයග්‍රහනයත් පෙන්න ගෙන තමන්ගේ පවුල් පසුබිම තර කර ගන්න කොටි ගණන් ආරාධ අරගෙන මේ රට විශාල ආගාදයකට දැම්මා. ඒ පව් අපි ගෙවන්න ඕනේ. ඒ පව් ගෙවන්න බැරිව මේ අහිංසක ජනතාවට අපි මේ ඉන්නේ. අපි යෝජනා කරනවා තමුන්නාන්සේලාට නිකන් මේ පළාත් සභාමේ මේ ගෞරවනීය සභාවේ කාලය නාස්ති කරන්නේ නැතුව තමුන්නාන්සේලාත් අනිත් මන්ත්‍රීවරු වගේ අතිගරු ජනාධිපතිතුමාට ගිහිල්ලා කියන්න මෙන්න අපේ යෝජනා කියලා කියන්න. මේ භාණ්ඩ අඩු කරන විදිහ ගැන කියන්න. අන්න එදාට පුළුවන් මේ තියෙන මට්ටමටවත් වඩා අඩුවෙන් දෙන්න පුළුවන් ක්‍රමවේදයක් මේ උගත් මන්ත්‍රීවරුන්ට සබරගමුවේ කරුණාපාල මන්ත්‍රීතුමා වගේ මන්ත්‍රීවරුන්ට කරන්න පුළුවන් කියලා මම මතක් කරමින් මගේ වචන කීපය හමාර කරනවා ගරු සභාපතිතුමනි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ගරු අජිත් කුමාර මැද්දෙගම මන්ත්‍රීතුමා දැන් කරුණාපාල මන්ත්‍රීතුමා තමුන්නාන්සේ පොඩ්ඩක් ඇහුන්කන් දෙන්න මම කියන දේ. මෙතුමන්ලා කතා කරන කතා කරන සැරේට ඔබතුමාට පිළිතුරු සපයන්න දෙන්න ගියොත් මට මේ සභාව කරගෙන යන්නට බෑ. මිනිත්තුවෙන් මිනිත්තුවට හැම එහෙකටම පැහැදිලි කිරීම් කරන්න දෙන්න බෑ. එක පාර තමුන්නාන්සේගේ කතාවේදී කියන්න. නැත්නම් කතා ටික අවසානයේදී කතා කරන්න. මිනිත්තුවෙන් මිනිත්තුවට හැම වෙලේම කතා කරන කොට මම කොහොමද සභාව අරගෙන යන්නේ. තව කී දෙනෙක් කතා කරන්න ඉන්නවද. සැරෙන් සැරේට නැගිටිනවා. ඕක කරන්න බැනේ.

මීළඟට ගරු මන්ත්‍රී ප්‍රභාත් මහේෂ් ද අල්විස් මැතිතුමා. ඔබතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී ප්‍රභාත් මහේෂ් ද අල්විස්***
***கௌரவ உறுப்பினர் பிரபாத் மஹேஷ த அல்விஸ்***
*Hon.Member Prabath Mahesha de Alwis*

---

ගරු සභාපතිතුමනි අද කරුණාපාල මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මේ බඩු මිළට පත් වෙලා තිබුණ තත්ත්වය බඩු මිළ වැඩිවීමත් සමඟ සමජයේ අපේ මහජනතාව ශ්‍රීලාංකිකයෝ මුහුණ දීලා තියෙන තත්ත්වය පිළිබඳව ඒවගේම රජයට බලපෑමක් කරන්න ඕනේ කියන යෝජනවා සමග එකඟ වෙමින් තමයි මගේ කතාව ආරම්භ කරන්නේ.

විශේෂයෙන්ම බඩු මිළ ගැන අද විපක්ෂයේ කතා කරන කොට අපිට පුංචි කණගාටුවක් දැනෙනවා. යතාර්ථය කතා කරන්න සූදානම් නැත්තේ ඇයි කියලා බලන් යන කොට. විශේෂයෙන් අද පල්ලේපොල මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා බඩු ලැයිස්තුවක්. මම කඩේට දැන් කතා කළා. පල්ලෙපොල මන්ත්‍රීතුමා ඔය කියන සැමන් ටින් එක තියෙනවා චීනයෙන් ගේන නෙප්චූන් කියන සැමන් ටින් එකක්. ඉන්නකෝ කියනකන්. කලබල වෙන්න එපා. අපිට දැන් වෙලා තියෙන්නේ ඕක තමයි. දැන් බලන්න මේ රටේ ලුනු බොහොම සරලව ගන්න මන්ත්‍රීතුමා ඉෆ්ලාර් මන්ත්‍රීතුමා කිව්වා වගේ ලුනු වසර දහයක ලුනු කිලෝ එක තිබුණේ රු.25/- යි. අද ලුන් තොග මිළ කීයද. රට වටේට තියෙන මුහුද රට වටේම ලුනු හදන්න පුළුවන් රටක් තියා ගත්ත අපි මහ ලොකු ආර්ථික කළමණාකරන ශූරයෝ ඉන්නවා කියපු එක්සත් ජාතික පක්ෂයේ මුදල් ඇමතිවරයාට බැරි වෙලා තියෙනවා ඔබතුමා අහගන්න. ඉන්නකෝ පොඩ්ඩක්. අමාරු ඇති. බැරි වෙලා තියෙනාව රු.25/- ට දීපු ලුනු ටික රු.60/- න් පල්ලෙහා හම්බන්තොට වරායෙන් පල්ලෙහාට දාන්න බෑ. අද රු.60/- යි තොග මිළ. මොකක්ද මේ රටට වෙලා තියෙන්නේ. මේ රටේ අව්වෙන් වේලිලා වතුර ටික වේලිලා හැදෙන ලුනු ටික රු.60/- ට තමයි තොග මිළට දාන්නේ. මෙන්න ආර්ථික කළමණාකරනය. මෙන්න ලාභය. එතකොට එදා 2016 අයවැය ඉදිරිපත් කරන කොට කිව්වා හාල් මැස්සෝ කිලෝ එකක උපරිම මිළ රු.410/- ක තියෙනවා කියලා. මේ අයවැය අරගෙන බලන්න ගරු මන්ත්‍රීතුමන්ලා. හාල් මැස්සෝ කිලෝ එකක් මම අද උදේ අරගෙන බැලුවා රු.600/- යි අවම මිළ. මෙන්න මේ යතාර්ථය. හාල් මැස්සෝ කිලෝ එකක් ගන්න බෑ. එතකොට මේ බඩු මිළ වැඩිවීම ඉතාමත් අර්බුදකාරී තත්ත්වයට පත් වෙලා තියෙනවා. අපි කැමැත්තෙන් වුණත් අකමැත්තෙන් වුණත් මේ යතාර්ථයට මුහුණ දෙන්න වෙනවා. හාල්මැස්සෝ ටික ගණන්. කරවල ටික ගණන්. ටින් මාළු ටික ගණන්. ලුහු ටික ගණන්. මේ දේවල් පාලනය කර ගන්න බැරි වෙලා තියෙනවා. හැබැයි තේ මිළ,රබර් මිළ,අපිට ආර්ථිකය ගෙන දෙන සියළුම දේවල් මිළ ගණන් අඩු වෙලා අපි ලොකු ආර්ථික අර්බුයකට මුහුණ දීලා තියෙනවා. දැන් අජිත් කුමාර මන්ත්‍රීතුමා කතා කළා විශේෂයෙන් මිහින්ලංකා ආයතනය ගැන. මට සමාවෙන්න ඔබතුමා නෙමෙයි . මන්ත්‍රීවරයෙක් කතා කළා මිහින්ලංකා ආයතනය ගැන. එයාර්ලංකා ආයතනය ගැන. කතා කළේ ෆාරුක් ගරු මන්ත්‍රීතුමා. මේ ආයතන වලින් පාඩු ලැබුවාලු. මේ ආයතන වලින් ලාභ ලැබුවේ නැතිලු. මේවා කොල්ල කැවලු. හරි මේවා කොල්ල කැවා නිසා ආණ්ඩු පෙරළියක් රටේ ඇති වුණා නම් අද වෙන කොට මිහින් ලංකා ආයතනයත් ශ්‍රී ලංකා එයාර් ලංකා ආයතනයත් ගොඩ ගන්න මේ අමාත්‍යාංශය මොනවද කරලා තියෙන්නේ කියලා ඔබතුමා කියන්න. මම ඔබතුමාට අභියෝග කරනවා මිහින් ලංකා ආයතනය ඇතුළු ආයතන 125 ක් භාරව තියෙන රාජ්‍ය ව්‍යවසාය අමාත්‍යාංශයේ ලේකම්ට මේසයයි පුටුවයි දාගන්න බැරි තත්ත්වයට අමාත්‍යාංශය පත් වෙලා තියෙනවා. තාම අමාත්‍යාංශයේ ගොඩනැගිල්ල හදාගෙන නෑ. මම ඔබතුමාට පැහැදිලිවම කියනවා. ඔබතුමා පස්සේ උත්තර දෙන්න. මේ අමාත්‍යාංශය තියෙන්නේ ලෝක වෙළඳ පොළේ මිළ වැඩිම ගොඩනැගිල්ලේ තමයි මේ අමාත්‍යාංශය තියෙන්නේ. මේ වෙන කොට කෝටි ගණනක් වියදම් කරලා වසර ගාණක් තිස්සේ මේ අමාත්‍යාංශයේ තට්ටුවක් හදනවා. තාම නිළධාරී ටික පුටුවල ඉඳගෙන නෑ. තාම මේ නිළධාරී ටික පුටුවල ඉඳ

ගන්නේ නැතුව මේ ආයතන 125 ක් ගොඩ ගන්න බැ කියන එක අපිට ප්‍රශ්නාර්ථයකින් තොරව පිළිගන්න වෙනවා. කිසිම වෙනසක් වෙලා නෑ. මොකක්ද මේ ආර්ථිකයේ වෙලා තියෙන වෙනස. කෝප් සිටි එක ගැන කෑ ගැහුවා. එදා මේ රටේ වර්තමාන අගමැතිතුමා කෙලින්ම කිව්වා ඔබට මතක ඇති ඡන්ද වෙලාවේ කෝප් සිටියට මම විරුද්ධයි කියලා. ප්‍රසිද්ධ මාධ්‍යට ඇවිල්ලා කිව්වා. අද

කෝප්සිටිය ගන්නට යනවා. හැබැයි අද කෝප්සිටිය ගන්න වෙන්නේ ඩොලර් මිලියන ගණනාවක් දඩයක් ගෙවලා. ඩොලර් මිලියන 125 ක පාඩුවක් ගෙවන්න වෙනවා. මේ පාඩුව එදා හෙජින් ගිවිසුම ගැන කිඹුල් කඳුළු හෙලන ඔබතුමන්ලා මෙ පාඩුව ගෙවන්නේ කොහෙන්ද. මේවා ඔබතුමන්ලා සල්ලි අච්චු ගහලා ගෙවලා ගෙවන්න වෙනවා. එහෙම නැත්නම් ඒවා මහ පොළොවෙන් ගෙවන්න වෙනවා. කිඹුරු කඳුළු හෙලන්න වෙනවා. කෝ මේ රටේ වෙනසක් කරන්න. ඔබතුමන්ලාට මේවා කරන්නද. මේ විදිහට මේ රට කොල්ල කන්නද. මේ රට මංකොල්ල කන්න නෙමෙයි දුන්නේ. මේ රට මංකොල්ල කන එක කරන්නේ. හැමදාමත් පරණ ආණ්ඩුවට බැන බැන පරණ ණය ගත්ත එක ගැන කියනවා. පරණ ආණ්ඩුවේ හෙජින් ගිවිසුම ගැන කියනවා. මේවා නොගත්තා නම් ගරු සභාපතිතුමනි අපි මේ හදපු හයි වේ එක හැදෙන්නේ නෑ. මේ පාරවල් කාපට් වෙන්නේ නෑ. එදා යුද්ධය ඉවර වෙන්නේ නෑ. මේ සියළු දේවල් කරන්න එදා ණය ගන්න සිද්ධ වුණා. හැබැයි මම අභියෝග කරනවා රටේ දළ ජාතික නිෂ්පාදනයට සාපේක්ෂව 2014 රාජ්‍ය ණය 102.5% ක් තිබුණා. මේක 70% දක්වා පහුගිය මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේ නැවැත්තුවා කියන එක මම බය නැතුව කියනවා. අද මේ සභාවේ කියනවා පුළුවන් නම් ඒක නැහැ කියලා කියන්න.

ඒක තමයි යතාර්ථය. හැබැයි අද රාජ්‍ය ණය වැඩි වෙලා . අද ඔබ දන්නවා රටේ විදේශ විනිමය ලොකු හිඟයක් තියෙනවා. ඩොලර් එක රු. 141/- යි කිව්වා. අද ඩොලර් එක රු. 144.18 යි. තෙල් මිළ ඩොලර් එකේ මිළ ඔබතුමන්ලා බොරු කියලා කියන හින්දා කියන්නේ. තෙල් මිළ එදා වර්තමාන රජය ආණ්ඩුව භාර ගන්න කොට ඩොලර් 65 ට තිබ්බේ

ලෝක වෙළඳ පොළේ බොර තෙල් බැරල් එක අද ඩොලර් 38 යි. භාගයට භාගයක් අඩු වෙලා. හැබැයි එදා 112 ට ඩීසල් ගහපු අපි අද ඩීසල් ගහන්නේ රු.95/- ට. මේ භාගයට භාගයක් අඩු වෙච්චි වාසිය මේ රටේ පුංචි මනුස්සයාට දීලා නෑ. බයිසිකලය අරන් යන ත්‍රීවිල් එක අරන් යන පුංචි මනුස්සයාට ඒ වාසිය දීලා නෑ. මේක නියමම ප්‍රෝඩාව. මේක තමයි නියමම වංචාව. මේක මොකුත් නෙමෙයි හේතුව මේකට ලූනු ටික කළමණාකරනය කර ගන්න බැරි මේ ආර්ථිකය කොහොමද ගොඩ ගන්නේ. මේ ආර්ථිකය කොහොමද රට හදන්නේ. අව්වට වේලිලා බිම හැදෙන ලූනු ටිකේ රු.25/- ඉඳලා රු.60/- ට වැඩි කරපු මේ රජය කොහොමද මේ ආර්ථිකය ගොඩ නගන්නේ කියලා අපිට මේක ලොකු ප්‍රශ්නාර්ථයක්. මේකට ප්‍රධාන හේතුව තමයි කිසිම සංවර්ධනය පුළුල් කරන්නේ නැතුව සමාජයට මුදල් පොම්ප කිරීම. ඒකයි වුනේ. දැන් අපේ තේවල රබර් වල සහනාධාර කපන කොට මේ රජය කල්පනා කරන්නට ඕනේ තේ,රබර් සහනාධාරය කැපෙන කොට නිෂ්පාදනය පුළුල් වෙන්නේ නෑ. නිෂ්පාදනය පුළුල් නොකර සමාජයට මුදල් පොම්ප කරපුවහම වෙන ප්‍රධාන කාරණය තමයි උද්ධමනය . අද අපි රු.60/- ට ලූනු කනවා නම් තව අවුරුදු දහයකින් අපිට රු.120/- කට වගේ තමයි මේ අර්ථ ක්‍රමයත් එක්ක ලූනු කන්න වෙන්නේ. මේ සරල ආර්ථික විද්‍යාත්මක න්‍යායන් නොදැන නෙමෙයි නමුත් මේවා අනුගමනය නොකිරීම

නිසා මේ රට බරපතල අර්බුදයකට මුහුණ දීලා තියෙනවා. ඒ නිසා මේ ඉතා කාලෝචිත යෝජනාවක් මේ පළාත් සභාවේ කරුණාපාල මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ මේ බල කිරීම අපි ප්‍රාදේශීය සභා පළාත් සභා මට්ටමින් මධ්‍යම රජයට කරන්නට ඕනේ. දැන් මේ මුළු රටම පිළිඅරන් තියෙනවා. එක්සත් ජාතික පක්ෂය ආර්ථික කළමණාකරනයේ ඉතාමත්ම දුර්වල අඩියකට වැටිලා තියෙන්නේ කියන එක මේ රටේ මහජනතාව දන්නවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

අපි අවසන් කරමු ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී ප්‍රභාත් මහේෂ් ද අල්විස්***
***கௌரவ உறுப்பினர் பிரபாத் மஹேஷ த அல்விஸ்***
*Hon.Member Prabath Mahesha de Alwis*
-----------------------------------------------------

ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තූතියි ගරු මන්ත්‍රීතුමා. මීළඟට යෙහෙයියා එම්. ඉෆ්ලාර් ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
-------------------------------------------

ගරු සභාපතිතුමනි හිටපු අමාත්‍යතුමා වත්මන් ගෙනෙන ලද යෝජනාව දිහා බැලුවහම ඕන කෙනෙකුට මේක බැලුවහම ඉතාමත් වැදගත් කියලා හිතෙන්න පුළුවන්. එකක් තමයි ගරු සභාපතිතුමනි ළඟ එන සිංහල හින්දු අලුත් අවුරුද්ද ඉලක්ක කර ගත් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය වල මිළ අඩු කරන

ලෙසත් වත්මන රජයට බල කර සිටින අතර මේ යෝජනාව ඉතා ඉක්මනින් අදාල බලධාරීන් වෙත යොමු කරන මෙන් ඉල්ලමි. මට එක පැත්තකින් මතක් වෙනවා අපේ මන්ත්‍රීතුමා ශ්‍රී ලංකාවේද ඉන්නේ. විශේෂයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේද ජීවත් වෙන්නේ. ඒවගේම අනිත් පැත්තෙන් බැලුවහම අපි බැලුවහම 2015 ජනවාරි මාසයේ 08 වෙනිදා ඉස්සෙල්ලා බඩු මිළ කොහොමද දැන් කොහොමද කියලා පොඩ්ඩක් සංඛ්‍යාත්මකව බැලුවොත් එහෙම අනිත් පැත්තෙක් කතා කළහම එදා තිබුණ ආර්ථිකයත් අද තියෙන ආර්ථිකයත් බැලුවහම සන්සන්දනාත්මකව බැලුවොත් අද කොහොමද මේක සිද්ධ වෙන්නේ කියලා අහන්න පුළුවන්. ඔබතුමා ගරු සභාපතිතුමනි මූලාසනයේ සිටින මේ මොහොතේ මං අහන්න කැමතියි 2015 ජනවාරි මාසයේ 08 වෙනිදායින් පස්සේ අපේ රාජ්‍ය සේවකයින්ට කොච්චර මුදල් ප්‍රමාණයක් වැඩි වුණාද. ඒ වැඩි වෙච්ච විදිහටම මේවා කළමණාකරනය වුණාද. එ එක්කම අපේ ඇමතිතුමා ගරු ඇමතිතුමා ඇහුවා බෝක්කුවක්වත් හැදුවද කියලා. මට කියන්න දුකයි ඇයි ගරු සභාපතිතුමනි 2015 විතරයි අපේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඇවිල්ලා වර්තමාන ජනාධිපතිතුමාට පැමිණියාට පස්සේ ග්‍රාම සේවා වසමකට ලක්ෂ දහයක් ලබා දීලා දැවැන්ත කාර්යය භාරයක් ඉෂ්ඨ කළා. ඒ මෙතුමන්ලා කියන දේ වෙන්න පුළුවන්. ඒ දැවැන්ත කාර්යය භාරය ඉෂ්ඨ කරපු පුද්ගලයින්ගේ ආණ්ඩුවක එක්තරා පුද්ගලයෙක් තමය අපි. මේ

දන්නේ නෑ. කැගහන්න පුළුවන්. තමුන්නාන්සේ මෙහේ නෙමෙයි ඉන්නේ. තමුන්නාන්සේ හිතන්නේ පහුගිය ආණ්ඩුව ගැන විතරයි.

ගරු සභාපතිතුමනි මේ 2016 වෙන කොට එක ග්‍රාම සේවා වසමකට ලක්ෂ 15 ක් ලබා දෙනවා. මේක අද එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් ජනතාව ලබන ජොෂ්ය ක්‍රියාවක් කියන එක අමතක කරන්න හොඳ නෑ. ඒ එක්කම වෙන දෙයක් තියෙනවා. ගරු සභාපතිතුමනි අද හුඟක් දෙනෙකුට හිතේ අමාරුයි. මේ තුළ ඉන්න බෑ. ඇයි තමන්ට බලය නැති වුණහම මේවා නෙමෙයි ජනප්‍රිය වෙන්න කතාවල් ගේනවා. අද රත්නපුර දිස්ත්‍රික්කයේ ගිහිල්ලා බැලුවහම 2015 ජනවාරි මාසයට ඉස්සෙල්ලා මේ කියන බඩුවල මිළයි ඔය කියන බඩුවල මිළයි ගත්තහම වෙනස බලා ගන්න පුළුවන්. එදා අත්‍යාවශ්‍ය ආහාර කියලා සහල් කිලෝ එකක මිළ කීයද. එදා පිටි කිලෝ එකක් කීයද. අද කිව්වා වැඩි වුණා කියලා. ඔබතුමා ගිහිල්ලා බලන්න නැවත වැඩි වෙච්ච මුදල අඩු කළා. වර්තමාන ආණ්ඩුවේ අග්‍රාමාත්‍යතුමා වැට් බද්ධ නැවතත් සංශෝධනය කරලා පරණ විදිහටම කරන්න ඕනේ කියලා මේ කාල වකවානුවේ ලබා දුන්නා. ඒ විතරක් නෙමෙයි මේ සියළු සහනාධාර දෙන්නේ කොහොමද. එදා අපි ණය ගෙවන්න නෙමෙයි ණය පොළිය ගෙවන්න අයි.එන්.එෆ්.එකට ගිහිල්ලා හිඟා කාලා ගිහිල්ලා ණය ගත්ත යුගයක් තිබුණේ. අද එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව අද බය නැතුව කියනවා ණයයි පොළියයි දෙකම එකට එකතු කරලා අපි ගෙවනවා කියන එක අද පැහැදිලිවම කියන්න පුළුවන්. ඒ නිසා තමයි සංචිත අඩු වෙන්නේ කියන එක මේ අය දන්නේ නෑ. ආර්ථිකයේ කළමණාකරනයත් දන්නේ නෑ. ආර්ථිකය කරන්නේ කොහොමද කියලා දන්නේ නෑ. ඉතිං මෙතනට ඇවිල්ලා ජනප්‍රිය වෙන්න කතා කළාට වැඩක් නෑ, මේ ගොල්ලෝ කියන්නේ මොකක්ද අපේ සංචිත ප්රමාණය අඩු වෙනවා. සංචිත ප්‍රමාණය ගෙවලා හරි ආර්ථික ණය ගත්ත ප්‍රමාණය පොළිය අඩු කරලා අපි දීර්ඝ කාලීනව මේ රටට සැලැස්මක් මේ රට ආර්ථිකය ගොඩ ගන්න පුළුවන් ශ්‍රේෂ්ඨ නායකයෝ දෙන්නෙක් තමයි අද ජනාධිපතිතුමයි,අග්‍රාමාත්‍යතුමයි කියන එක තමුන්නාන්සේ දන්නේ නෑ. ඒක හිතට දුකයි. හිතට අමාරුයි. වෙන මොකුත් නෙමෙයි අද වර්තමාන ජනාධිපතිතුමා හොඳ දැක්මක් ඇතුව යන්නේ. වර්තමාන අගමැතිතුමා මේ රටට ආදරෙයි. මේ රට ගොඩ ගන්න වුවමනයි. දූෂිතයින්ගෙන් තොරව රට පාලනය කරන්න යනවා. අද ඒ එක්කම අද කතා කරනවා ලූනු ගැන. අද මේ ලූනු වලට මොකක්ද වෙලා තියෙන්නේ. හම්බන්තොට තියෙන්නේ හිටපු ජනාධිපතිතුමා හොල්මන් කරනවා පිස්සු කෙළිනවා. අද බලය නැතුව ඉන්න බෑ. අද පිස්සු කෙළිනවා. අද රටේ ආර්ථිකව වට්ටන්න දඟලනවා. බය වෙන්න එපා ආර්ථිකය වට්ටන්න බෑ. අපි මෙ ආණ්ඩුව ගෙනි යනවා. අවුරුදු පහම ගෙනියනවා. මේ රටේ ජනතාවට සියළු සම්පත් ලබා දෙනවා. අපි 2020 දී තමුන්නාන්සේලාත් එක්ක අත් වැල් බැඳගෙන යන්න එනවා කියලා පැහැදිලිවම කියනවා. ඒක තේරුම් ගන්න ඕනේ. පහුගිය කාලය එක්කත් එක්ක බැලුවහම අපි පැහැදිලිවම ගත්තහම සෑම මිනිහෙකුටම මට නිලන්ත මන්ත්‍රීතුමා කිව්වා එන්න යන්න කියලා මේ රෙදි සාප්පුවල. ඔබතුමා එන්න මාත් එක්ක දැන් යන්න. රත්නපුරයට ගිහිල්ලා මගෙ ගොඩනැගිල්ලක තමයි තියෙන්නේ. සී.අයි.බී. ආයතනය. මිනිස්සු ඇතුළට ගන්නේ 500 , 500 තියාගෙන. පැය ගාණක් වේලෙනවා. ඊළඟට ඔබතුමා එන්න නෝලිමිට් ආයතනය. ඔබතුමා එන්න 500 ක් ගන්නවා එළියේ තියාගෙන මිනිස්සු ගන්නේ. අද මේ තමුන්නාන්සේ තාම දන්නේ නෑ. ගරු සභාපතිතුමනි රජයේ සේවකයින්ට සහ විශ්‍රාමිකයින්ට වැටුප ලැබෙන්නේ 08 වෙනිදා. 08 වෙනිදා ඉස්කෝලයේ නිවාඩු දෙනවා. ඊට පස්සේ මතක තියා ගන්න රත්නපුරේ නෙමෙයි තමුන්නාන්සේලාට

ඇඟිල්ලක් අල්ලගෙන යන්න බෑ. මිනිස්සුන්ට සල්ලි හම්බ වෙන්න ඕනේ. වැටුප හම්බ වෙන්නේ 08 වෙනිදා. රජයේ සේවකියන්ට. ඒ එක්කම හුඟක් තැන්වල පඩි දෙන්නේ 08 වෙනිදා. විශ්‍රාමිකයින්ට වැටුප ලැබෙන්නේ 08 වෙනිදා. ඉස්කෝලයේ නිවාඩු ලැබෙන්නේ 08 වෙනිදා. මේක තේරුම් ගන්නේ නෑ. මම ඒකයි කිව්වේ අනේ ශ්‍රීලංකාවේද ඉන්නේ. රත්නපුරේ ද ඉන්නේ. හිතේ අමාරුයි දුකයි

තමයි මේක නැති වුණහම බලය තණ්හාවෙන් වෙන වෙන දේවල් කරන්න පුළුවන්. සමහර උදවිය නිළ කාලයේ ඉඳලා අවුරුදු දෙකකට ඉස්සෙල්ලා විසුරෝපුවා ඉල්ලගෙන කාලා දැන් දුකයි. මොනවා කරන්නද. දුක් විඳලා වැඩක් නෑ. ඒ නිසා ගරු සභාපතිතුමනි අද රටේ බඩු මිළ පොඩි වෙනසක් වෙන්න පුළුවන්. ආර්ථිකය හොඳ ශක්තියක් තියෙනවා. ඒවගේම මිනිස්සුන්ට මිළදී ගන්න පුළුවන්. අවුරුද්ද සාර්ථකව ගමන යන්න පුළුවන්. මෙ ලබන්නා වූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද මම ප්‍රාර්ථනා කරනවා සියළු දෙනාගේ සිතුම් පැතුම් ඉටු වෙලා 2016 අවුරුද්දේ සිංහල අවුරුද්දෙන් පස්සේ සියළු දෙනාට යහපාලනයක් තුළ යහපත් ජීවිතයක් ගත කරන්නට සියළු සම්පත් ලැබිලා ආර්ථිකය ශක්තිමත් වෙලා එක්සත් ජාතික පක්ෂය ශ්‍රීලංකව තුළ වැජඹේවා යැයි ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ගරු ඉෆ්ලාර් මන්ත්‍රීතුමනි. මීළඟට අජිත් ශාමින්ද ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අජිත්*** *ශාමින්ද*
***கௌரவ உறுப்பினர் அஜித் ஷாமிந்த***
*Hon.Member Ajith Shyaminda*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි ජී.ඇම්.කරුණාපාල මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක්

කියලා ප්‍රකාශ කරමින් අදහස් කීපයක් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙන්නේ. මං හිතන්නේ මේ ඉෆ්ලාර් මන්ත්‍රීතුමා මේක වේගයෙන් කියාගෙන කියාගෙන ගියාට පස්සේ මේ ඔක්කෝම හරි කියලා හිතනවා ඇති. නමුත් ගමේ ජනතාවගෙන් ඔබතුමා ගිහිල්ලා ඇහුවොත් එහෙම මේ වෙනස කියා දෙයි.

2016 ජනවාරි 08 වෙනිදායින් පස්සේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා කිව්වා 80% ක් තියෙන වක්‍ර බදු අඩු කරනවා කිව්වා 60%. ඊට පස්සේ 20% තිබ්බ්ච සෘජු බදු 15% අඩු කරනවා කිව්වා. දැන් අද මේ වෙන කෙට ඒ අයවැයේ කියපු කිසිම දෙයක් වෙලා නෑ. සියළු භාණ්ඩවල මිළත් වැඩි වෙලා තියෙනවා. මේක ගරු සභාපතිතුමනි අපි පැහැදිලිවම දන්නවා මේ භාණ්ඩ මිළ වැඩි වෙන්න එකම හේතුව රාජ්‍ය ආදායම ලබා ගැනීමේදී සෘජු බදු පුළුවන් තරම් අඩු කරලා වක්‍ර බදු පුළුවන් තරම් වැඩි වෙලා තියෙනවා. ඒකයි මේකට හේතුව. දැන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා පාර්ලිමේන්තුවේ අයවැය ඉදිරිපත් කරන කොට කිව්වේ සෘජු ව්‍යාපාරිකයින්ගෙන් ආපු පුද්ගලික බදු සීමාව 15% දක්වා අඩු කරනවා. ඒවගේම වක්‍ර බදු 80% 60% දානවා කිව්වා. අද ඒක නෙමෙයි ඒකේ අනිත් පැත්ත වෙලා තියෙන්නේ. අද වක්‍ර බදු තව තවත් වැඩි කරලා. අත්‍යාවශ්‍ය භාණ්ඩ කියලා ඒවා ඇත්තටම අත්‍යාවශ්‍ය නෙමෙයි. අපිට කොත්තමල්ලි අත්‍යාවශ්‍ය නෑ. කහ අත්‍යාවශ්‍ය නෑ. ඒවගේ එක අතකින් විපක්ෂනායකතුමාත් දන්නේ නෑ රටේ

අත්‍යාවශ්‍ය භාණ්ඩ මොනවද කියලා.කරුණාපාල ඇමතිතුමා කිව්වේ මේ අවුරුදු සමයේ එක අතකින් මේ භාණ්ඩ වලට සහනයක් දෙන්න. කරවල ටිකක්, හාල්මැස්සෝ,ඒවගේම කිරි පිටි, පාන් පිටි,හාල්. දැන් ෆාරුක් මන්ත්‍රීතුමා කියනවා හාල් මිළ රු.89/- යි කියලා. වී ගොවියෝ උතුරුට ගිහිල්ලා බැලුවොත් රු.19/- යි

රු.17/- යි වී මිළදී ගන්නේ රු.17/- ට රු.18/- ට. හාල් මිළ රු.89/- යි රු.90/- යි කියනවා. රු.100/- ටත් තියෙනවා. දැන් වී ගොවියා වී කිලෝ දෙකක් විකුණලා බුලත් විටක් ගන්නවා. රු.20/- යි. අද. බුලත් විටක් විතරයි ගන්න පුළුවන්. දැන් ඔබතුමා කියන විදිහට වී කිලෝ එක හමාරකින් තමයි හාල් කිලෝ එකක් කොටන්න පුළුවන්. පුදුම මුදලක් යන්නේ. අනේ සභාපතිතුමා මේ කියන කිසිම ප්‍රතිලාභයක් ජනතාවට ලැබිලා නෑ කියන එක අපි පැහැදිලිවම දන්නවා. ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ කරුණාපාල ඇමතිතුමා ඉල්ලා සිටින්නේ මේ යෝජනාව සම්මත වුණා කියලා. මම නම් අපේක්ෂා කරන්නේ නෑ ජනතාවට ක්ෂණික සහනයක් ලැබෙයි කියලා. නමුත් ජනතාව අපේක්ෂා කරන්නේ ජනතාවට සහනයක් දෙන්න. එහෙම නැත්නම් මේවා මිළදී ගැනීමේ හැකියාව වැඩි කරලා දෙන්න කියලා. අපි ගිය සභාවේ කතා කරපු ඒ පොහොර සහනාධාරයක් එක්ක අපි කතා වුණා ජනතාවට මේවා මිළදී ගැනීමේ හැකියාවත් උපරිම විදිහට අඩු වෙලා තියෙන්නේ. අද අපේ පළාතේ ජනතාව තේ දල්ලෙන් එක්කෝ රබර් ටික විකුණලා එක්කෝ පතලක් කපලා ඒ විදිහට තමයි ආදායමක් හොයා ගත්තේ. අද ඒ හැකියාව බිංදුවට බැහැලා තියෙන්නේ. මෙතන නිලන්ත මන්ත්‍රීතුමා උදාහරණයක් ගෙන හැර දැක්වූවා. තේ දළු ටික විකුණලා ඒ වැඩ කරන සේවකයින්ට පඩි නඩි ටික ගෙවලා ඉවර වෙන කොට අතට ඉතුරු වෙන ගාන කීයද කියලා එතුමා කිව්වා. ඒ තත්ත්වය තමයි ජනතාව හැම තැනකටම උදා වෙලා තියෙන්නේ.

ඒ නිසා ගරු සභාපතිතුමනි මේ ආණ්ඩුව කොච්චර කිව්වත් කොච්චර හයියෙන් කිව්වත් කොච්චර කරුණු පැහැදිලි කළත් ජනාධිපතිතුමා අගමැතිතුමා මහ ආණ්ඩුවෙන් ඒ සහනය ඒ ජනතාවට ලැබිලා නෑ. ණය බර ගැන කතා කරනවා.

අපි දන්නවා වැඩිම වංචාව ප්‍රෝඩාව කරලා තියෙන්නේ ඒ භාණ්ඩාගාර බිල්පත් ගනුදෙනු මිලියන 12 කට වැඩිය තමයි ඒ භාණ්ඩාගාර බිල්පත් මිළදී ගන්නේ. වාර්ෂිකව කෝටි පන්දාහක් අපිට ගෙවන්න වෙලා තියෙනවා අවුරුදු 30 කට. ඒවා ගැන අද කතා කරන්න දෙයක් නෑ. ඒවා ගැන එවා ගැන තමයි මේ ආණ්ඩුවේ හැකියාව අඩු කරගෙන තියෙන්නේ. ඒ නිසා අපි පැහැදිලිවම දකිනවා මේ කෙරෙන සංවර්ධනයකුත් නෑ බඩු ටික ලාභයට ගන්නත් නෑ. ඒ අනුව අද මේ 2016 අවුරුද්ද ජනතාවට ඉතාම නමට තියෙන අවුරුද්දක් බවට පත් වෙලා තියෙනවා. අපි පැහැදිලිවම දැක්කා වෙනත් කාලවල් වල මේ අවුරුදු සමයට යම් සහනයක් දෙනවා. දැන් අගමැතිතුමා මුදල් ඇමතිතුමා පාර්ලිමේන්තුවේ විශේෂ ප්‍රකාශයක් කරලා අත්‍යාවශ්‍ය භාණ්ඩ අඩුයි කියලා කිව්වට වෙළඳ පොළේ අඩුවීම වෙන්නේ නෑ. එහෙන් දාන චක්‍රලේඛණ වෙළෙන්දා ඒවා ක්‍රියාත්මක කරන්න් නැති තත්ත්වයට පත් වෙලා තියෙන්නේ. ඒක නිසා මේක අද විහිළුවක් බවට ජනතාව පත් වෙලා ජනතාව කබලෙන් ලපට වැටිලා තියෙන්නේ.

ඒ නිසා ගරු සභාපතිතුමනි අපි පළාතේ ජනතාව විදිහට අපි යෝජනා කර සිටින්නේ ජනතාවට යම් සහනයක් ලබලා දිය යුතුයි. ජනතාව හැමෝම මේ ඉහළ පෙළේ ආදායමක් ලබන අය නෙමෙයි වැඩි හරියක් ඉන්නේ. ඒ නිසා අද දැක්කා අර එතුමා කිව්වා වගේ හැමෝටම අපේ පුංචි පවුලට කාර් එකක් ගන්න පුළුවන් කියලා එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙන්න මේ ජයග්‍රහනය කරන්න කියලා කිව්වා. අද කුඩා කාර් එකක මිළ කීයද. දහතුන් ලක්ෂ හැත්තෑපන්දාහට තිබ්බ්වි වාහනය අද ලක්ෂ

20 යි. කාර් කන්න නෙමෙයි ගරු මන්ත්‍රීතුමා කාර් යන්න. පොඩි මිනිහාත් කැමතියි බයිසිකලයේ ගිය මිනිහා පොඩි කාර් එකක් ගන්න.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------

අපි අවසන් කරමු ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අජිත්** ශ්‍යාමින්ද*
***கௌரவ உறுப்பினர் அஜித் ஷாமிந்த***
*Hon.Member Ajith Shyaminda*
--------------------------------------------------------

ඒ නිසා ගරු සභාපතිතුමනි මේවා එකින් නෙක කියන කොට මේවා පැහැදිලි කරන්න පුළුවන් අද ජනතාව පැත්තෙන් ඉතාම අසීරුතාවයට පත් වෙලා ඉන්නේ. ඒ නිසා මේ යෝජනාව මේවා ගැන අපි කතා නොකර හිටියොත් ජනතාවත් හිතනවා අපි මේවා අනුමත කරනවා කියලා. ඒ නිසා කරුණාපාල මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව මේ ආණ්ඩුවට අපි කියා සිටින්නේ අපිට වෙන විරෝධයක් නෑ. පුළුවන් තරම් ඔබතුමන්ලා කියපු විදිහට සහන ටික දෙන්න. දුප්පත් මිනිස්සුන්ට පුළුවන් සහනයක් ලබලා දෙන්න කියන යෝජනාව තමයි කියා සිටින්නේ.

ඒ නිසා ඒ යෝජනාව අනුමත කරමින් මේක අදාල බලධාරීන්ට ගරු අග්‍රාමාත්‍යතුමාට, ගරු ජනාධිපතිතුමාට විශේෂයෙන් මුදල් ඇමතිතුමාට මොකද එතුමා කියන කිසිම දෙයක් අපිට දකින්නේ නෑ. මේවා කෙරෙනවා. ඒ නිසා මේ යෝජනාව කඩිනමින් යවන්න කියන යෝජනාව මතක් කර සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------

ස්තුතියි ගරු අජිත් මන්ත්‍රීතුමනි. මීළඟට ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
---------------------------------------------------

ගරු සභාපතිතුමනි බඩු මිළ වැඩිවීම සම්බන්ධයෙන් ගෙනාපු යෝජනාවට අපේ කරුණාපාල මන්ත්‍රීතුමා කිව්වා යහපාලන ආණ්ඩුවට කුඩා පාලමක්, බෝක්කුවක්වත් හදා ගන්න බැරි වුණා කියලා ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි 2015 ජනවාරි 08 වෙනිදා ආණ්ඩුව ගත්තට පස්සේ මම රට ගැන කියන්නේ නෑ ඇහැලියගොඩ ආසනය ගැන කිව්වොත් ගරු සභාපතිතුමනි නව කෝටි අනූ ලක්ෂයක වැඩ කරලා තියෙනවා අපි ග්‍රාම සේවක වසම් 69 යක. මේවා ගත්තහම ගරු සභාපතිතුමනි පහුගිය කාලයේ මම කියන්නේ අඟල් 4 ක් කොන්ක්‍රීට් එක දානවා කියලා හෙන්වයියලාට කොන්ත්‍රාත් දීලා අඟල් එක හමාරයි දෙකයි ඒවා හය මාසයයි , අට මාසයයි,අවුරුද්දයි පාච්චි වෙන්නේ. පාරක්. මේ විදිහට ගත්තහම ගරු සභාපතිතුමනි සුණු විසුණු කෙරුවා. දැන් මේ වෙන කොට ලක්ෂ 10 ක් ඇවිල්ලා තියෙනවා එක වසමකට. ආයෙත් ඇවිල්ලා අනූ කෝටි අනූ

ලක්ෂයක්. ඇහැලියගොඩ ආසනයේ දාසය කෝටියක අපි වැඩ කරනවා නම් මුළු රටේම කොච්චර වැඩ කරලා තිනේන ඇද්ද කියලා හිතන්නට ඕනේ. හුන්නන්ගොල්ල

පාලම තමුන්නාන්සේලාට මතයි මේ පළාත් සභාවේ 16 අවුරුද්දක් ඉල්ලුවා දුන්නේ නෑ, යහපාලන ආණ්ඩුව ආපු ගමන් මුල් ගල් තිබ්බා දැන් ලබන මාසයේ හරි ඊළඟ මාසයේ හරි විවෘත කරනවා ගරු සභාපතිතුමනි. හුන්නන්මුල්ල පාලම. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ 2013 හැදුවා අම්බලන්පිටිය ගොඩගම්පොල පාලමක් ගරු සභාපතිතුමා ගිහිල්ලා විවෘත කළේ. 2016 දෙවෙනි මාසයේ හතර වෙනිදා පාලම දෙකට කැඩිලා විසි වුණා. මේ ආණ්ඩුවේ නෙමෙයි. දැන් තමුන්නාන්සේලා 2015 කිව්වා අපේ නායකතුමාට අවුරුදු දෙකක් රට කරන්න කියලා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඇවිල්ලා සති තුනක් යන කොට උද්ඝෝෂණ කරනවා. මේවා මොනවද මේ. බලයේ හිටියා ඊට පස්සේ බලයෙන් පහ වුණාට පස්සේ ගෙදරට වෙලා විශ්‍රාම සුවයෙන් ජීවත් වෙන්න ඕනේ ගරු සභාපතිතුමනි. මෙන්න මේවා හිතන්න ඕනේ.

බඩු මිළ ගත්තහම මේවා වැඩියි වැඩියි කියලා කියන කොට තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ තිබුණ බඩු මිලයි , අද බඩු මිළයි ගණන් හදලා බලන්න තමුන්නාන්සේලාට තේරෙනවා මොකක්ද වෙලා තියෙන්නේ කියලා. දැන් ගසා කැමක් නැහැ. තේ මිළ දවසින් දවස අඩු වෙනවලු. තේ කිලෝ එක අඩු වුණේ අයිආර්සී කාලයට කසල තේ කලවම් කරලා ලෝකයටම දෙන කොට තේ මිළ මෙහෙන් බහිනවා. තමුන්නාන්සේලාට ඕවා ගැන කතා කරන්න අපිට කාල වේලාව නෑ. අපිට වැඩ ගොඩක් තියෙන නිසා කාලය ලබාදීම සම්බන්ධව තමුන්නාන්සේට ස්තුති කරමින් මගේ මේ කෙටි වචන ස්වල්පය හමාර කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

----------------------------------------------------------

ස්තුතියි ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි. මීළඟට අනුර අලගියවන්න මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අනුර අලගියවන්න***
***கௌரவ உறுப்பினர் அனுர அலகியவன்ன***
*Hon.Member Anura Alagiyawanna*

-----------------------------------------

ගරු සභාපතිතුමනි අද තත්ත්වයට ගැලපෙන විදිහට කරුණාපාල ගරු මන්ත්‍රීතුමා මේ ළඟ එන සිංහල හින්දු ජාතික අලුත් අවුරුදු සමයේ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය වල මිළ ගණන් අඩු කිරීම සඳහා යෝජනාවක් ගෙන ඒම සම්බන්ධව සහ ඒ යෝජනාවට අදහස් එළ කරන්න අවස්ථාව ලැබීම සම්බන්ධව ගරු සභාපතිතුමනි ස්තුතිවන්ත වෙනවා. අද විවිධාකාර කරුණු කාරණා අනුව මේ ටික වෙලාව තුළ බොහෝ කතාවන් අහන්නට අපිට ලැබුණා. හැබැයි පෙර පැවති ආණ්ඩුව ගැන විවේචනාත්මතව කතා කළා මිස ලබා ගත්තු ආණ්ඩුවෙන් ජනතාවට සහන සලසන සහ සහන දෙන ක්‍රමවේදය පිළිබඳව නෙමෙයි කතා කළේ. ළඟ එන සිංහල හින්දු ජාතික උත්සවයට මිනිස්සුන්ට ලුනුත් නැති කැඳත් නැති තත්ත්වයක් පේන්න තියෙන්නේ. කතා කරන කොට කිව්වේ ලුනු කිලෝ එක 25 ට තිබුණේ. හැබැයි අද ලුනු කිලෝ එකේ පැකට් එක එන්නේ නෑ ලුනු ග්‍රෑම් 800 පැකට් එක එන්නේ. ග්‍රෑම් 800 රු.65/- න්

එහා. ජය වේවා යහපාලනයට. මෙන්න කතන්දරය.රු.65/- යි.රු.70/- යි, රු.80/- යි පාලන මිළත් නෑ. පොළවල්වල රු.25/- ට, රු.30/- ට තිබුණ ලූනු පැකට් එක අද

හොයා ගන්නට නෑ. රට වට කර මුහුද තිබුණට කට්ට මිදෙන්න පැවුවට රට වටේ මුහුද තිබුණට ලුනු ටික හදලා දෙන්න බැරි රාජපක්ෂ ආණ්ඩුවට බැන අඬ ගහන එක විතරයි මේ අවුරුද්දක් පැනපු කාල සීමාව තුළ කළේ. වෙන මොකවත් කළේ නෑ. ප්‍රජාතන්ත්‍රවාදය ගැන මහා ඉහළින් කතා කරන්නේ. හැබැයි පහුගිය 31 වෙනිදාට ප්‍රාදේශීය සභා විසුරෝලා දාලා අවුරුද්දක් වෙනවා. ඒවායේ හිටපු මහජන නියෝජිතවරු පාරට බැහැලා පෙත්සම් දස ලක්ෂයක් අත්සන් කිරීමේ වැඩ පිළිවෙල කළා. ආණ්ඩුවේ කිසිම කෙනෙකුට ගානක්වත් තිබුණේ නෑ.

අද ප්‍රාදේශීය සභාවල පිච්චේච්චි ලයිට් එකට ලයිට් එකක් දාන්නේ නෑ. විදුලි බුබුළක් දාන්නේ නෑ. මහජන ආයතනය වහලා දැම්මා වගේ. ඒවා අපිට විතරක් නෙමෙයි හැබැයි දිනන පැත්තට යන්නේ ප්‍රාදේශීය සභා ඡන්දය තියන්න ඕනේ. නමුත් මේ රජය කන්නෑසුණා වාගේ ඉන්න එක තමයි අපිට පේන්න තියෙන්නේ. හැබැයි බඩු මිළ ගැන කතා කරනවා. මේ අනන් මනන් ගැන කතා කරන්න සිද්ධ වෙනවා. නාඩු කිලෝ එක රු.70/- යි. අද මේ ගොඩකවෙල නගරයේ කහවත්ත නගරයේ සාමාන්‍ය මිළ. හැබැයි කිව්වේ රු.70/- යි මේවා අද පවතින බඩු මිළ. දැන් කිව්වනේ ඩොලර් එක රු.41/- යි කියලා. ඩොලර් එක රු.144.81 යි. ඩීසල්වල මිළ ගණන් බැස්සුවා. පැට්ට්‍රල් මිළ අඩු කෙරුවා. තේ මිළ අඩු කෙරුවා. රබර් මිළ අඩු කෙරුවා. බොහොම හොඳයි මේ ආණ්ඩුව අද බොර තෙල් බැරල් එකක මිළ ඩොලර් 37 යි. ඉතිං කොහොමද 65 ට තිබුණේ. මේකේ වාසිය ජනතාවට ලබා දිය යුතුයි. පැට්ට්‍රල් මිළ අඩු කෙරුවා. නමුත් ත්‍රීවිල් ගාස්තුව එහෙමමයි. ඒකත් හදන්න ඕනේ. මේවා

කියලානේ ආණ්ඩුව ගත්තේ. පාලන මිළ දානවා කිව්වා සැමන් වලට රු.125/- යි. ගරු සභාපතිතුමනි දැන් සැමන් වලට

රු.140/- යි. ජැක් මැකරල් හොඳම එක රු.290/- යි. 2014 අඩුයි. කියන්නකෝ අපි 2014 ගැන කතා කරන්නේ නෑ ගරු සභාපතිතුමා. මේ රජය බලයට පත් වුණේ මිනිස්සුන්ට මහා බලාපොරොත්තු කන්දරාවක් දීලා. යහපාලනය දෙනවා කිව්වා. යහපාලනය දෙනවා කිව්ව මිනිස්සුන්ට අවුරුද්දක් වෙනවා ප්‍රාදේශීය සභා විසුරෝලා තාම ඡන්දය තිබ්බේ නෑ. මොකක්ද ගරු මන්ත්‍රීතුමා කතන්දරය. මොනවද කතාව. හැම තැනම උද්ඝෝෂණ. අද පාරට බැහැලා කයිවාරු ගැහුවට එක 50 ක් එකතු කරලා ගමේ රැස්වීමක් තියා ගන්න බෑ. ඒකයි තත්ත්වය. ගමට ගිහිල්ලා කතා කරන්න බෑ. පරිප්පු දෙනවා කිව්වේ කීයටද. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ කිඹුල් කඳුළු හෙලනවා. අත්‍යාවශ්‍ය භාණ්ඩ දහ තුනක මිළ අඩු කෙරුවා කියලා. කහ, කොත්තමල්ලි, උඳු පිටි. ඒකට සාම්බ්‍රානි එක්කහු කරන්න උදේ සවස දුම් අල්ලන හින්දා. අත්‍යාවශ්‍ය වෙන හින්දා. අත්‍යාවශ්‍ය භාණ්ඩ දහ තුනක මිළ අඩු කෙරුවා ගරු සභාපතිතුමනි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

අපි අවසන් කරමු ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අනුර අලගියවන්න***
***கௌரவ உறுப்பினர் அனுர அலகியவன்ன***
*Hon.Member Anura Alagiyawanna*

---

සුදු සීනි කිලෝ එකක තොග මිළ රු.142/- යි. සිල්ලර මිළ රු.105/- යි. රු.102/- යි. සුදු. රු.105/- යි. 98/- දෙන්න

පුළුවන් නම් ඔබතුමාට වඩා හොඳයි. 98/- ගෙන්නා මේ උත්සව සමයේ මිනිස්සුන්ට අඩුවෙන් දෙන්න. තමුන්නාන්සේට පුළුවන් නම් ඒක හොඳයි. එහෙම කරනවා කියලා ගත්තු තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ පරිප්පු තොග මිළ රු.165/- ය. රු.170/- යි සිල්ලර මිළ. ලොකු පරිප්පුවල මිළ රු.210/- යි. සල්ලර මිළ රු.220/- යි. මේ අඩුවෙන් දෙනවා කියලා ගත්ත ආණ්ඩුව. අඩුවෙන් කරනවා කියලා කිව්ව ආණ්ඩුව. මේ යහපාලන ආණ්ඩුව ගරු සභාපතිතුමනි මේ සිංහල අලුත් අවුරුද්දට ලුනුත් නැති කැඳත් නැති මේ ආණ්ඩුවේ මිනිස්සුන්ට පොරොන්දු දීලා ගත්ත ආණ්ඩුවට කියන්නට වෙන්නේ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

අපි ගරු මන්ත්‍රීතුමා අවසන් කරමු.

***ගරු මන්ත්‍රී අනුර අලගියවන්න***
***கௌரவ உறுப்பினர் அனுர அலகியவன்ன***
*Hon.Member Anura Alagiyawanna*
-------------------------------------------

ඒ නිසා අපේ මේ කරුණාපාල මන්ත්‍රීතුමාගේ යෝජනාව බොහොම හොඳ යෝජනාවක්. ඒ නිසා මේ ආණ්ඩුව මිනිස්සුන් ගැන හිතලා ජනතාවගේ පැත්තෙන් හිතලා දීපු පොරොන්දු ගැන උදේ හවා සිහිපත් කරලා මේ ආණ්ඩුව ජනතාවට සේවයක් කරන්නට අධිටන් කර ගත්තා කියලා මේ වෙලාවේදී මතක් කරමින් මට කාලය ලබා දුන්නාට බොහොම ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

ස්තූතියි ගරු අනුර අලගියවන්න මන්ත්‍රීතුමනි. මීළඟට රම්‍ය කුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ***
***கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க***
*Hon.Member Ramya Kumara Weerasinghe*
---------------------------------------------------------

ගරු සභාපතිතුමනි මම ස්තූතිවන්ත වෙනවා ඔබතුමා මට අවස්ථාව ලබාදීම ගැන. දැන් මේ කරුණාපාල ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන් කතා කරන කොට අපේ එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරු කතා කරන හැටි බලාගෙන හිටියම තමයි මට හිතුණේ කොහොම හරි කතා කරන්න ඕනේ කියලා. හරියට කතා කරන්නේ බඩු ලාභයි වගේ. බඩු ලාභයි වගේ කතා කරන කට්ටිය අපි මතක් කරන්න ඕනේ ගරු සභාපතිතුමනි අපේ ගමේ ඉන්නවා මන්තරකාරයෝ. ඒ මන්තරකාරයෝ පටන් ගන්නවා කතාව අපි කියන එක දන්නේ නෑ. කියන එක එකක්වත් අපිට තේරෙන්නේ නෑ. කියනවා විතරයි. අපේ හිතේ ඉතිං මේක හොඳ මන්තරයක්. අර පටන් ගන්න එක විතරක් යාන්තන් තේරෙනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කියන එක විතරයි අපිට තේරෙන්නේ. මොකුත් නෑ කෑගහනවා. හොඳ වෙලාවට මේ දවස්වල වැඩිය කන්නේ නැති හින්දා හොඳයි නැත්නම් මේක හෝදන්න වෙනවා. ඒ විදිහට දිගට හරහට

කතා කරනවා. කියන දේ මොකුත් තේරෙන්නේ නෑ කියා ගෙන කියාගෙන යනවා. ඒක තමයි එගොල්ලන්ගේ

ක්‍රමවේදය. මොකක්ද හේතුව. මේ කියන ඒවාට දෙන්න උත්තර නැති එක. ඒ නිසා පැමැදිලිවම කතා කරලා පැහැදිලිවම උත්තරයක් දෙන්නේ නෑ. අර විදිහට ගමේ මන්තරකාරයා වගේ එක දිගට කියාගෙන යනවා. ඒ නිසා මම මතක් කරනවා බොහොම පැහැදිලිවම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ ආණ්ඩුව ගන්න කොට මේ ආණ්ඩුව පෙරලන කොට ගෙනාවා චෝදනා ටිකක්. පළවෙනි එක තමයි මේ අත්තනෝමතික විධායක ජනාධිපති ක්‍රමය අපි අයින් කරන්න ඕනේ.

දෙවෙනි එක තමයි හොරකම උතුරලා ගිහිල්ලා තියෙන්නේ ඒක හින්දා හොරකම සහ මහා පරිමාණ වංචා නවත්තන්න ඕනේ. අනිත් එක තමයි ළමා අපචාර දරුවෝ මරණ එක මැරෙන එක අපි නවත්තන්න ඕනේ. අනිත් එක තමයි මත් කුඩු එතනෝල් වැහි වැහලා මේක නවත්තන්න ඕනේ. අනිත් එක තමයි රාජපක්ෂලාගේ පවුල්වාදය නවත්තන්න ඕනේ. මෙන්න චෝදනා ටික. දැන් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළාද. ඊළඟට හොරකම මහා පරිමාණ වංචා තිබුණා කියලා යම්තන් හරි ඔප්පු කරන්න පුළුවන් වුණාද. මහා පරිමාණ වංචා මහා භාණ්ඩාගාරයේ කළා මිසක් මේ ආණ්ඩුවේ .ඊළඟට ළමා අපචාර නැවැතුනවාද. ළමයි මැරෙන එක දවසට එක ගානේ මම එදාත් කිව්වා .ඊළඟට දැන් මත් කුඩු එතනෝල් දැන් නැද්ද. කිලෝ 103 ක් ඉතිහාසයේ ලොකුම ටික මං හිතන්නේ ගිය සතියේ ඇල්ලුවේ මතු කුඩු නැති හින්දද. එතනෝල් ගෙනාවා කියලා චෝදනා කරපු කට්ටිය අද ආණ්ඩුවේ ඇමතිවරුද නැද්ද. බාර් 45 ක් මේ දවස්වල දුන්නද නැද්ද. දැන් පවුල්වාදය අර්ජුන රණතුංගගේ මල්ලිට දම්මික රණතුංගට දුන්නද නැද්ද. දැන ජනාධිපතිතුමාගේ මල්ලිට ටෙලිකොම් එක දුන්නද නැද්ද. දැන් පවුල්වාදය නැද්ද. දැන් මේ කියපු ඒවයින් අපේ ආණ්ඩුව පෙරලන්න ගෙනාපු

ඒවයින් එකක්වත් මේ ආණ්ඩුවට කර ගන්න බැරි වුණා. ඒක වෙනුවට මේක කියලා කරන්න බැරි වුණා.

ඊළඟ එක තමයි මෙ අහස උසට බඩු මිළ මේක පහත දාන්න ඕනේ කියලා තමයි ආණ්ඩුව පෙරලන්න ගෙනාපු යෝජනාවල තිබ්බ්ච තවත් ප්‍රබල එකක්. එතන ඉඳන් දැන් කියනවා මේ බඩු මිළ චුට්ටක් වැඩි වෙලා තියෙනවා තමයිලු. අර තිබ්ච්චි ගාන වැඩියි කියලා අඩු කරන්න ආපු කට්ටිය කියනවා දැන් චුට්ටක් වැඩි වෙලා තමයිලු. එහෙම කියලා හරියනවද. චුට්ටකවත් වැඩි වෙන්නේ නැතුව භාගයකට බඩු මිළ ගේනවා කියලා ආපු කට්ටිය දැන් කියනවා අර විදිහට.

ඒ නිසා මම අර ඉස්සෙල්ලා අහන්න ඕනේ දැන් අපි මේගොල්ලන්ගෙන් අහනවා දැන් මේ කැගහන විදිහට අපේ පල්ලේපොල මන්ත්‍රීතුමා එහෙම කියන විදිහට බඩු මිළ ලාභයි කියලා කියනවා. මම විශේෂයෙන්ම මේ මාධ්‍යවේදී අහගෙන ඉන්න කට්ටිය මම ඉල්ලීමක් කරනවා පත්තරේට ලියන්න කරුණාකරලා අපි කියපුවා නෙමෙයි බඩු මිළ ලාභයි කියලා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා කියලා. එතකොට ඒක බලපු මිනිස්සු තීන්දු කරයි මේගොල්ලෝ ඉන්නේ මහ පොළොවේද මේගොල්ලෝ ඉන්නේ වෙන කොහේවත්ද කියලා. එච්චරය මම ඉල්ලන්නේ. ඒ නිසා අපි කියපුවා ලිව්වේ නැතුවට කිසි ප්‍රශ්නයක් නෑ, මේ එක් විතරයි. අපේ මන්ත්‍රීවරු අර පරණ පත්තර කැල්ලක් අරගෙන මේක දිග අරගෙන කියවනවා කියවනවා. දැන් පත්තරවල තියෙන්නේ සේරම ඇත්තද. මේ ඊයේ පෙරේදා මම දැක්කා පත්තරේක තියෙනවා. ඒවා කියන්න හොඳ නෑ මෙතන අපි ඒවා කිව්වා කියලා මම ඒක කියන්නේ

නෑ, නෑ පත්තරේට අපහාස කිරීමක් නෙමෙයි මම කියන්නේ. අපේ වැදගත්

පත්තර ටික දිවයින, රිවිර ,ලංකාදීප. මව්බිම,මම කියන්නේ ඒ පත්තර නෙමෙයි. වෙන පත්තරවල ඔය මඩ පත්තරත් වෙනම තියෙනවා ඒවා නෙමෙයි. කැළෑ පත්තර ඒවා අරගෙන ඇවිල්ලා මෙතන කියවලා හරියන්නේ නෑ. මම කිව්වේ ඒක. කරුණාකරලා නොමඟ යවන්න ලෑස්ති කරන්න එපා. ඒ නිසා එහෙම තියෙන සේරම මෙතන ඇවිල්ලා ඇත්ත වගේ කතා කරන්න අපිටත් පුළුවන්. කොළ කැල්ල පත්තරෙ වගෙ ටයිප් කරගෙන ඇවිල්ලා අපිටත් පුළුවන් මෙතන . හැබැයි පත්තරේ තිබුණ දේවල් නෙමෙයි භාගදා. එහෙම මේක වංචා කරන්න මේක රවට්ටන්න ලෑස්ති වෙන්න එපා.

ඊළඟට විශේෂයෙන්ම අපේ මන්ත්‍රීතුමා කිව්වා මේ ජනතාවට බර වෙන්නේ නෑ කියලා. ඔව් බර වෙන්නේ නෑ. කක්කා බර වෙන්නේ නෑ ජනතාවට. ඇයි කන්න විදිහක් නැනේ. වෙන නම් බර නොවෙනවා කියලා අපිට පේන්නේ නෑ. ඒ නිසා බොහොම අමාරුවෙන් ඉන්නේ. ජනතාව අපේ ගෙවල් වලට ඇවිල්ලා ඉතිහාසයේ කවදාකවත් කරදර කරලා නෑ, අපිට කන්න විදිහක් නෑ. අවුරුද්ද අපිට කන්න විදිහක් නෑ.අපේ ළමයාගේ පොත් ටික ගන්න විදිහක් නෑ කියලා කරදර කරනු නැති මිනිස්සු අද උදේ පාන්දර හයේ ඉඳලා ගෙදරට එනවා. ඇවිල්ලා කියනවා අවුරුදු කන්න තියා ළමයාට පොත් ටිකවත් ගන්න විදිහක් නෑ. අනේ මහත්තුරු උදව්වක් කරන්න කියලා. ඒ නිසා ජනතාවට බරද නැද්ද කියලා බලන්න ජනතාව අතරේ ඉන්න ඕනේ. ඒ නිසා කරුණාකරලා මේ කියන කතා පුළුවන් නම් එළියේ ගිහිල්ලා කියන්න.

ඒවගේම මට විශේෂයෙන්ම තව එකම එකක් තියෙනවා කියන්න. කියන්නම ඕන එකක්. දැන් මේ ආණ්ඩුව

ගන්න කොට කිව්වා ඖෂධ පනත ගෙන්න ඕනේ කිව්වා මොකක්ද වැරැද්ද මේ ඖෂධ පනත නැති හින්දා බෙහෙත් මිළ ඉහළ යනවා බෙහෙත්වල තියෙන වංචාව නවත්තලා ඖෂධ පනතින් බෙහෙත් මිළ අඩු කරනවා කිව්වා.

ඖෂධ පනත ගෙනල්ලා මේ සති දෙකකට පස්සේ මම ගියා රත්නපුරේ කඩේකට හැම මසයකම රු.5000/- ක විතර බෙහෙත් ගන්නවා. පොඩි පොඩි ලෙඩ වලට. එතකොට ඒ ගන්න බෙහෙත් තුණ්ඩු වලට මාසයටම රු.5000/- යි. මේ ඇත්තම කතාවක් කියන්නේ. මේ සැරේ ගියහම ඒ බෙහෙත් ටිකටම රු.8400/- යි. ඔය ගොල්ලන්ට කියන්න තියෙනවා. ඒ කියන්න බැරි ලෙඩ නෙමෙයි මට තියෙන්නේ. කියන්න පුළුවන් ලෙඩ. ඖෂධ පනත ඇවිල්ලා සති තුනකින් මම කියන්නේ. ඒ ගියහම රු.8400/- යි ඒ වෙනදා රු.5000/- ට ගන්න බෙහෙත් ටික. මම ඇහුවා ඔයත් යහපාලනයට නේද මන්ත්‍රීතුමා ඡන්දය දුන්නේ. දැන් මේ ඖෂධ පනත ගෙනල්ලා අඩු කරපු හින්දද මේ රු.5000/- රු.8400/- වුනේ කියලා. වෙනදා රු.5000/- ට ගත්ත ටික කියලා. එතුමා කියනවා මහත්තයෝ අපිටත් මේ කේන්තියෙන් ඉන්නේ බලන්න කරපු වැඩේ මේ ඖෂධ පනත ගෙනල්ලා අඩු කරනවා කිව්වට අද අපිටත් කෙල වෙලා තියෙන්නේ. මේ වාසිය අපිට නෙමෙයි එන්නේ කොහේවත් යන කොමිෂ්කාරයන්ට තමයි යන්නේ කියලා මුදලාලි කිව්වේ. සහෝදර මුස්ළිම් මුදලාලි කෙනෙක් කිව්වෙ තමුන්නාන්සේලාගේ. අද මේක තමයි තත්ත්වය. අද මිනිස්සුන්ට කන්න නැතුව හරි ගෙදර බුදියගෙන ඉඳලා බෙහෙත් ටිකවත් ගන්න බැරුව ඉන්න වාතාවරණයක් තමයි මේ රටේ උදා වෙලා තියෙන්නේ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ***
***கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க***
*Hon.Member Ramya Kumara Weerasinghe*

---

ඒ නිසා ගරු සභාපතිතුමා මගේ කතාව අවසන් කරනවා මෙන්න මේක විතරක් කියලා. පාලම් දාහෙන් හදලු පාලම් විවෘත කරලා මෙතන ඇවිල්ලා කියනවා පාලම් හැදුවා කියලා. අපි පාලම් දාහේ ව්‍යාපෘතියේ පාලම්. අපි අර අයිරෝඩ් ව්‍යාපෘථියෙන් හදපු පාරවල් ටික පත්තරේ පිටුවක් දාලා තියෙනවා නිලන්ත මන්ත්‍රීතුමා කිව්වලු දාලා තියෙනවලු මෙන්න අපි වැඩ කරනවා කියලා. මහින්ද මහත්තයා කරපු ටික. ඒ නිසා මම පැහැදිලිවම කියනවා පැරදුණා නම් ගෙදර ගිහිල්ලා විශ්‍රාම සුවයෙන් ඉන්න කියලා කියනවා. පැරදුණා නම් ගෙදර ගිහිල්ලා විශ්‍රාම සුවයෙන් ඉන්න කියලා මහින්ද මහත්තයාට ඉස්සර වෙලා රනිල් වික්‍රමසිංහ මහත්තයාට කියන්න 18 වතාවක් පැරදුණාට පස්සේ කරුණාකරලා ගෙදර ගිහිල්ලා විශ්‍රාම සුවයෙන් ඉන්න කියලා. එක්සත් ජතික පක්ෂය අයින් කරපු ඒකාධිපතිවාදය අන්න අද නැවත හිස එසෙව්වා නැත තමන්ට ඕන කට්ටිය පත් කරලා පරණ කට්ටිය ඉවත් කළා. මෙන්න දිගට හරහට පත් කරපු කට්ටියගේ මැසේජ් ටික එනවා . ෆෝන් එක අරන් බලන්න.

ඒ නිසා ගරු සභාපතිතුමනි මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා ඔබතුමා මට

අවස්ථාවක් ලබාදීම ගැන. එහෙම ස්තූතිවන්ත වෙමින් මේ ආණ්ඩුව මේ දූර්ගන්ධ ආණ්ඩුව පුංචි මිනිහා තලලා පෙරලා මිරිකලා පුංචි මිනිහාගේ සාරයෙන් ජීවත් වෙන්න හදන ආණ්ඩුව ලබන අවුරුද්ද වෙන කොට පලවා හරින්න අපි ලෑස්තියි කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

බොහොම ස්තූතියි ගරු රම්‍යකුමාර වීරසිංහ මන්ත්‍රීතුමාට. මීළඟට කේ.එල්.රත්නායක ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක***
***கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக***
*Hon.Member K.L.Ratnayake*

---

ගරු සභාපතිතුමනි අවස්ථාව ලබාදීම පිළිබඳව මගේ ගෞරවනීය ස්තූතිය ඔබතුමාට පිරි නමනවා. ගරු සභාපතිතුමනි දේශපාලන මතවාදය මොකක් වුණත් සත්‍ය කතා කළ යුතුයි. කොයි ආණ්ඩුවටත් අඩුපාඩුකම් ඇති. ඒවා විවේචනය කරන රටක් බවට ඉතිහාසයේ ඉඳන් පරිවර්තනය වෙලා දැනටත් ඒ විදිහට තමයි යන්නේ. මම එක කාරණයක් මතු කරන්න කැමතියි ගරු සභාපතිතුමනි. ඔබතුමාගේත් අවධානය යොමු විය යුතුයි. නිලන්ත ගරු මන්ත්‍රීතුමා මතු කරනවා කාරණාවක් පාරවල් සම්බන්ධව. නිලන්ත මන්ත්‍රීතුමා කියාපු කාරණාව පිළිබඳව කියන්නට ඕනේ. ඒකයි

මම පටන් ගන්න කොටම කිව්වේ ඇත්ත කියන්න ඕනේ කියන කාරණාවේදී

ඇහැලියගොඩ ඉන්න අපි මම හිතන්නේ කරුණාපාල මන්ත්‍රීතුමා, නමින්ද මන්ත්‍රීතුමා මම දේශපාලන භේදයෙන් තොරව පාර පටු කරනවාට උද්සෝෂණය කරලා උසාවි ගිය මිනිස්සු අපි. හැබැයි පහුගිය සතියට එහා සතියේ තමයි නිදොස් කොට නිදහස් කළේ. ලංකා ඉතිහාසයේ පළවෙනි උද්සෝෂණය නම් නෙමෙයි ඒක. ලිප්ටන් වට රවුමේ නම් පොලිස් ස්ථානයක් ස්ථාපනය කරන්න ඕනේ මේ උද්සෝෂණය කරන හින්දා. හැබැයි අපි මේ උද්සෝෂණය කළේ පහුගිය රජයේ මේ ශුද්ධ කරලා අනිත් පැත්තට පනින්න හදනවා නම් නෙමෙයි. පහුගිය රජයේ ඉඩංගොඩ ඉඳන් අඩි 36 ට පාර එනවා. ආණ්ඩු පෙරලියත් එක්ක කිලෝ මීටරයයි හාරසීයේ ඉඳන් 32 වෙනවා. එතකොට ඒ 32 වීම පිළිබඳවයි අපි උද්සෝෂණය කළේ. පාරේ කාපට් එක අඩු කරන්න හැදුවහම දුනේෂ් ගන්කන්ද මැතිතුමා ඒකට කාපට් එක 24 තිබුණ එක 21 ට කරලා දුන්නා. තලතා අතුකෝරල මැතිතුමා පාර අඩු කරන්න කටයුතු කරන එකට විරුද්ධව මැදිහත් වෙලා ඒ කටයුත්ත කරලා දුන්නා. අන්තිමට අඩි 32 ට කළා. මේවා ඇතුළේ තියාගෙන කියන්න ඕනේ. මොන ආණ්ඩුව තිබුණත් ප්‍රශ්නයක් නෑ. ඇත්ත කතා කරන්න ඕනේ. දැන් ඇහැලියගොඩ නගරයට එන කොට අඩි 32 යි. ඒ නැදුරන හන්දියේ ඉඳන් එහාට යන කොට ත්‍රීවිල් 150 ක් තියෙනවා පවුල් 150 ක් ජීවත් වෙනවා. ඒ අයට පාක් කර ගන්න බැරි තත්ත්වයට උදා වෙලා. ඒවගේ අඩුපාඩුකම් තියෙනවා. ඒ නිසා ඒවා මතක් කරන අතර කරුණාපාල ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව හොඳයි.

සත්‍ය වශයෙන්ම කතා කරන කොට යම් යම් බඩුවල මිළ අඩු වෙලා තියෙනවා. ඒක තමයි ඇත්ත. හැබැයි ඔබතුමා කියන විදිහට ඔබතුමාගේ යෝජනාවේ තිබුණ සැමන් ටින් එකේ කතාව. මම මේ සභාවට පහු වෙලා ආවේ. මම ඊට පස්සේ එළියට

ගිහිල්ලා මෙතුමා කියන කඩේනුත් ස්ටෝස් එකෙනුත් ඇහුවා හැබැයි තොග මිළ රු.120/- යි. සැමන් ටින් එකේ. සිලල්ර මිළ රු.130/- යි. මම ඒක තමයි මම කිව්වේ අරන් දෙන්නම් බඩු ඇහැලියගොඩින් කියලා. ගරු සභාපතිතුමනි මේක වාදයක් නෙමෙයි. සිංහල අලුත් අවුරුද්දට විතරක් නෙමෙයි. මිනිස්සු කාලා ඉන්නේ. අපි හැම වෙලේම කියන්නේ සිංහල අලුත් අවුරුද්ද නෙමෙයි. මුළු වර්ෂය පුරාවටම මේ මිනිස්සුන්ට බඩු මිළ අඩුවට දිය යුතුයි. ඒකේ දෙකක් නෑ. හැබැයි යම් යම් කාරණා තුළ මේ බඩු මිළ අඩු කරන්න බැරි කාරණා තියෙනවා. දැන් ඩොලර් එක 141 යි කිව්වා ප්‍රභාත් මන්ත්‍රීතුමා. මෙතුමා කියනවා 144 යි කියලා. ඊට වැඩිය එහා යන්න පුළුවන්. පහුගිය සතියේ 148 යි දශම ගාණක් තිබුණේ. හැබැයි මේ සියල්ලක් වෙලා තියෙන්නේ මේ ආර්ථික කළමණාකාරය නෙමෙයි. යම් යම් අඩුපාඩුකම්. බැහැයි අපේ රටේ ...

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*

------------------------------------------------------

මෙම ගරු සභාව පස්වරු 3.00 දක්වා පවත්වාගෙන යන්නට යෝජනා කරනවා.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක***
***கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக***
*Hon.Member K.L.Ratnayake*

-------------------------------------------------

ගරු සභාපතිතුමනි කුහක දේශපාලනය. ඔබතුමාගේ මූලිකත්වයෙන්ම අපි අනුරාධපුරයට ගිහිල්ලා වැඩ මුළුවක් කළා. මොකක්ද ඒ වැඩ මුළුවේදී කිව්වේ.

මහාචාර්යතුමා මේ රටේ වෙනසක් කරන්න නම් ආකල්පමීය වෙනසක් කළ යුතුයි. එදා

තමුන්නාන්සේලා මහ ලොකුවට කතා කරනවා ලුනු කිලෝ එක ගැන. එදා 2014 සුනාමි එන කොට ලුනු කිලෝ එක තිබුණේ රු. 8/- ට. අද රු.60/- යි කියලා කියනවා ලුනු කිලෝ එක ලුනු ලේවායෙන් පිට කරන කොට. හැබැයි ඇහැලියගොඩ කඩේ රු.60/- සිල්ලර මිළ. මේවා ගැන කතා කරන කොට මහා ලොකු පරාසයක් තුළ ගරු සභාපතිතුමනි කතා කරන්න වෙනවා. මේකෙදී කොයි ආණ්ඩු තිබුණත් දැන් වෙන මොකුත් නෙමෙයි පළාත සභාව ගන්නකෝ. එදා පළාත් සභාව 88 ස්ථාපිත කරන කොට මොකද වුණේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඡන්දය ඉල්ලුවේ නෑ. කොමිනිෂ්ට් පක්ෂය ඉල්ලුවා. මහජන පක්ෂය ඉල්ලුවා. එහෙමයි වුණේ. එදා හොඳ වුණ එක අද හොඳ වෙලා තියෙනවා. අපි මේවා සත්‍ය වශයෙන් ආකල්පමීය වෙනසක් තුළ කතා කරන්න ඕනේ.

පහුගිය කාලයේ මොනවද කතා කළේ. නිළ ඇඳුම ගැන කතා කළා. නිළ ඇඳුම දුන්නේ එක්සත් ජාතික පක්ෂයෙන්. ඒකේ යම් වෙනසක් කළා එක්සත් ජාතික පක්ෂය. සමහර විට ඒක හොඳ වෙයි ඒක නරක් වෙයි. හැබැයි පොත් ටික දුන්නේ එක්සත් ජාතික පක්ෂයෙන්. ඒක හොඳ වෙයි. නරක් වෙයි. හැබැයි ළමයෙක් ඉපදුණ විටම බඩගාන්නේත් නෑ ඇවිදින්නේත් නෑ ගරු සභාපතිතුමනි. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය වෙන්න පුළුවන්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙන්න පුළුවන්. සම සමාජ පක්ෂය වෙන්න පුළුවන්. මහජන පක්ෂය වෙන්න පුළුවන්. කොමිනිෂ්ට් පක්ෂය වෙන්න පුළුවන් මේ සියළු දෙනාම එකා වගේ මේ රට හදන්න ඉන්න ඕනේ. ජනතා විමුක්ති පෙරමුණ වෙන්න පුළුවන්. රට හදන්න ඉන්න ඕනේ. කාලයක් දීලා බලන්න ඕනේ. අපි දන්නවා බඩු මිළ වැඩියි. රටේ ආර්ථික ප්‍රශ්න වැඩියි. මේ සියල්ලක් තියෙනවා. මේ සියල්ලම දරාගෙන ඉන්නවා. ඒක නෑ කියලා කියන්නේ නෑ කවුරුවත් අපි.

ආණ්ඩු පක්ෂය හැටියට ගරු සභාපතිතුමනි අනිත් එක කතා කළා කෝප් සිටිය ගැන. දැන් ඊයේ පෙරේදා පත්තරේත් තිබුණා ටී.වී. එකේත් කිව්වා මේක නතර කරලා තිබුණ කාලය ඇමරිකන් ඩොලර් 125 ක් අය කර ගන්න ඕනේ. නැත්නම් රටෙන් කැල්ලක් අපිට ඕනේ කියලා. එතකොට ඒක මොකක්ද අන්තර්ගතය. එහෙම නම් මේක හදන්න දීපු එක 99 අවුරුද්දේ බදු විදිහට තිබුණේ. මේ ආණ්ඩුවත් ඒක හදන්න හදනවා. ඒක තමයි ඇත්ත. කොයි ආණ්ඩුව වුණත් කොයි පාලකයා වුණත් යම් යම් අඩුපාඩුකම් තියෙනවා.

නිදහසින් පස්සේ ඩී. ඇස්. සේනානායක මැතිතුමාගේ ඉඳන් මේ රට විශාල පිරිසක් පාලනය කළා. අඩුපාඩුකම් ඇති. දැන මේ අපේ ප්‍රභාත් මන්ත්‍රීතුමා මහ ලොකුවට කෑගහනවා බඩු මිළ වැඩියි කියලා. මම එතුමාට යෝජනා කරනවා මාමන්ඩිත් එක්ක ගිහින් කියන්න. ඇමතිතුමාට කියන්න කැබිනට් එකට යෝජනා කරන්න කියලා මේ බඩු මිළ අඩු කරන්න කියලා. බලන කොට කකුල් දෙක දෙපැත්තේ තියාගෙන තමයි ඔක්කෝම ඉන්නේ. ඔය පැත්තේද ඕනේ මේ පැත්තේද ඕනේ. ඔබතුමා නෙමෙයි. ප්‍රභාත් මන්ත්‍රීතුමා. එතුමා මේ සීට් එකේ නැති එක ගැන මම කණගාටු වෙනවා. බෑණා වෙනයි. ඕක තමයි මන්ත්‍රීතුමා වෙලා තියෙන්නේ. තාත්තා වෙනයි. පුතා වෙනයි. ඕවා ගැන කතා කරන්න ගියොත් මගේ වෙලාව. චෝදනාවක් නෙමෙයි මම කියන්නේ. අපි නෙමෙයිනේ කැබිනට් එකේ ඉන්නේ. ගරු සභාපතිතුමා මේ සභාවේ ඉන්න කවුරුවත් කැබිනට් එකේ නෑ. එහෙම නම් කැබිනට් එකේ ඉන්නේ එතුමාගේ මාමා ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා. එතුමාට මේ සභාවේ යෝජනාව ගෙනාපුවහම අනේ මාමේ පළාත් සභාවේ මාර කාලගෝට්ටිය

ගිහිල්ලා කැබිනට් එකට කියනවකෝ මේ බඩු මිළ අඩු කරන්න කියලා.

නෑ ගරු සභාපතිතුමනි මේක නෙමෙයි වෙලා තියෙන්නේ. කොයි පාලනය කළත් කොයි රජය හිටියත් පාලනය කළත් අපේ ආකල්පමය වෙනසක් නොකළොත් මේ රට ගොඩ නගන්න බෑ. අපි යනවා ඔබතුමාගේ සහ මහ ඇමතිතුමගේ නිර්දේශය සහිතව කොහේද ඉතාලියේ ගිහිල්ලා දවස් පහක් ඉන්නවා. හැබැයි මතක තියා ගන්න ගරු සභාපතිතුමා තව ආත්ම හතරක් ගියත් මේ විදිහට මේ රටේ දේශපාලන සහ මිනිස්සුන්ගේ ආකල්පමය වෙනසක් නොවුණොත් තව ආත්ම හතරකටවත් ඉතාලියක් වෙන්න බෑ අපිට.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

අපි අවසන් කරමු ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක***
***கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக***
*Hon.Member K.L.Ratnayake*
-------------------------------------------------

ඇත්ත කතාව එයයි. ඒ නිසා ගරු සභාපතිතුමනි ආණ්ඩුවල අඩුපාඩුකම් ඇති. හැබැයි ඒ සිංහල හා හින්දු අලුත් අවුරුද්දට විතරක් නෙමෙයි කන්නේ. එහෙම නම් දවස් තුන්සිය හැට පස් දවසේම මිනිස්සු කන්න ඕනේ. කොයි ආණ්ඩුව ආවත් මේ ආණ්ඩුවට අපි කියන්නේ බඩු මිළ පත්වාගෙන යායුතුයි. එක මට්ටමක.

ඒ නිසා ගරු සභාපතිතුමනි මෙච්චර පීඩනයක් තිබෙන මේ ආණ්ඩුව මෙහෙමවත් ගෙනියන එක ලොකු දෙයක්. මිලියන ගණන් ණය ගෙවන්න තියෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි මින් එහාට කතා කරන්නේ නෑ. මේ ලබන්නා වූ සිංහල හින්දු අලුත් අවුරුද්ද සමස්ත රටේ සියළු දෙනාට සෞභාග්‍යමත් අවුරුද්දක් වේවා යැයි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

ස්තූතියි ගරු රත්නායක මන්ත්‍රීතුමනි. මීළඟට නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුම

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*
---------------------------------------------------------

ගරු සභාපතිතුමනි අපේ රත්නායක මන්ත්‍රීතුමා ඇත්තටම හොඳ ආරම්භයක් අරන් දුන්නා. එතුමා නිවැරදි කතාවක් කළේ. අපේ කරුණාපාල මන්ත්‍රීතුමා යෝජනා ළේ ඉතාම කාලෝචිත යෝජනාවක්. මේ කාල වකවානුව අනුව. ඒ නිසා තමයි අපි අනිත් යෝජනාත් කල් දාගෙන මේ අත්‍යාවශ්‍ය යෝජනාවට කතා කළේ. අපි මේ බිත්ති හතර තුළ මේක කතා කරලා වාද විවාද කරලා පක්ෂ භේද කරලා ආණ්ඩු ගැන කතා කරලා තේරුමක් නෑ. මේක වැඩ පිළිවෙලක් හදාගෙන ජනතාවට

අත්‍යාවශ්‍ය ආහාරවල මිළ අඩු කිරීම පිළිබඳව අපි කතා කළ යුතුයි. අපි

ආකල්පමය වෙනස් කළ යුතුයි. එතුමා කිව්ව කතාව හරි. එතුමා මෙතන ලොකු වර්තාවකුත් තිබ්බා පොඩි මිනිහා ගැන කතා කරන කොට විපක්ෂයේ පැත්තේ ඉඳලා හැමදාම මන්ත්‍රීවරයෙක් පොඩි මිනිහා ගැන පෙනී ඉන්නවා. එතුමා විනාඩි 15 ක් විතර කතා කරලා එක පාරට මාරු වෙලා ගියා. මම දන්නේ නෑ මොකද කාරණාව කියලා. හැබැයි පොඩි මිනිහා වෙනුවෙන් හැමදාම එතුමා පෙනී ඉන්න අය. ඒ නිසා අද ඇත්ත මොකක්ද කියන කාරණාව තියෙනවා. හැබැයි අපි සූදානම් නෑ ගරු සභාපතිතුමනි අලුත් ආණ්ඩුවේ අගමැතිතුමාගේ තිත්ත බෙහෙත් බොන්න. එතුමා එන කොට තිත්ත බෙහෙත් බොන්න නෙමෙයි එතුමා එනවා කිව්වේ. පැණි රස වලින් පිරිච්ච බොහොම ලස්සන ආතල් එකක් දෙන්න තමයි ජනතාවට සූදානම් වෙලා ආවේ. හැබැයි මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉන්න කාලයේ ඔය රූපවාහිනී විවාද වලට හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ,එරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා එහෙම ඇවිල්ලා ඒගොල්ලෝ කිව්වේ විශ්ව කර්මයෝ වගේම පහුවදාම ඇවිල්ලා ඒගොල්ලන්ගේ ආර්ථික ප්‍රතිපත්ති අනුව මේ රට සුඛිත මුදිත කරනවා කියලා කියන්න. හැබැයි තාම අවුරුදු ගාණක් වුණා ඒ තත්ත්වයට ඇවිල්ලා යන්න. මේ කරුණාපාල මන්ත්‍රීතුමා යෝජනා කළේ මේ සිංහල හින්දු අලුත් අවුරුද්දට ඉතා ඉක්මනින් මේ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිළ අඩු කරන්න කියන කාරණාව. අත්‍යාවශ්‍ය ආහාර එතුමා මේකේ සඳහන් කරලා තියෙනවා. අපි කියන්නේ රු.103/-ට සීනි දෙන්න කියලා නෙමෙයි අපි කියන්නේ. අපි කියන්නේ මේ යෝජනා කරන්නේ මේ යෝජනාවේ අන්තර්ගතය වෙලා තියෙන්නේ හාල් අඩුම තරමේ රු.50/- කට දෙන්න හාල් කිලෝ එකක්. සීනි කිලෝ එකක් රු.50/- ට රු.55/- ට දෙන්න. පරිප්පු කිලෝ එකක් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ජනතාවට ගන්න පුළුවන් වෙන විදිහට බොහොම සුළු මුදලකට දෙන්න. එහෙම දුන්නා

ඉස්සෙල්ලා. හැබැයි අද මේවා නැති වෙලා තියෙනවා. කරවල කිලෝ එකක් අද

රු.1500/- යි රු.2000/- වෙලා තියෙනවා. මේ සාමාන්‍ය කෑම. අපි කියන්නේ මේවා සාමාන්‍ය ජනතාවට කන්න මේවා අඩු කරන්න කියන කාරණාව තමයි මේ යෝජනාවේ අන්තර්ගතය වෙලා තියෙන්නේ.

දැන් අපේ අජිත් කුමාර මන්ත්‍රීතුමා කිව්වා අත්පොඩි ගහලා හඬ ගහලා කිව්වා පහුගිය ආණ්ඩුවේ ගත්තු ණය නිසාලු දැන් මේ බඩගින්නේ ඉන්න වෙලා තියෙන්නේ. ඒ නිසා අපිට ආණ්ඩුව ගෙනි යන්න බෑ කියන කාරණාව තමයි කියන්නේ. මම කියනවා මහින්ද රාජපක්ෂ මැතිතුමා ආණ්ඩුවෙන් පැරදිලා යන කොට මේ රටේ තිබ්බ්චි ණය ප්‍රමාණය ඩොලර් මිලියන 4500 යි. එතුමා පරාද වෙලා ගියාට පස්සේ අලුත් ආණ්ඩුව ආවට පස්සේ දැන් තියෙන ණය ප්‍රමාණය ඩොලර් මිලියන 6000 යි. එතකොට එක අවුරුද්දක අරන් තියෙනවා ඩොලර් මිලියන 2500 ක්. කොහොමද මේවා අරගෙන රට හදලද. නෑ. මොකද ප්‍රධාන හේතුව මේ ණය පිළිබඳව කතා කළොත් ගරු සභාපතිතුමනි මේ මහින්ද රාජපක්ෂ මැතිතුමා අරන් තියෙන ණය අරගෙන තියෙන්නේ දීර්ඝ කාලීන ණය හැටියට. මේ කාලයේ ගත්ත ණය එක්කෝ අවුරුදු පහකින් ගෙවන්න තියෙන්නේ. එක්කෝ අවුරුදු දහයකින් ගෙවන්න තියෙන්නේ. ඒවේ ප්‍රතිලාභ රටට ඇවිල්ලා. හැබැයි මේ රටට ආවට පස්සේ ගරු සභාපතිතුමනි මේගොල්ලෝ ගත්තු ණය ඉතා ඉක්මනින් ගෙවන්න තමයි මේගොල්ලෝ අරගෙන තියෙන්නේ. ඕක තමයි ඇත්ත කතාව.

ඒවගේම තමයි ගරු සභාපතිතුමනි බැඳුම්කර වංචාව. මේවා පිළිබඳව කවුරුවත්

කතා කරන්නේ නෑ. අද අපි මෙවා හංග ගෙන ඉන්නවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

මහ බැංකු වංචාව කොහොමද. ඒවා ගැන කතා කරන්නේ නෑ. ඒවාට උසාවි නෑ. ඒවාට සීඅයිඩී නෑ. ගරු සභාපතිතුමනි අපි කතා කළේ නෑ මෙතුමා කිව්වා සීඅයිඩී එකේ සැහෙන්න පෝළිමේ ඉන්නවා කියලා. ඔව් ස්තුති කරන්න අවශ්‍යයි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ගරු මන්ත්‍රීතුමා සංඥාපූර්ණය පිළිබඳ ප්‍රශ්නයක් මතු කරනවා. ඒ නිසා ඔබතුමාගේ කතාව අවසන් කරන්න.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*
------------------------------------------------------------

හරි එහෙම නම් මගේ කතාව අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ඔබතුමාගේ කතාව කරලා අවසන් කරන්න.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය***
***கௌரவ நமிந்த அனுரபிரிய***
*Hon.Member Naminda Anurapriya*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි සීඅයිබී ආයතනය ඒ ආයතනයට ස්තුති විය යුතුයි. ඒ ආයතනයන් තමයි වැඩිම රාජ්‍ය සේවකයෝ අඩු මුදලකට ණය ක්‍රමයකට රෙදි ගන්න තියෙන්නේ. ඒ නිසා තමයි ඒකේ පොළිම තියෙන්නේ. රාජ්‍ය සේවකයන්ට උපහාර කියලා බොහොම ගෙවීමේ ක්‍රමයකට රෙදි ගන්න තියෙනා. ඒක තමයි මෙතුමාගේ කඩේට අල්ලපු කඩේ පෝලිමේ ඉන්නේ. රාජ්‍ය සේවකයෝ බොහොමයක් රෙදි ගන්න ගිහිල්ලා. අද අලුත් අවුරුද්ද එනවා කියලා තියෙනවා. කොකා හඬලන්නේත් නෑ. කජු ගස්වල කජු හට ගන්නේත් නෑ. ඔන්චිල්ලා බැඳලාත් නෑ. මොකුත් නෑ. ඕක තමයි තත්ත්වය.

ඒ නිසා අපි කියන්නේ කැගහලා වැඩක් නෑ. අපි ඉක්මනින්ම අපි හදා ගනිමු වැඩ පිළිවෙලක්. අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිළ අඩු කිරීමට යෝජනා කරමු.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ගරු නමින්ද මන්ත්‍රීතුමනි. අපි ස්තුතිවන්ත වෙනවා ජී.ඇම්.කරුණාපාල ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද 6/1/2016/07 දරණ ඉතාම අත්‍යාවශ්‍ය වූ ඉතාම කාලෝචිත වූ යෝජනාව අද දවසේ ඉදිරිපත් කිරීම පිළිබඳව. පක්ෂ සහ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සියළු දෙනාම ඒ පිළිබඳව එකතු කර ගනිමින් අවශ්‍ය යෝජනා ඉදිරිපත් කළා. ඒ පිළිබඳව සභාවේ සියළු දෙනාටම ස්තුතිවන්ත වෙමින් අදාල යෝජනාව ක්‍රියාත්මක කර ගැනීම සඳහා අදාල ආයතන වෙත යොමු කිරීම සඳහා කටයුතු කරනවා.

**සභාව කල් තැබීම:**

*ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.*
*கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன*
*Hon.Gov.Whip Asoka Jayawardane*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි තව දින කීපයකින් ලබන සිංහල හින්දු නව වසර සියළු දෙනාටම සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මෙම ගරු සභාව 2016 අප්‍රේල් මස 26 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබන ලෙස මම යෝජනා කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ගරු සභානායකතුමනි. සභාව කල් තැබීමෙන් පසු යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ගරු අකිල එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.*
*கௌரவ உறுப்பினர் அகில எல்லாவல*
*Hon. Member Akila Ellawala*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි මේ අවස්ථාවේදී මම සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කරන්නේ බලංගොඩ නැවත යහපාලනයේ සන්දිස්ධානයකට තමයි යන්නේ. බලංගොඩ බුද්ධ ජයන්ති විද්‍යාලයේ හය ශ්‍රේණියේ දරුවන්ට මේ වනවිටත් නිළ ඇඳුම් වවුචර් දැන් වසරේ පළවෙනි වාරය අවසන් වෙන්නත් ඇවිල්ලා තව දවස් දෙක තුනයි තියෙන්නේ. තාමත් නිළ ඇඳුම් වවුචර් ලැබිලා නෑ කියලා දෙමව්පියෝ විසින් දැනුවත් කරනවා. නමුත් දාලා. පෙත්සමක් හැටියට නෙමෙයි නම ඇතුව සඳහන් කරන්නේ. ඒ නිසා මේ පිළිබඳව ලිපිය සභාගත කරනවා. මේකට පිළිතුරක් ලබා දෙන මෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමා හරහා අමාත්‍යාංශ ලේකම්තුමාගෙන් ලිපියක් බලාපොරොත්තුවෙන් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තූතියි ගරු අකිල එල්ලාවල මන්ත්‍රීතුමනි. මීළඟට නියෝජ්‍ය සභාපති උදයකාන්ත ගුණතිලක මැතිතුමා. එතුමා සභාවේ නෑ. ඒ අනුව දැන් වේලාව මධ්‍යහ්න 1.40 යි. අද දනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු අවසන් වෙනවා. ඒවගේම ලබන්නා වූ සිංහල හින්දූ අලුත් අවුරුද්ද ඔබතුමන්ලාටත් ඔබතුමන්ලාගේ පවුලේ සියළු දෙනාටමත් නිරෝගීමත් සුහම සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා සියළු දෙනාටම ප්‍රාර්ථනා කරමින් අද දිනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. මෙම ගරු සභාව 2016 වූ අප්‍රේල් මස 26 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබනවා.

අ/කළේ:

කංචන ජයරත්න

සභාපති,

සබරගමුව පළාත් සභාව.

පාලිත නානායක්කාර

සභා ලේකම්,

සබරගමුව පළාත් සභාව.

2016 ජූනි මස 23 වෙනි දින,

සබරගමුව පළාත් සභා ලේකම් කාර්යාලයේ දීය.